රජයේ වැඩ, තැපැල් සහ විදුලි සංදේශ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) බිබිලේ පිහිටි රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු කාර්යාලයට හා එම ප්‍රදේශයට අවශ්‍ය තාර, සිමෙන්ති, පුපුරන ද්‍රව්‍ය හා අනිකුත් බඩු බදුල්ලේ සිට ප්‍රවාහණය කිරීම සඳහා ටෙන්ඩර් කැඳවා තිබේද? (ආ) එසේ නම්, ඒ කවදාද? (ඉ) මෙම ප්‍රවාහණ කොන්ත්‍රාත්තුව දැනට භාර ගෙන ඇති අය කවිද? එම අයගේ ලිපිනය සඳහන් කරනවාද? (ඊ) එම කොන්ත්‍රාත් කරුට තිබෙන ලොරි සංඛ්‍යාව කොපමණද? (උ) ටෙන්ඩර් කැඳවා කොන්ත්‍රාත්තුවක් නොදී ඇත්නම් ටෙන්ඩර් කැඳවීමට එතුමා කටයුතු කරනවාද? (ඌ) නොඑසේ නම්, ඒ මන්ද?

அரசாங்கக் கட்டுவேலை, தபால், தந்திப் போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா: (அ) பிபிலைப் பகுதி அரசாங்கக் கட்டுவேலைத் திணைக்கள நிறைவேற்று இஞ்சினியரின் அலுவலகத்திற்குத் தேவையான தார், சீமெந்து, வெடிமருந்து ஆகியவற்றையும் தேவைப்பட்ட ஏனைய பொருட்களையும் பதுளைப் பகுதியிலிருந்து கொண்டு செல்வதற்கான கேள்விப் பத்திரங்கள் கோரப்பட்டனவா? (ஆ) அப்படியாயின், எப்பொழுது? (இ) இப்போக்குவரத்து ஒப்பந்தத்தை இப்பொழுது ஏற்றுள்ளவர் யார்? அவருடைய விலாசம் என்ன? (ஈ) அவரிடம் உள்ள லொறிகள் எத்தனை? (உ) கேள்விப் பத்திரங்கள் கோரப்பட்டபின் ஒப்பந்தம் ஏற்படுத்தப்படவில்லையெனில், கேள்விப் பத்திரங்கள் கோருவதற்கு அவர் நடவடிக்கை எடுப்பாரா? (ஊ) இல்லையெனில், ஏன்?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එච්. බී. ඒකනායක මයා.]

asked the Minister of Public Works, Posts and Telecommunications: (*a*) Were tenders called for transporting tar, cement, explosives and other requirements of the office of the Executive Engineer, P. W. D., Bibile, and of the area from Badulla? (*b*) If so, when? (*c*) Who is the present holder of this transport contract? What is his address? (*d*) How many lorries does the contractor have? (*e*) If no contract has been given after calling for tenders, will be take action to call for tenders? (*f*) If not, why?

**නයිනා මරික්කාර් මයා. (රජයේ වැඩ, තැපැල් හා විදුලි සන්දේශ ඇමති වෙනුවට)**

*(ஜனப் நயினா மரிக்கார்—அரசாங்கக் கட்டு வேலை, தபால், தந்திப் போக்குவரத்து அமைச்சர் சார்பாக)*

(Mr. Naina Marikar—on behalf of the Minister of Public Works, Posts and Telecommunications)

(*a*) No. The P. W. D. overseer does such transport at present, as in the case of other districts. He is paid at approved departmental transport rates. (*b*), (*c*), (*d*), (*e*) and (*f*) Do not arise in view of the Answer to (*a*) above.

## නොපැමිණීමේ අවසරය: ඩී. එෆ්. හෙට්ටිආරච්චි මහතා

*வராதிருக்க அனுமதி: திரு. டீ. எப். ஹெட்டியாராச்சி*

## LEAVE OF ABSENCE: MR. D. F. HETTIARACHCHI

**එම්. පී. ද සොයිසා සිරිවර්ධන මයා.**

*(திரு. எம். பீ. டி சொய்சா சிறிவர்தன)*

(Mr. M. P. de Zoysa Siriwardena)

**මෙම යෝජනාව මම ඉදිරිපත් කරමි:**

"1946 ලංකා (ආණ්ඩුක්‍රම) රාජ සභා ආඥාවේ 24(1) (ඊ) ඡේදය යටතේ නිවිතිගල මන්ත්‍රීවර ඩී. එෆ්. හෙට්ටිආරච්චි මහතාට 1966 ජූනි මස 20 වන දින සිට මාස 3 ක් තුළ මන්ත්‍රී මණ්ඩලයේ රැස්වීම්වලට නොපැමිණීමට අවසර දිය යුතුය."

**ජයකොඩි මයා.**

*(திரு. ஜயக்கொடி)*

(Mr. Jayakody)

**විධාන ස්ථිර කරන ලදී.**

ஆமோதித்தார்.

*seconded.*

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

## නීති කොමිෂන් සභා පනත් කෙටුම්පත [සෙනෙට්]

*சட்டவாணைக்குழு மசோதா [செனெற்]*

## LAW COMMISSION BILL [SENATE]

**කල් තබන ලද විවාදය නවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී. ඊට අදාළ ප්‍රශ්නය [ජූනි 19.]**

**"කෙටුම්පත් පණත දැන් දෙවන වර කියවිය යුතුය."—[ගරු ජේ. ආර්. ජයවර්ධන]**

**ප්‍රශ්නය යළින් සභාගිමුඛ කරන ලදී.**

ஜூன் 19 ஆம் தேதிய வினுமீதான ஒத்திவைக்கப் பெற்ற விவாதம் மீள ஆரம்பிப்பதற்கான கட்டளை வாசிக்கப்பட்டது.

"மசோதா இப்பொழுது இரண்டாம் முறை மதிப் பிக்கப்படுமாக".—[கௌரவ ஜே. ஆர். ஜயவர்தன.]

வினு, மீண்டும் எடுத்தியம்பப்பெற்றது.

*Order read for resuming Adjourned Debate on Question—[19th June.]*

"That the Bill be now read a Second time".—[*The Hon. J. R. Jayewardene.*]

*Question again proposed.*

**ගරු සී. පී. ද සිල්වා (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති හා සභානායක)**

*(கௌரவ சீ. பீ. டி சில்வா—காணி, நீர்ப் பாசன, மின்விசை அமைச்சரும் சபை முதல் வரும்)*

(The Hon. C. P. de Silva—Minister of Land, Irrigation and Power and Leader of the House)

We have discussed this Bill the whole of yesterday. May I know, Sir, how much longer it will take?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

At the Party Leaders' meeting it was decided not to take up an item if it is controversial. If you can indicate to the Chief Whip how many more Members there are to speak, then we can come to some agreement.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி. சொய்சா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

We have got about four Members who wish to speak. The hon. Member for Agalawatta (Dr. Colvin R. de Silva) wishes to speak.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

Let us take it up later.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

You cannot do that.

**නයිනා මරික්කාර් මයා.**
*(ஜனுப் நயினா மரிக்கார்)*
(Mr. Naina Marikar)

May I suggest that this Bill be taken up and passed? It has been passed by the Senate and if you do not pass it now the whole matter will get delayed.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி. சொய்சா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

There are hon. Members who might wish to speak on this Bill. I cannot do anything to limit their speeches.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

I move,

"That the Debate be now adjourned."

**ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.**
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
*Question put, and agreed to.*

**එම අනුකූලව විවාදය කල් තබන ලදි.**
இதன்படி விவாதம் ஒத்திவைக்கப்பட்டது.
*The Debate stood adjourned accordingly.*

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Item No. 2.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

That is not controversial.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

It is not for you to say that it is not controversial.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

We are trying to abolish the export duty on certain articles.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Will you please move it?

## රේගු ආඥාපනත යටතේ සම්මතිය

சுங்க கட்டளைச் சட்டம்: தீர்மானம்

## CUSTOMS ORDINANCE: RESOLUTION

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

I move,

"That this House resolves under Section 10 of the Customs Ordinance (Chapter 235), that with effect from the date on which this resolution is notified in the Gazette, the export duty imposed

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

under the said Ordinance on the items set out in the schedule hereto shall be abolished :—

*Schedule*

Natural Graphite (Plumbago)
Papain pure—white
Papain pure—brown

Glycerol and Glycerol lyes :—
Glycerol including Glycerine
Crude Glycerine "

**ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.**

விஞ விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

## කොළඹ වරාය (පරිපාලන) පනත යටතේ නියෝග

கொழும்புத் துறைமுக (நிருவாக) சட்டம்—பிரமாணங்கள்

## Port of Colombo (Administration) Act—Regulations

**ගරු වී. ඒ. සුගතදාස (ජනසතු සේවා ඇමති)**

(கௌரவ வீ. ஏ. சுகததாச—தேசியமய சேவை அமைச்சர்)

(The Hon. V. A. Sugathadasa—Minister of Nationalized Services)

I move,

"That the Regulations made by the Minister of Nationalized Services by virtue of the powers vested in him by Section 12 (2) of the Port of Colombo (Administration) Act (Chapter 238), and published in Ceylon Government Gazette No. 14,740 of 17th March, 1967, which were presented on April 7, 1967, be approved."

**ගරු ජේ. ආර්. ජයවර්ධන**

(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)

(The Hon. J. R. Jayewardene)

These regulations deal with port charges for the use of tugs like the "Goliath", "Samson", "Hercules", "Sinha Bahu" and "Barana". The charges are stated in the regulation for berthing on entry and unberthing on leaving harbour, for towage for berthing, use of a tug and fire hydrants, and so on.

**ද සොයිසා සිරිවර්ධන මයා.**

(திரு. டி சொய்சா சிறிவர்தன)

(Mr. de Zoysa Siriwardena)

Agreed.

**ප්‍රශ්නය සභාගිමුඛ කරන ලදි.**

விஞ எடுத்தியம்பப்பெற்றது.

*Question proposed.*

**ඉලංගරත්න මයා.**

(திரு. இலங்கரத்ன)

(Mr. Ilangaratne)

මෙය වැඩි වීමක්ද අඩු වීමක්ද යන බව ගරු ඇමතිතුමාගෙන් දැනගන්න කැමතියි.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**

(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)

(The Hon. J. R. Jayewardene)

වැඩි වීමක්.

**ඉලංගරත්න මයා.**

(திரு. இலங்கரத்ன)

(Mr. Ilangaratne)

වැඩි කරන්න හේතුව මොකක්ද?

**ගරු ජේ. ආර්. ජයවර්ධන**

(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)

(The Hon. J. R. Jayewardene)

අද හැම දේකින්ම වියදම වැඩි වී තිබෙනවා. ඒ නිසා මේ ගාස්තුත් තව ටිකක් වැඩි කර තිබෙනවා.

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

விஞ விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

## කොළඹ ග්‍රේවිං තටාකය සහ පේටන්ට් දියත් මඟ ආඥුපනත යටතේ ව්‍යවස්ථා

கொழும்பு செப்பனிடுதுறை, காப்புரிமை யுடைய சாய்த்தளக் கட்டளைச் சட்டம்—விதி

## Colombo Graving Dock and Patent Slip Ordinance—Rule

**ගරු සුගතදාස**

(கௌரவ சுகததாச)

(The Hon. Sugathadasa)

I move,

"That the Rules made by the Minister of Nationalized Services by virtue of the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

powers vested in him by Section 4 of the Colombo Graving Dock and Patent Slip Ordinance (Chapter 372), and published in Ceylon Government Gazette No. 14,740 of 17th March, 1967, which were presented on April 7, 1967, be approved."

**ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.**

*கிளி விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

## මාස්ටර් ඇටෙන්ඩන්ට් ආඥාපනත යටතේ ව්‍යවස්ථාව

*துறைமுகத் தலைவர் கட்டளைச் சட்டம்—விதி*

MASTER ATTENDANT ORDINANCE—RULE

**ගරු සුගතදාස**
*(கௌரவ சுகததாச)*
(The Hon. Sugathadasa)

I move,

"That the Rule made by the Minister of Nationalised Services by virtue of the powers vested in him by Section 3 of the Masters Attendant Ordinance (Chapter 369), and published in Ceylon Government Gazette No. 14,740 of 17th March, 1967, which was presented on April 7, 1967, be approved."

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

This is in regard to increasing the charges for pilotage. All these regulations deal with increase of charges. This is for pilotage.

**ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.**

*கிளி எடுத்தியம்பப்பெற்றது.*

*Question proposed.*

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

මේ ගාස්තුව වැඩි කිරීම නිසා, රටට ගෙන්වන බඩුවල මිළ වැඩි වෙනවද? බඩු මිළ එසේ වැඩිවීම රටේ ජීවන වියදමටත් බලපානවද? එසේ නම්, එය පහළ දැමීමට යම්කිසි වැඩ පිළිවෙලක් යොදා තිබෙනවාද?

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

බොහොම ටිකක් වැඩි වෙනවා.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

ටික ටික එකතු වෙලා හුඟක් වෙයි.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்சா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

සංයුක්ත මණ්ඩලයෙන් පාඩු සිදුවන නිසා මෙයින් ඒක පිරිමහ ගන්න හදනවද?

**ෂෙල්ටන් ජයසිංහ මයා.**
*(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)*
(Mr. Shelton Jayasinghe)

නෑ, නෑ, එහෙම පිරිමහන්නෙ නැහැ.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

"පයිලටේජ්" යනුවෙන් හැඳින්වෙන මෙම ගාස්තු, පෝට් කොමිසන් සභාව යටතෙ වරායෙ වැඩ කරන ඇතැම් කම්කරු කොටස්වලට බෙදා දීමේ සිරිතක් තිබෙනව. එසේ බෙදා දෙන්නෙ ලැබෙන සම්පූර්ණ ගාස්තුවම නොව එයින් කොටසක් පමණයි. විශෙෂයෙන්ම, නැව් එන විට ඒවට ආධාර කිරීම සඳහා පාවිච්චි කරන යාත්‍රාවල සේවකයන්ටයි මේ ගාස්තුවලින් කොටසක් බෙදා දීම සිරිතක් වශයෙන් පවතින්නෙ. ගාස්තු වැඩි කරන්නට යන මේ අවස්ථාවෙදි, එසේ වැඩි කරනු ලබන ගාස්තුවලිනුත් කිසියම් කොටසක් ඒ ඒ සේවකයින්ට ලබා දීමට සූදානමක් තිබෙන වද යන බව මා ගරු ඇමතිතුමාගෙන් දැන ගන්න කැමතියි.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

යම්කිසි ප්‍රතිපත්තියක් තිබුණ නම්, එය මේ ගාස්තු වැඩි කිරීමෙන් පසුවත් ඒ විධියටම ක්‍රියාවෙ යෙදෙනව ඇති.

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

*கிளி விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## පරිපූරක මුදල: ශාරීරිකාභ්‍යාස උපදේශකයින් හා ශාරීරික අධ්‍යාපන පරීක්ෂකවරුන්

குறைநிரப்புத் தொகை: உடற்பயிற்சிப் போதனாசிரியர்களும் உடற் கல்விப் பரிசோதகர்களும்

## SUPPLEMENTARY SUPPLY: PHYSICAL TRAINING INSTRUCTORS AND PHYSICAL EDUCATION INSPECTORS

පූ. භා. 10.40

**ගරු සුගතදාස**

(கௌரவ சுகததாச)

(The Hon. Sugathadasa)

I move,

"That a Supplementary sum not exceeding Rupees Two hundred and sixty-seven thousand two hundred and thirty (Rs. 267,230) be payable out of the Consolidated Fund of Ceylon, or any other fund or moneys of, or at the disposal of, the Government of Ceylon, or from the proceeds of any loans obtained by the Government of Ceylon, for the service of the financial year beginning on October 1, 1966, and ending on September 30, 1967, and that the said sum may be expended as specified in the Schedule hereto :—

*Schedule*

| | Rs |
|---|---|
| Head 85—Minister of Nationalized Services. | |
| Vote No. 1—Personal Emoluments and other allowances of Staff .. .. | 267,230" |

You will remember, Sir, that in 1965, a sport section was created in my Ministry to foster, promote, organize and encourage sports, and improve the standard of sports in this country. As a result we had to secure the services of a few officers who have had the necessary experience to carry out the objects of this sport section. We carried on for 12 months and then we found hon. Members from the Government as well as from the Opposition wanted more and more playgrounds in their electorates. In doing so we had to get more staff.

The Hon. Prime Minister was of the view that instead of recruiting the staff from outside and in order to avoid a duplication of work between the Ministry of Nationalized Services and the Ministry of Education, 150 officers from the Ministry of Education should be transferred to the Ministry of Nationalized Services. Accordingly, this was done.

But, there was no money with the Ministry of Nationalized Services to pay these officers. The money allocated for these officers which was with the Ministry of Education was frozen, and I am asking that this money be transferred to the Ministry of Nationalized Services. It is necessary that I should come before the House for this purpose.

**ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.**

விஷ எடுத்தியம்பப்பெற்றது.

*Question proposed.*

**ඩී. ජී. බී. කෙනමන් මයා.** (මෑද කොළඹ තුන්වන මන්ත්‍රී)

(திரு. பீ. ஜீ. பி. கெனமன்—கொழும்பு மத்தி மூன்றும் அங்கத்தவர்)

(Mr. P. G. B. Keuneman—Third Colombo Central)

You will notice from the explanation given by the Hon. Minister that this is really a transfer of funds and there is no increase in the personnel because those who were attached to the Ministry of Education are now with the Ministry of Nationalized Services. At least 150 of them are now attached to the other Ministry.

The point I want to raise is that, as the Hon. Minister explained, if we take into account the feeling that has been expressed and to which he has referred for the further expansion of the playground movement, these extra 150 officers will not be enough because this is merely a transfer of one set of people from one place to another. We will have to increase the total number of physical training instructors.

In this connection, I want to point out that there is a whole mass of such persons, who, the Ministry is aware, at their own expense went to India and obtained some qualification there. I do not exactly know what the qualification is.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)
Diploma in Physical Education.

**කෙනමන් මයා.**
*(திரு. கெனமன்)*
(Mr. Keuneman)
I do not know whether we intend to absorb those people. Really, they are trained people.

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)
Some of them have been absorbed.

**කෙනමන් මයා.**
*(திரு. கெனமன்)*
(Mr. Keuneman)
Some of them have been absorbed, but I do not know whether it is the intention to absorb them all. Instead of transferring people from the Education Department let us use the maximum potential that we have.

Secondly, does the Minister contemplate setting up any institute in this country to train physical instructors? Instead of sending people abroad for training, it seems to me that it would be far better to set up our own institute and quickly provide the number of instructors who will be required for spreading this playground movement.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)
The Hon. Minister's explanation covers the question of the need for this Supplementary Estimate, but it would have been certainly better from the point of view of this House if he could have given us some indication of what progress has been made in regard to the proposed set-up.

A total of 150 physical training instructors and 5 physical education inspectors have been transferred from the Department of Education or arrangements have been made to transfer them. On what basis are these persons to function at the regional level? What is the organization or the centre the Minister has in mind? Is it going to be the *kachcheris*? Is the Government Agent who functions as the Irrigation Officer, as the Collector of Customs, as the Land Officer, and so on, at the regional level, also going to act as the Director of Sports at the regional level? Is that the set-up, or has the Minister got some other scheme in mind? Is it going to be parallel to the Education Department organization at the district level? What is the organization the Minister has in view, on a national scale, for operating at the regional and district levels? It would have been advisable if the Minister had given us some information on that matter, because then the true point the hon. Third Member for Colombo Central (Mr. Keuneman) wishes to bring out as to the adequacy of the personnel already transferred, would become clear.

I also want to stress the question that there are a number of persons who have received instructions in physical training in India who are languishing for lack of employment, particularly because the recruitment of these persons into the schools also followed the general policies of the Education Department in regard to the recruitment of teachers, and the whole question got confused with the recruitment of teachers at different levels, with the result that persons who were eligible for employment and who deserved employment in schools which deserved an instructor, could not find the necessary billets because of the confusion of policy.

Those are the questions I would like to address to the Hon. Minister. The principal question for us is how he proposes to organize this at the district level. And from the point of view of what he mentioned—the non-duplication of such work between two ministries and two departments—if he is going to concentrate upon those persons in the village who are not in school, then the 150 persons who have been taken away from the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

Education Department have to be replaced. This is a matter for the Minister of Education, and I would like to know whether he is going to replace those 150 persons in the Education Department.

From the Minister of Sports we would like to know whether he intends to expand this cadre and, if so, if he is confining his attention to the development of sports among persons who are not in school, what is the organizational set-up he has in mind, and how is it to be administered?

පූ. භා. 10.50

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් මාරු කරන ලද ගුරුවරුන් සමූහයක් ආදයම් පාලක නිලධාරිතුමන්ලාගේ මාගීදේශකත්වය යටතේ ඒ ඒ ප්‍රදේශවල ක්‍රීඩා සංවිධානය කිරීමටත්, ක්‍රීඩා දක්ෂතාවයන් දියුණු කිරීමටත් යෙදවීම සඳහා මේ පරිපූරක වැය ශීර්ෂය ඉදිරිපත් කර තිබෙන බව ගරු ඇමතිතුමා ප්‍රකාශ කළා. අපට දැන ගන්නට ලැබී තිබෙන්නේ දැනට මේ සඳහා ගුරුවරුන් 150 කට වඩා බඳවා නොගන්නා බවයි. ඔය අදහස් කරන වැඩේට මේ 150 ඇද්ද කියා මම දැන ගන්නට කැමතියි. අඩු ගණනේ එක ආදායම් පාලක කොට්ඨාශයකට එක්කෙනා බැගින් යොදවන්නත් මේ ගණන ප්‍රමාණවත් නැහැ.

මේ වන තුරු බොහෝ දුරට මේ රටේ ක්‍රීඩාව පාඨශාලාව මුල් කරගෙනයි, සංවිධානය වී තිබුණේ. ක්‍රීඩාව කීමෙන් අපි අදහස් කරන්නෙ ඇත්ලට්ක් අංශයට අයත් ක්‍රීඩා පමණක් නොවෙයි. රගර්, ක්‍රිකට්, බොක්සිං ආදි තවත් ක්‍රීඩා තියෙනවා. එක පාඨශාලාවක ඒ ඒ ක්‍රීඩා පිළිබඳව දක්ෂතාවයන් ඇති ගුරුවරුන් ඒ ඒ ක්‍රීඩා පුහුණු කිරීම සඳහා යොදවා තිබෙනවා. එක ක්‍රීඩාවක් දන්න කෙනෙකුට හැම ක්‍රීඩාවක්ම උගන්වන්න බැහැ. රගර් ක්‍රීඩාවට දක්ෂ නැහැත්තාට බොක්සිං උගන්වන්න බැහැ. මේ පත් කරන්න යන ගුරුවරුන් පත් කරන්න බලාපොරොත්තු වන්නේ එක අංශයකට පමණක් බව පෙනෙනවා. ඇත්ලට්ක් අංශය පමණක් උගැන්වීමයි, එයින් සිදු වන්නේ. විවිධ ක්‍රීඩාවන්ට කැමති අය, දක්ෂ අය සිටියත් මේ වැඩ පිළිවෙළ අනුව ඒ ක්‍රීඩා ලෝලයන්ට තමන්ගෙ දක්ෂතාවය එක ක්‍රීඩාවකට පමණක් සීමා කරගෙන කටයුතු කරන්න සිදු වෙනවා. තමුන්නාන්සේගේ සංවිධානය කොයි තරම් පළල් කළත් අපේ විරුද්ධත්වයක් නැහැ. නමුත් දැනට පාඨශාලාවල ඒ ඒ ක්‍රීඩාවන් පුහුණු කරන ගුරුවරුන් සිටිනවා නම් ඒ අය මාරු කරන්න එපාය කියා මම ඉල්ලා සිටිනවා. ගරු අධ්‍යාපන ඇමතිතුමත්, ඒ වගේම ජනසතු සේවා ඇමතිතුමත් ඒ ගැන කල්පනා කර කටයුතු කරන්න ඕනෑ. ඒ ගුරුවරුන් මාරු කළොත් මේ රටේ ක්‍රීඩා අංශයේ පහළ වැටීමක් මිසක් නැගීමක් සිදු වන්නෙ නැහැ.

මේ අතරම තවත් කාරණයක් ගැන සඳහන් කරන්න තියෙනවා. මේ රටේ ක්‍රීඩකයන් නොයෙකුත් ජාත්‍යන්තර ක්‍රීඩාවලට සම්බන්ධ වී කටයුතු කරගෙන එනවා. නමුත් සමහර ක්‍රීඩකයන් එක ක්‍රීඩාවකට පමණක් සීමා වෙන්නෙ නැතුව නොයෙකුත් ක්‍රීඩාවල නායකත්වයන් දරාගෙන පිටරටවල සංචාරී ගැසීමේ වැඩ පිළිවෙළක් යොදාගෙන තිබෙන බව පෙන්වා දෙන්නට කැමතියි. තමුන්නාන්සෙත් දන්නවා ඇති මේ රටේ නොයෙකුත් පුද්ගලයින් සංවිධානය වී ඉන්දියාවට වන්දනාකරුවන් නිතර නිතර ගෙන යන බව. ඒ ලෙඩේ ක්‍රීඩාවටත් බෝ වෙන්න පුළුවන්. එක්තරා වකවානුවලදී ලංකා ක්‍රිකට් සංගමයට විරුද්ධව තවත් ක්‍රිකට් සංගමයක්—ජාතික ක්‍රිකට් සංගමය නමින් හැදින්වුණු ක්‍රිකට් සංගමයක්—ආරම්භ කර ඒ දෙපක්ෂය අතර පිටරට සංචාරී යන්න තරඟයක් ඇති වුණු බව අපට මතකයි. කොයි සංගමයෙන් යවන නියෝජිත පිරිස ලංකාවේ නියෝජිත පිරිසද කියා මතභේදයක් ඇති කළා. මේ තත්ත්වය පාඨශාලාවලටත් බලපා තිබෙනවා. අද පාඨශාලාවලත් "නැෂනල් ක්‍රිකට් ඇසෝෂියේෂන්" කියා එක සංගමයකුත් "පබ්ලික් ස්කූල්ස් ක්‍රිකට් ඇසෝෂියේෂන්" කියා තවත් සංගමයකුත් තිබෙනවා. බොක්සිං ක්‍රීඩාව සම්බන්ධයෙන් එවැනි තත්ත්වයක් තිබෙනවාය කියා මා සිතන්නේ නැහැ. රගර් ක්‍රීඩාව සම්බන්ධ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යෙනුත් එවැනි තත්ත්වයක් නැහැ. නමුත් ක්‍රිකට් ක්‍රීඩාව පිළිබඳව එවැනි තත්ත්වයක් තිබෙනවා. ඒ වාගේම වොලිබෝල් ක්‍රීඩාව ගැනත් ආකූල තත්ත්වයක් තිබෙන්නෙ. කවුරු හරි බලවන්ත පිරිසකට පිටරට සවාරියක් යන්න අවස්ථාව නොලැබුණොත් සංගමයෙන් අස්වෙනවා. අස්වී තවත් අළුත් සංගමයක් පිහිටුවා පිටරට සවාරිවල යෙදීමට පුළුවන් තත්ත්වයක් ඇති කර ගන්නවා. ඒ අන්දමට කටයුතු කෙරෙන විට එක පක්ෂයකින් ඔන්න ගරු ඇමතිතුමාට කේලමක් කියනවා. අනික් පක්ෂයෙන් තවත් කේලමක් කියනවා, ඇමතිතුමාගේ වැඩි සැලකිල්ල යොමු වියයුත්තේ ඒ පක්ෂයටය කියා. ඔයින් මෙයින් ඇමතිතුමා කියන කියන දේට ඔව් කියන පිරිසක් ඇති වෙනවා. ඇමතිතුමාගේ වාසි තකා ගෙන වැඩ කරන පිරිසක් ඇති වෙනවා. අවසානයේ දී ලංකාව වෙනුවෙන් යම් නියෝජිත පිරිසක් පිටරටකට යැව්වොත් ඔවුන් ඇත්ත වශයෙන්ම නියම සුදුසුකම් තිබෙන පුද්ගලයින්ද කියා අප තුළ සැකයක් ඇති වෙනවා. එම නිසා මේ අවස්ථාවේදී මා ක්‍රීඩා අමාත්‍යාංශය භාර ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරන්ට සතුටුයි. එතුමාත් ක්‍රීඩා ලෝලයෙක්. කුඩා කාලයේදී එතුමා ඉතා දක්ෂ අන්දමින් පාපන්දු ක්‍රීඩා කළාලු. දැනුත් එතුමා ක්‍රීඩාවට බොහොම කැමතිලු. එමනිසා ඇමතිතුමා ටිකක් පරීක්ෂාවෙන් මේ කටයුතු කරනවා ඇතැයි මා බලාපොරොත්තු වෙනවා. ඒ මක්නිසාද? තමුන්නාන්සෙ ළඟට නොයෙක් දේවල් කියාගෙන නොයෙක් පිරිස් ඒවි. අර ක්‍රීඩා සංගමයට වැඩි සැලකිල්ලක් දක්වන්ට එපාය, අපේ ක්‍රීඩා සංගමයට වැඩි සැලකිල්ලක් දක්වන්නටය කියා නොයෙක් දේවල් තමුන්නාන්සේට ඉදිරිපත් කරාවි. එම නිසා සුපරීක්ෂාවෙන් මේ කටයුතු කරන මෙන් මා ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ක්‍රීඩා අංශය පිහිටුවා දැන් අවුරුදු දෙකකටත් වැඩි කාලයක් ගතවී තිබෙනවා. නමුත් මේ මොහොත වන තුරු මේ ගරු සභාවවත් මහ ජනතාවවත් ක්‍රීඩා අංශයෙන් මොන මොන දේවල් කෙරෙනවද කියා කිසිවක් දන්නෙ නැහැ. ක්‍රීඩා අමාත්‍යාංශයෙන් කිසිම ප්‍රචාරයක් ගෙන යන්නෙ නැහැ. මේ රටේ තරුණයින්ගේ ශාරීරික අභ්‍යාස දියුණු කිරීමේත් සහජ දක්ෂතාවයන් දියුණු කිරීමේත් අදහසින් මේ අංශය පිහිටෙව්වාට මොකද ගම්බද සිටින ගැමි ජනතාව තවම මේ අමාත්‍යාංශයෙන් කෙරෙන දේවල් මොනවාද කියා දන්නෙ නැහැ. අද අපේ ගම්වල එල්ලෙ ක්‍රීඩාවත් වොලිබෝල් ක්‍රීඩාවත් ඉතාම දියුණු තත්වයකට පැමිණ තිබෙනවා. නමුත් ඒ ක්‍රීඩාවන් පිළිබඳව මේ අමාත්‍යාංශයේ ඒ ඒ අංශවලින් කෙරෙන වැඩ කටයුතු පිළිබඳව කවුරුවත් කිසිම දෙයක් දන්නෙ නැහැ. මේ අමාත්‍යාංශයේ වැඩ කටයුතු මොනවාද, සැලැස්මවල් මොනවාද කියා තවම රට දන්නෙ නැහැ. එමනිසා අවසාන වශයෙන් මේ අමාත්‍යාංශයෙන් ක්‍රීඩා පිළිබඳව කෙරෙන වැඩ ගැනත් පිළියෙළ කරන සැලැස්මවල් ගැනත් ප්‍රතිපත්ති ගැනත් රටේ ජනතාව තුළ පැහැදිළි අවබෝධයක් ඇති කරවීමට කටයුතු කරන මෙන් මා ඉල්ලා සිටිනවා .

ප්‍ර. හා. 11

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වැය ශීර්ෂය පිළිබඳව වචන දෙක තුනක් කියන්ට අදහස් කරනවා. ජනසතු සේවා අමාත්‍යාංශයේ ක්‍රීඩා දෙපාර්තමේන්තුව ව්‍යාප්තවීම ගැන අපි බොහොම සන්තෝෂ වෙනවා. මේ යෝජනාවෙන් අදහස් කරන්නෙ අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ තිබුණු එක්තරා අංශයක් ජනසතු සේවා අමාත්‍යාංශයට භාර ගැනීමයි. ජනසතු සේවා අමාත්‍යාංශයට මේ අංශය පවරා ගැනීමෙන් අධ්‍යාපන අමාත්‍යාංශය කර ගෙන ගිය කටයුතුවලට හානියක් නොවේ ය කියා මා කල්පනා කරනවා. ජනසතු සේවා ඇමතිතුමාගේ අදහස අධ්‍යාපන අමාත්‍යාංශයෙන් කෙරුණාට වඩා ව්‍යාප්ත අන්දමින් මේ කටයුතු කිරීම නම් අපි මේ යෝජනාවට එකඟයි. එහෙම නැතිව අධ්‍යාපන ඇමති අංශයෙන් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට කරනු ලබන සේවය අඩු කර, ඊට හානි වන විධියට වෙනත් අංශයක් පටන් ගෙන ක්‍රියා කළොත් එය මදිකමක් හැටියට පිළිගනු ඇතැයි මා කල්පනා කරනවා. ගරු ඇමතිතුමා එහෙම එකක් වෙන්නෙ නැතැයි කියනවා. එහෙම නම් අපට සන්තෝෂ වන්නට පුළුවනි. ඒ කාරණය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

එසේ පැහැදිලි කර දීම ගැන මා සන්තෝෂ වෙනවා.

ක්‍රීඩා අමාත්‍යාංශය මගින් ක්‍රීඩා අංශය ව්‍යාප්ත කරගෙන යාම ගැන මා කොළොන්නාවේ මන්ත්‍රීවරයා හැටියට විශේෂයෙන් සන්තෝෂ වෙනවා. එහි දැන් බොහෝ දුරට ක්‍රීඩා ව්‍යාප්ත වේගෙන යනවා. ක්‍රීඩා කටයුතු ව්‍යාප්ත කිරීමේ වැඩ කටයුතු ගැන කොයි විධියටද සැලැස්ම සකස් කර තිබෙන්නෙ යනුවෙන් දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා (බර්නාඩ් සොයිසා මයා.) ප්‍රශ්න කළා. ප්‍රාදේශීය නිලධාරීන් ඉන්නවද, වෙනත් ප්‍රධාන නිලධාරීන් ඉන්නවද, යනාදී කරුණු ගැන එතුමා ඇහුවා. මට පෙනෙන හැටියට නම් ක්‍රීඩා ඇමතිතුමා උපදෙස් ගන්නෙ එතුමගෙ මිත්‍රයන්ගෙනුයි. ඊට අප කිසි සේත් විරුද්ධ නැහැ. ඒ කොයි හැටි වෙනත්, යම් ආයතනයක් විවෘත කළාම එයින් සිදු වන සේවය තමන්ගේ පක්ෂය අනුගමනය කරන උදවියට පමණක් සීමා නොකර අනෙක් අයටත් ව්‍යාප්ත කළොත් අපටත් සන්තෝෂ වෙන්න පුළුවන් බව මතක් කරන්න කැමැතියි. එහෙම නොවෙතත් අපට සන්තෝෂ වෙන්න පුළුවනි. කවුරු හෝ එහි ගොස් වුවමනා පරිදි ව්‍යායාම් කර ප්‍රයෝජන ගන්නවා නම් එයින් කාට හෝ ප්‍රයෝජනයක් අත්වෙනවා. ඒ නිසයි අපට සන්තෝෂ වීමට පුළුවන්කමක් තිබෙන්නෙ. එහෙත් එය කොටසකට පමණක් සීමා වීම හොඳ මදි. කොළොන්නාවෙදී එතුමාට යම් යම් බලපෑම්වලට මුහුණ පාන්න සිද්ධ වෙන්න ඇති. අපට මේ දේ කර දෙන්න, මේ දේ කර දෙන්නැයි කියන අය ඉන්න පුළුවනි. ඔය තත්ත්වය කාලයක් ගතවන තුරු තිබෙන්න පුළුවනි. එහෙත් හැම කෙනෙකුටම ප්‍රයෝජන ගත හැකි වන හැටියට ක්‍රියා කිරීමට උත්සාහ කරනු ඇතැයි බලාපොරොත්තු වෙනවා.

පූ. භා. 11.3

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ** (අකුරැස්ස)

*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ—அக்குறஸ்ஸ)*

(Dr. S. A. Wickremasinghe—Akuressa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ශීර්ෂය යටතේ වැදගත් කාරණයක් ගැන මතක් කරන්න තිබෙනවා. ක්‍රීඩා පුහුණු කිරීම සඳහා අවශ්‍ය නිලධාරීන් පත් කිරීමට පෙර ඒ ගැන සඳහන් කළ යුතුව තිබෙනවා. ගරු ඇමතිතුමා තුළ ක්‍රීඩා පිළිබඳ විශේෂ ඇල්මක් තිබෙන බව මා දන්නවා. ක්‍රීඩා භූමි ගැනයි මා සඳහන් කිරීමට කල්පනා කළේ. ඒවා ප්‍රවේශම් කර ගැනීමට වුවමනා තරම් වෙහෙස නොගැනීම ගැන ගරු ඇමතිතුමා වෙත මගේ කනගාටුව ප්‍රකාශ කර සිටිනවා.

අකුරැස්ස මැතිවරණ කොට්ඨාශයටම තිබෙන එකම ක්‍රීඩා භූමිය අකුරැස්ස නගරයේ තිබෙන ක්‍රීඩා භූමියයි. අකුරැස්ස සුළු නගර සභාවට අයත් ප්‍රදේශය තුළ පාඨශාලාවල අධ්‍යාපනය ලබන ශිෂ්‍ය සංඛ්‍යාව පන් දහසක් පමණ ඇති. එහෙත් ඒ ළමයින්ට එක ක්‍රීඩා භූමියක්වත් නැහැ. සුළු නගර සභාව ඇති කිරීමටත් පෙර ගම්කාර්ය සභාව පැවති කාලයේදී ඇති කරන ලද ක්‍රීඩා භූමිය පමණයි තිබෙන්නෙ. අධ්‍යාපන කටයුතු භාර ගරු ඇමතිතුමාටත් මෙය ඉතා වැදගත් කාරණයක්. සුළු නගර සභාව ඇති වීමට පෙර—ගම්කාර්ය සභාව මගින් පාලනය කරගෙන ගිය කාලයේදී—ආණ්ඩුවත් සමග සාකච්ඡා කර ඒජන්ත උන්නැහේගේ සහයෝගය ඇතිවයි මේ ක්‍රීඩා භූමිය ඒ කාලයේ ඇති කළේ. තානායමට යාව තිබුණු අක්කර එකහමාරක් තරම් වූ බිම් ප්‍රමාණය ක්‍රීඩා භූමිය සඳහා දුන්නා. වෙන කිසිම දෙයකට නොවෙයි එය දුන්නෙ. වෙනත් කටයුත්තකට එතැනින් ඉඩම් කැබැල්ලක් දුන්නොත් එයින් තානායමේ පරිසරය වෙනස් වෙනවාය, වෙනත් ව්‍යාපාර ඇති වීමෙන් නිවාසවාසීන්ට නොයෙක් හිරිහැර කරදරවලට මුහුණ පාන්න සිදු වෙනවාය, යන තර්කය අනුව දිසාපතිතුමා ගම්කාර්ය සභාවටයි මේ බිම් ප්‍රමාණය දුන්නෙ. සුළු නගර සභාව ඇති වූණේ ඊට පසු කාලයකයි. සුළු නගර සභාව රුපියල් අට දාහක් පමණ වියදම් කරන්න යෙදුණා ක්‍රීඩා භූමියේ වැඩ කටයුතු සඳහා. මේ ක්‍රීඩා භූමිය පාඨශාලා ශිෂ්‍යයන්ටත් ඉතා ප්‍රයෝජනවත් එකක් වුණා. බොහෝ දෙනකුට එය මධ්‍යස්ථානය කුත් වුණා. ක්‍රීඩා කටයුතු සඳහාත් එය ප්‍රයෝජනවත් වුණා. ඒ වගේම මැතිවරණ කාලයෙදි එක්සත් ජාතික පක්ෂයේ රැස්වීම්වලට පාවිච්චි කරන්ටත් පුළුවන් වුණා, මෙම ක්‍රීඩාභූමිය. මේ හිස් භූමිය එවැනි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ප්‍රසිද්ධ සභා රැස්වීම්වලටත් පාවිච්චි කරන්ට හැකි වී තිබීම එක්තරා විශෙෂ දෙයක් වශයෙන් සලකන්ට පුළුවනි.

සුළු නගර සභාව යෝජනා කළා, දැනට තිබෙන බස් ස්ටෑන්ඩ් එක අළුත්වැඩියා කළ යුතුය කියා. එසේ යෝජනා කොට තාව කාලික වශයෙන් එම බස් ස්ටෑන්ඩ් එක ක්‍රීඩා භූමියට ගෙනාව. නමුත් එම ක්‍රීඩා භූමිය දියුණු කරනවාය යන්න මහජනයාට අවබොධ වීම සඳහා රුපියල් දාහක හමාරක ගල් මුට්ටි එහෙම ගෙනැවිත් තබා කොන්ත්‍රාත් එකකුත් දීලා අන්තිමේදී යෝජනාවක් කළා ස්ථිර වශයෙන්ම මේ භූමිය බස් ස්ටෑන්ඩ් එක හැටියට පාවිච්චි කරන්ට ඕනෑය කියා. සන්තෝෂයි කියන්න, මේ ගැන ඇමතිතුමා සමග සාකච්ඡා කළ විට එතුමත් පිලිගත්ත මෙය අංග සම්පූර්ණ ක්‍රීඩා භූමියක් බවට පත් කළ යුතුය කියා. මා එතුමට ඒ ගැන ප්‍රශංසා කරනවා.

මේ ක්‍රීඩා භූමිය සඳහා අක්කර එකහමාරක් මදි බවත්, ඒ සඳහා තවත් ඉඩම් ප්‍රමාණයක් ගන්ට තිබේද කියා සොයා බලන්ට වුවමනා බවත්, කීව. සුළු නගර සභාව තුළ ක්‍රීඩා භූමියක් වශයෙන් පාවිච්චි කරන්ට තිබෙන්නෙ මෙම ඉඩම පමණයි. ඒ හැරෙන්ට ක්‍රීඩා භූමියට සුදුසු තැනිතලා ඉඩමක් සුළු නගර සභා සීමාවෙ අවට කොහෙවත් නැහැ. පස් දමා ටිකක් ගොඩ කළ යුතු මිනිසුන් පදිංචි නැති ටිකක් පහත් බිමක් ඒ අසල තිබෙන හෙයින්, තව අක්කර 3ක් පමණ වන තුරු එය ලොකු කර ගන්ට පුළුවනි. නගරයෙ කඩපොල පිටුපස තිබෙන එම හරිය ගොඩ කළ විට සනීපාරක්ෂාව දියුණු වන්ටත් හොඳයි. එය වතුරෙන් යට වන නිසා දැන් පාවිච්චි කරන්නෙත් නැහැ. වතුරෙන් යට වෙන ඉඩමක් ක්‍රීඩා භූමිය සඳහා පාවිච්චි කළාට එතරම් පාඩුවක් වන්නෙ නැහැ. ඒ වැනි ඉඩමක් තෝරා ගෙන ක්‍රීඩා භූමිය අංගසම්පූර්ණ කරන්ට යන විට මෙවැනි තත්ත්වයක් පැන නැංගා. අපේ ඉල්ලීම උඩ මේ පිළිබඳව පවත්වන්ට යෙදුණු සාකච්ඡාවට නගර නිර්මාණ ශිල්පී තැනත්, සුළු නගර සභාවේ සභාපතිත්, ලංගමයෙ ප්‍රධාන සභාපතිත්, මත් සභාගී වුණා.

PUBLIC LIBRARY
JAFFNA

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org



**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
පරාජිත මන්ත්‍රීවරය ආවෙ නැද්ද?

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

ඔහු ආවෙ නැහැ. ඒ වෙනුවට වෙන්ට ඇති සුළු නගරාධිපති ආවිත් සිටියෙ. එතනදි ලංගම සභාපති, නගර නිර්මාණ ශිල්පී, ඇතුළු හැම දෙනාම වාගෙ බොහොම සතුටින් පිළිගත්ත, ක්‍රීඩා භූමිය ඉතා වැදගත් වන නිසා එය ප්‍රවේසම් කර ගත යුතු බව. ඒ ක්‍රීඩා භූමිය පාවිච්චි කරන්ට 5,000 ක් විතර ළමයි සිටිනව. අසල තිබෙන ඉඩමක් අරගෙන පරණ බස් ස්ටෑන්ඩ් එක තව ටිකක් ලොකු කරන්ට කතා කරන විට සුළු නගර සභාවේ සභාපතිතුමා කියනව, ඒ අරගෙන තියෙන තීරණය වෙනස් කරන තීරණයක් නොවේය; එය අවසාන වූත් ස්ථිර වූත් සදාකාලිකවූත් තීරණයක්ය කියා. බස් ස්ටෑන්ඩ් එක ක්‍රීඩා භූමිය වෙන්ට ඕනෑය කියා උන්නැහෙ සාකච්ඡාවෙන් ඉවත් වෙලා ගියා. ශිෂ්ට හැසිරීමෙන් තොරව, වගකීමෙන් තොරව, කතා කළ සුළු නගරාධිපතිතැන එම සාකච්ඡාවෙන් වෙන් වෙලා ගියා. මෑතදී නගර නිර්මාණ ශිල්පී තැන ඒ සම්බන්ධයෙන් සැලැස්මක් සකස් කොට සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන බව කීව, සුළු නගර සභාවට ක්‍රීඩා භූමියක අවශ්‍යතාව බෙහෙවින් බල පවත්නා බව අවබෝධ කරගෙන තිබෙන නිසා. මෙයට එක හේතුවක් තිබෙනව. ක්‍රීඩා භූමිය අවට තිබෙන කඩපොල සම්පූර්ණයෙන්ම අයිති, සුළු නගර සභාපතිගෙ පවුලටයි. පරණ බස් ස්ටෑන්ඩ් එක තිබුණ හරියෙ තිබෙන කඩපොළවල් සාමාන්‍ය සුළු වෙළෙන්දන් එක් එක් කෙනාට අයිතියි. එයින් කොටසක් සුළු නගර සභාවට අයිතියි. සුළු නගර සභාවට අයත් පරණ බස් ස්ටෑන්ඩ් එකේ හිස් බිම්වල, යම් යම් කොන්දේසි පිට වෙළෙඳාම් කරන වෙළෙඳුන් රාශියක් ඉන්නව. බස් ස්ටෑන්ඩ් එක ක්‍රීඩා භූමියට ගෙනාවාම සුළු නගර සභාපතිගෙ පවුලට අයත් ඉඩ කඩම්වල මිළ වැඩි වෙනව. දැනට බදු දීමට තිබෙන, ඒ නගර සභාපතිගෙ

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ]

පවුලට අයත් හිස් කඩවල් හුඟක් එහි තිබෙනව. නමුත් බස් ස්ටෑන්ඩ් එක මෙතැනට ගෙනාවොත් ඒ කඩවල පෙට්ට්‍රල් පොම්පයෙ, ගරාජයේ වටිනාකම වැඩි වෙනව. වෙළෙඳාම වැඩි වෙනව. ඒ නිසා, "ළමයින්ට මොන මළ ඉලව්ව වුණත් කමක් නෑ ක්‍රීඩා භූමිය ඕනෑ තැනකට අරගන ගියදෙන්, ඒක, තමුසෙලාගෙ වැඩක්, මම සුළු නගර සභාපති, සුළු නගර සභාවෙ එක වැඩි ඡන්දයක්—ඡන්දය තිබුණෙ 4, 3 යනුවෙන්—මට ගන්නට පුළුවන් වුණා, සක්‍ර දේවේන්ද්‍රයා කීවත් මෙය වෙනස් කරන්නෙ නැහැ" යන හැඟීමෙන් සුළු නගර සභාපති එසේ කරන්නට තීරණය කළා. ඒ අනුව ඔහු තමන්ගෙ පෞද්ගලික ලාභ ප්‍රයෝජනය සලකාගන පොදු ප්‍රතිපත්තිවලට පිටු පා ක්‍රියා කළා.

ඒ සුළු නගර සභාපතිගෙ මස්සිනා තමයි, ඒ සුළු නගර සභාපතිගෙ පවුලෙ කරගන මට විරුද්ධව හතර පාරක් විතර තරඟ කර පැරදුණේ. මා සමඟ තරඟ කරන මේජර් ධර්මපාලට මේ වතාවෙ ආධාර කරන්නට හිටිය ප්‍රධාන ආධාරකරුවන් තමයි, ඒ සුළු නගර සභාපතිගෙ පවුලෙ උදවිය. අර විධියට කටයුතු නොකළොත් එක්සත් ජාතික පක්ෂයෙන් ලබන වර අකුරැස්ස ආසනය තරඟ කරන කොට ආධාරකරුවන් ලබා ගන්නා ප්‍රධාන ආයුධයක් මොට වෙනව. ළමයින්ගෙ අධ්‍යාපනය ගඟට හේදී යන්නට ඉඩ හැර, දේශපාලන කටයුතු මඟින් තමන්ගෙ වස්තුව නැත්නම් ආදායම වැඩි කර ගැනීමට අද මෙසේ ලජ්ජා භය නැතිව ප්‍රසිද්ධියෙම වැඩ කරනව.

මට පසුගිය දවස්වල ජනසතු සේවා ඇමතිතුමා හමු වන්නට බැරි වුණා. එතුමාගෙ පාර්ලිමේන්තු ලේකම්තුමාට මා මේ කරුණ පුද්ගලික වශයෙන් මතක් කළා; ඒ ගැන කරුණු කියා දුන්න. පළාත් පාලන ඇමතිතුමාගෙ පාර්ලිමේන්තු ලේකම්තුමා තවම මෙරටින් බැහැරයි ඉන්නෙ. උන්නැහෙට මා මේ කරුණු විස්තර සහිතව කියා දුන්න. මෙය වැරදි ක්‍රියා මාර්ගයක් බව උන්නැහෙත් පිළිගත්ත. ජනසතු සේවා හා ක්‍රීඩා ඇමති තුමා ක්‍රීඩා දියුණු කිරීමට කොයි තරම් උනන්දු ගත්තත්—ළමයින්ට හික්මීම හා ශිෂ්ඨ ගතිගුණ පුහුණු කිරීමටත්, තරුණයන්ගෙ සංස්කෘතික වර්ධනයටත් ඉතාමත් වැදගත් දෙයක් තමයි, ක්‍රීඩා පුහුණුවට අවස්ථා ලබා දීම හා ඒ සඳහා විශේෂ ගුරුවරුන් පත් කිරීම—ළමයින්ගෙ අයිතිවාසිකම් පාවා දෙමින් එක්සත් ජාතික පක්ෂයෙ ප්‍රධාන උදවිය මෙසේ විළි ලජ්ජා නැතුව, නින්දිත පිළිවෙළට ඒ ප්‍රදේශයේ වැඩ කිරීම නිසා එතුමාගෙ උනන්දුවෙන් වැඩක් වන්නෙ නැහැ. මෙසේ මූලික ප්‍රතිපත්ති කඩා බිඳ දමමින් තමන්ගෙ පෞද්ගලික ලාභ ප්‍රයෝජනය සලකාගන කටයුතු කරන අයට විරුද්ධව කටයුතු කරන්නට ජනසතු සේවා හා ක්‍රීඩා ඇමතිතුමාට දක්ෂකමක් නැත්නම්, ඒ ගැන කොයි අන්දමේ විශ්වාසයක් තබන්නට පුළුවන්ද කියා මා තමුන්නාන්සේගෙන් ප්‍රශ්න කරන්නට කැමතියි.

පූ. භා. 11.14

**වෛද්‍යාචාර්ය එම්. එච්. සද්ධාසේන** (අම්බලන්ගොඩ)

*(வைத்திய கலாநிதி எம். எச். சத்தாசேன —அம்பலாங்கொடை)*

(Dr. M. H. Saddhasena—Ambalangoda)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අකුරැස්සෙ ගරු මන්ත්‍රීතුමාගෙ (වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ) කථාවෙන් පස්සෙ මට හිතුන, අම්බලන්ගොඩ ක්‍රීඩා පිටිය ගැන කථා කරන්ට. මම යම්කිසි පක්ෂයකට හෝ පුද්ගලයකුට හෝ විරුද්ධව කථා කරනවා නොවෙයි. මට පෙර අම්බලන්ගොඩ ආසනය නියෝජනය කළ ගරු මන්ත්‍රීතුමා කලුගල්ලෙ ඇමතිතුමාගෙ මාර්ගයෙන් වැඩ පිළිවෙළක් සකස් කර තිබුණා, ඇතැම් විට මුදල් නාස්ති වන විධියට. අම්බලන්ගොඩ ඉතා සුළු නගරයක්. ඒ නගරයේ පදිංචි කාර පවුල් 10ක්, 15ක් පිටමං කර ධර්මාශෝක විද්‍යාලය පිටිපස ඉඩම් රාශියක් ගෙන කුලරත්න ක්‍රීඩා පිටිය කියා ක්‍රීඩා පිටියක් සකස් කරන්න අදහස් කර තිබුණා. මේ වේලාවේ අධ්‍යාපන ඇමතිතුමත් සිටින නිසා මම ඉල්ලා සිටිනව, ඒ සැලැස්ම අත්හැර පාඨශාලා ගොඩනැගිලිවලට අවශ්‍ය ඒ සවි පොළව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පමණක් ගෙන රේල් පාරට එහා පැත්තෙන් ඇති පුරන් වූ වෙල් ඉඩම් අක්කර 6ක පමණ ප්‍රමාණය මේ කටයුත්තට ප්‍රයෝජනයට ගන්න ලෙස. පාඨශාලා කිපයකටත් මධ්‍යස්ථානයක් වන තැන කයි, ඒ ස්ථානය පිහිටා තිබෙන්නෙ. ක්‍රීඩා ඇමතිතුමාගේ නමින් පිහිටුවා තිබෙන සුගතදාස ක්‍රීඩාංගනය සාදා තිබෙන්නේ වගුරු බිමක් ගොඩ කරලයි. එහෙම නම් නගරයේ මධ්‍යස්ථානයක් ගොඩ කිරීමට අපහසුවක් නැහැ. හොඳ පොළොව අරගෙන ක්‍රීඩා පිට්ටනියක් හදනවාට වඩා හොඳයි, පාවිච්චියට නොගන්න අඩු මිලට ගන්න පුළුවන් ඉඩමක් ගෙන එය පුරවා ක්‍රීඩා භූමියක් ඇති කිරීම. මුළු නගරයේම මහජනයාට ප්‍රයෝජනවත් වන විධියට ඒ ස්ථානයේ ක්‍රීඩා පිට්ටනිය ලක්ෂණවත්, ලොකුවටත් හදන්න පුළුවන්. අධ්‍යාපන දෙපාර්තමේන්තුව ඒ ඒ පාඨශාලාවලට ක්‍රීඩා පිට්ටනි හැදීමට වියදම් කරන මුදල ඉතිරි කරල, ක්‍රීඩා අමාත්‍යාංශයෙනුත් මුදලක් යොදවා මෙවැනි ක්‍රීඩා පිට්ටනියක් ඇති කළොත් එයින් අධ්‍යාපනය ලබන ශිෂ්‍යයන්ටත්, ඒ වගේම මහජනයාටත් විශාල ප්‍රයෝජනයක් අත් වෙනව. මේ අදහස මම අධ්‍යාපන ඇමතිතුමාගේත්, එසේම ක්‍රීඩා ඇමතිතුමාගේත් අවධානයට යොමු කරනව.

පූ. භා. 11.17

**එච්. ජී. ඒ. කාරියවසම් මයා.** (බෙන්තර-ඇල්පිටිය)

*(திரு. எச். ஜீ. ஏ. காரியவசம்—பெந்தர-எல்பிற்றிய)*

(Mr. H. G. A. Kariyawasam—Bentara-Elpitiya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ යෝජනාව අනුව අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සිටින ශාරීරික අභ්‍යාස ගුරුවරුන් රාශියක් ක්‍රීඩා ඇමතිතුමාගේ දෙපාර්තමේන්තුවට ඇතුළත් වන බව අපට පෙනෙනව. ඒ උදවිය මෙතෙක් කල් පාඨශාලා පරීක්ෂකවරුන් යටතේ සේවය කරමින් පසු දිසාපතිවරුන් නැත්නම් ඈදායම් පාලක නිලධාරිවරුන් යටතේ සේවය කිරීමට පත් වන බවයි, අපට පෙනෙන්නෙ. මේ නිසා අපේ රටේ දරුවන්ගේ ශාරීරික අධ්‍යාපනයට විශාල පහරක් වදිනවාය කියා මට හිතෙනව. මට එසේ සිතෙන්නට හේතුව මේකයි. මේ අළුතෙන් පිහිටුවන්න යන දෙපාර්තමේන්තුවේ ශාරීරික අභ්‍යාස පිළිබඳ ගුරුවරුන්ට ඔවුන්ගේ කාලයෙන් වැඩියක් මිඩංගු කිරීමට සිදු වන්නේ ඒ පළාතේ වැඩිහිටි මහජනයාගේ ශාරීරික සෞඛ්‍ය තත්ත්වය පිළිබඳව කටයුතු කරන්නටය කියා මට හිතෙනව. අපේ රටේ විශේෂයෙන් පිටිසර පෙදෙස්වල යන්තම් හෝ ක්‍රීඩා පුහුණුවක් ලැබෙන්නේ පාඨශාලාවලින් පමණයි. ඒ දරුවන්ට නිතරම ශාරීරික අභ්‍යාස පිළිබඳව අවවාද උපදෙස් දෙන්න පුළුවන් නම් ඔවුන්ගේ ශාරීරික සෞඛ්‍ය තත්ත්වය බොහෝ දුරට නගා සිටුවීමට පුළුවන් වෙනව. මේ ගුරුවරුන් අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් වෙන් කිරීමෙන් කලකදී මේ අංශය පාඨශාලාවලින් සම්පූර්ණයෙන් වෙන් වෙන්නට ඉඩ තියෙනව. ක්‍රීඩා අමාත්‍යාංශයට ගන්න මේ ගුරුවරුන් වෙනුවට අධ්‍යාපන ඇමතිතුමා අළුත් ගුරුවරුන් පත් කරනවද, එසේ නැත්නම් මේ ගුරුවරුන් සඳහා වෙනම දෙපාර්තමේන්තුවක් ඇති කර ඒ දෙපාර්තමේන්තුව මගින් මේ ගුරුවරුන් ඒ ඒ පාඨශාලාවලට යවා උපදෙස් දෙන්නට සලස්වනවාද කියා දැන ගන්නට කැමතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක විශාල ගැටළුවක්. මේ රටේ යන්තම් දණගාන තත්ත්වයට හෝ ක්‍රීඩා දියුණු වී තිබෙන්නේ පාඨශාලා නිසයි. මේ රටේ ශාරීරික සංවර්ධනය පිළිබඳ කටයුතු කරගෙන ආවේ පාඨශාලා මගිනුයි. සෞඛ්‍ය දෙපාර්තමේන්තුවක් තිබුණත් මහජනයාගේ ශාරීරික සෞඛ්‍ය තත්ත්වය වර්ධනය කිරීම සඳහා සේවයක් සැලසුනේ අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින්—පාඨශාලා මගින්. රෝග සුව කිරීමට වඩා රෝග වළක්වා ගැනීම පිළිබඳ කරුණු අවබෝධ කර දුන්නේ පාඨශාලා මගිනුයි. ඉතින් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මේ උදවිය පත් කර ගැනීම නුවණට හුරු යයි මා නම් හිතන්නේ නැහැ. උපදේශකයන් ගන්නවා නම් ලංකාවේ හෝ පිට රටක හෝ පුහුණුවක් ලැබූ අය ගත යුතුයි.

ක්‍රීඩා ඇමතිතුමාට මතක් කළ යුතු තවත් කාරණයක් තිබෙනවා. දැන් ක්‍රිකට් ක්‍රීඩාව වසංගතයක් වගේ බෝ වෙලා. මේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කාරියවසම් මයා.]

රටේ මුදල් පිටරට ඇදී යන විධියට හැම පාඨශාලාවකම වගේ ක්‍රිකට් ක්‍රීඩාව ලෙඩක් වගේ බෝ වෙලා. විදේශයන්ගෙන් ලැබෙන හැම දෙයක්ම දේවත්වයෙන් සලකා භාර ගන්නා සමහරුන් ඒ භාර ගන්නා දේ හැම තැනම ගෙන යන්නට උත්සාහ කරනවා. ලංකාව වගේ උෂ්ණ කලාපීය රටකට ක්‍රිකට් ක්‍රීඩාව ඒ තරම් හොඳ යයි මා නම් හිතන්නේ නැහැ. ක්‍රිකට් ක්‍රීඩාව නිසා මේ රටේ කම්මැලියන් බෝ වන්නට පුළුවනි. එසේ හෙයින් ආදි කාලයේ අපේ රටේ තිබුණු ජාතික ක්‍රීඩා සොයා නැවත ඒවාට පණ දෙන්නට ක්‍රියා කරන ලෙස මා ක්‍රීඩා ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ගුස්ති ඇල්ලීම්, සරඹ ක්‍රීඩා වැනි මේ රටට ආවේණික වූ පැරණි ක්‍රීඩා ගැන දන්නා අය තවම මේ රටේ පිටිසර ගම්වල සිටිනවා. ඒ උදවිය ඉදිරියට ගෙන පෙළගස්වා නැවත මෙම ක්‍රීඩා දියුණු කරන්නට ඕනෑ. කඩු සරඹ, පොලු හරඹ ආදියට නැවත පණ දෙන්නට ඕනෑ. ජාතියේ දරුවන් වීරයන් කිරීමට, ඔවුන් අලින්ට නොදෙවෙනි ශක්තියක් ඇති පුද්ගලයන් බවට පත් කිරීමට, විශාල ගල් උස්සන්ට තරම් ශක්තිය ඇති පුද්ගලයන් කිරීමට මහා වැව් බැඳීමට තරම් ශක්තිය ඇති පුද්ගලයන් කිරීමට හැකියාවක් ඇති ක්‍රීඩා මේ රටේ තිබුණ. නැවත වරක් ඒ ක්‍රීඩා සොයා බලා ඒවාට නව පණක් දීමේ ශක්තිය මේ ක්‍රීඩා ඇමතිතුමාට ඇති වේවා! අපේ අතීතයේ වූ සෞභාග්‍යය නැවත ඇති කිරීම පිණිස, ජාතික සංවර්ධනයක් ඇති කිරීම පිණිස ඔබ ගෙන යන මේ ක්‍රියා මාර්ගය සාර්ථක වීමේ කටයුත්ත සඳහා කොළොන්නාවේ හරු මන්ත්‍රීතුමා (ටී. බී. ඉලංගරත්න මයා.) කීවාක් මෙන් පක්ෂයක් ගෙන වැඩ කිරීමෙන් හෝ තැනින් තැන ක්ලබ් සාදා ඒවාට ආධාර දෙමින් වොලිබෝල් කණ්ඩායමක් ඉදිරිපත් කරන්නට යයි කීමෙන් හෝ ඒ තරම් යහපතක් නොවන බව සලකා ජාතික ක්‍රීඩා දියුණු කිරීමට ක්‍රියා කළ යුතුයි. අර විධියට වැඩ කර නම් ක්‍රීඩා දියුණු කරන්නට හම්බ වන්නේ නැහැ. පිටිසර බද හැම ප්‍රදේශයකම ක්‍රීඩා පිටිවනි ඇති කරන්නට ඕනෑ. ගම් තුන හතරකටවත් එකක් බැගින් වැටෙන්නට හෝ ක්‍රීඩා පිටිවනි ඇති කර මෙම ව්‍යාපාරය ගෙන යන්නට පුළුවන් නම් හොඳ බව මා ප්‍රකාශ කරනවා.

පූ. භා. 11.23

**නීල් ද අල්විස් මයා.** (බද්දේගම)
*(திரு. நீல் டி அல்விஸ்—பத்தேகம)*
(Mr. Neal de Alwis—Baddegama)

The Hon. Minister has asked for funds to pay a number of Education Department Physical Training Instructors who have been transferred to the Ministry of Nationalized Services.

During the course of this Debate various hon. Members have put forward various views. A number of views put forward are useful and should receive the most careful consideration of the Hon. Minister. We know that the Hon. Minister has a great desire to extend the sports activities of this Island. He is a very sporty man and I think the correct person has been appointed to be in charge of sports.

I must also mention that I have discussed this matter with the Hon. Minister on various occasions and he has shown a great desire to establish sports grounds in practically every electorate. Sometimes there are difficulties in getting the extents of land because you want level land and it is rather expensive to level land in certain electorates. Where I am concerned, he readily responded and provided the necessary funds to improve an existing V. C. ground so that it will be a full-sized playground.

But in the course of this Debate the hon. Member for Akuressa (Dr. S. A. Wickremasinghe) pointed out that there was a bus stand, that there was provision for a sports ground and that there was a tussle between the V. C. or the T. C. and the C. T. B. officials where the hon. Member intervened on behalf of the children who were going to be benefited.

In these matters I would earnestly request the Hon. Minister—he is giving priority to bus stands—to give

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

priority to school-going children's playgrounds. Playgrounds are very necessary. The Hon. Minister is very earnest about this job. He is anxious to have more playgrounds. But when a position like this arises I would request him not to allow his officials to have their own way if he is to make the playground movement a success. He has a policy which he is anxious to pursue. He wants more playgrounds and instructors. Probably we will have to provide for instructors to get their training here in Ceylon and not send them out. If you are going to expand that department in that way, I would earnestly request the Hon. Minister to consider whether playgrounds are going to get priority or bus stands are going to get priority. Unfortunately these officials put their fingers and mar whatever you have in mind. You have good intentions ; you want more playgrounds ; you want to provide the people of this country with more playgrounds. Then let the Hon. Minister direct his officials to pursue his policy and to give priority in these matters, and let us have the necessary playgrounds.

I do not think hon. Members of this House will ever hesitate to provide the necessary funds, the necessary instructors and the necessary training for instructors in this Island. We certainly will co-operate, but let not the officials interfere and mar the policy that you have in mind.

பி. ப. 11.27

**டී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ක්‍රීඩා ඇමතිතුමා විසින් ඉදිරිපත් කර තිබෙන මෙම අතුරු වැය ශීර්ෂයෙන්, පාඨශාලාවල සිටින ක්‍රීඩා උපදේශකයින් එතුමාගේ අමාත්‍යාංශය යටතට ගැනීමට මේ ගරු සභාවේ අවසරය ඉල්ලා සිටින බවයි පෙනී යන්නෙ. අපි මේ අවස්ථාවෙදි රජයට කියන්ට ඕනෑ, අටුව කඩා පුටුව හදන්ට ලැහැස්ති වන්ට එපා කියල. අටුව පුටුවට වැඩිය බොහොම වැදගත්. පාසල් ශිෂ්‍ය යන්ට ක්‍රීඩා ඉගැන්වීම ක්‍රීඩා ඇමතිතුමාගේ

සෙල්ලමට වැඩිය බොහොම උසස් දෙයක් යයි මා හිතනවා. අපි එතුමාගෙන් බලා පොරොත්තු වුණේ, මේ රටේ පැරණි ජාතික ක්‍රීඩා පමණක් නොව අනිකුත් ක්‍රීඩාත්—විදේශීය ක්‍රීඩා දියුණු කිරීම ගැන අපේ විරුද්ධත්වයක් නැහැ—මොකක් හෝ සැලැස්මක් අනුව දියුණු කිරීමයි. එතුමා දැන් උත්සාහ කරන්නෙ පාසල්වල ක්‍රමානුකූලව දියුණුවෙමින් තිබුණු ක්‍රීඩා අංශය එතුමාගේ අමාත්‍යාංශයට ඇතුළු කර ගැනීමටයි. එසින් සිදු වෙන්නෙ අපේ ළමයින්ට ක්‍රීඩා පිළිබඳව විශේෂ පුහුණුවක් නොලැබීමයි. මේ රටේ පුහුණුවුණු ක්‍රීඩා උපදේශකයින් සිටින්නෙ බොහොම ටික දෙනයි. ලංකාවේ තිබෙන සාමාන්‍ය පාඨශාලාවලට පමණක් නොව, හැම මහා විද්‍යාලයකටමවත් එක ක්‍රීඩා උපදේශකයකු බැගින් පත් කරන්න අවශ්‍ය තරම් උපදේශකයින් සංඛ්‍යාවක් මේ රටේ නැහැ කියන කාරණයට ගරු අධ්‍යාපන ඇමතිතුමාත් එකඟ වෙනව ඇති. සිටින්නෙ බොහොම සුළු සංඛ්‍යාවක්. ඒ සුළු සංඛ්‍යාව අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් අරගෙන වෙනත් දෙපාර්තමේන්තුවක් යටතේ තබා ගැනීමෙන් සිදු වෙන්නෙ මෙතෙක් සාමාන්‍යයෙන් හෝ පාසල්වල යම් ක්‍රීඩා ශක්තියක් තිබුණ නම්, ක්‍රීඩා කෞශල්‍යයක් තිබුණ නම්, ළමයින් තුළ යම් ක්‍රීඩා පුහුණුවක් ඇති වුණා නම්, ඒ තත්ත්වය සම්පූර්ණයෙන්ම නැත්තටම නැතිවීමයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාසල්වල ක්‍රමවත්ව ක්‍රීඩා පුහුණුවක් ළමයින්ට ලබා දුන්න බව තමුන්නාන්සේ දන්නවා. ඒ කියන්නෙ, යම්කිසි එක් ක්‍රීඩාවක යෙදීමෙන් ශාරීරික වර්ධනයක් ඇති වෙන්නෙ සමහරවිට ශරීරයේ යම් යම් අංගවල පමණයි. එහෙත් සම්පූර්ණ ශරීරයම වැඩෙන අන්දමට ක්‍රමානුකූලව සකස් කරන ලද ක්‍රීඩා පිළිවෙළක් පාසල්වල තිබෙනවා. නිදර්ශනයක් වශයෙන් කියනවා නම්, ගොවිතැන් කරන කෙනෙකුගේ සම්පූර්ණ ශරීර වර්ධනයක් ඇති වෙන්නෙ නැහැ ; සමහර කොටස් විතරයි වර්ධනය වෙන්නෙ. එහෙත් ක්‍රමානුකූලව සකස් කරන ලද ක්‍රීඩා මාලාවකින් ළමයකුගේ අඟ සම්පූර්ණ වැඩීමක් ඇති කරනවා. අංග සම්පූර්ණ වැඩීමක් ඇති ළමයකුගෙන් උසස් මානසික තත්ත්වයක් අපි බලාපොරොත්තු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඊ. බී. එම්. හේරත් මයා.]

වෙනව. මේ අනුව සිදු වෙන්නෙ පුහුණුව ලැබූ දක්ෂ ක්‍රීඩා උපදේශකයන් ටික පාසල්වලින් ඉවත් වුණාට පස්සෙ මේ රටේ ළමයින්ගෙන් කොටසකට හෝ ලැබුණු ඒ ක්‍රමානුකූල ශාරීරික අභ්‍යාසය නැත්තටම නැතිවීමයි. ඒකට කමක් නැහැ; උසස් දෙයක් සිදු වෙනව නම්. එහෙත් ඊට වඩා උසස් දෙයක් සිදු වන බවක් අපට පෙනෙන්ට නැහැ. අර අධිරාජ්‍යවාදීන්ගෙන් ඉතුරු වුණු, පාපන්දු, වොලිබෝල්, ක්‍රිකට්, රගර් වැනි ඒ පැරණි නටබුන් ටික තවත් ආරක්ෂා කිරීමට ක්‍රීඩා ඇමතිතුමා ක්‍රියා කරගෙන යන බවයි, අපට පෙනෙන්නෙ.

ඇමතිතුමාගේ ක්‍රීඩා ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම කොළඹට සීමා වෙලයි, තිබෙන්නෙ. අං ඇදීම කියන ක්‍රීඩා ඇමතිතුමා දන්නවාදැයි මා දන්නෙ නැහැ. උඩුපිල-යටිපිල බෙදිල අං ඇදීම අපේ ශ්‍රේෂ්ඨ ජාතික ක්‍රීඩාවක්. ඒකත් දැන් කතිරය ගැසීමට සම්බන්ධ වෙලයි තිබෙන්නෙ. අං ඇදීම ඉතා වැදගත් ක්‍රීඩාවක්. සමහර විට තමුන්නාන්සේලා දේශපාලන අවශ්‍යතා උඩ දැදුරුඔය පළාතෙ එහෙම පොර පොල් ගහනව. අපි කියන්නෙ ඒව වාසියට හරවා ගන්න නොවෙයි. මේ රටේ හොඳ ජාතික ක්‍රීඩා රාශියක් තිබෙනව. ඒවාට තැනක් දෙන්ට ඕනෑ. ඒ ජාතික ක්‍රීඩා සාමාන්‍ය යෙන් හෝ පවත්වාගෙන ආව ප්‍රජාමණ්ඩල ටික තමුන්නාන්සේලා මේ ඊයෙ-පෙරේදා වහල දැම්ම, ප්‍රජා මණ්ඩල ටික දැන් ග්‍රාම සංවර්ධන අංශයට භාර දී තිබෙනව. යම් ජාතික ක්‍රීඩාවක් ගම්බදව කළා නම් කලේ ප්‍රජා මණ්ඩල විතරයි. ඒකත් තමුන්නාන්සෙලා වහල දැම්ම.

ක්‍රීඩා ඇමතිතුමෙක් පත් කරල එතුමාට ක්‍රීඩා දියුණු කිරීම භාර දී තිබෙනව. උන් නැහේ කරන හොඳ වැඩ නරක යයි අපි කියන්නෙ නැහැ. බෙල්ජියමේ වගේ "ස්ටේඩියම්" ආදිය හදල ඒවට උන්නැහේගෙ නම යොදා ගත්තට අපි විරුද්ධ නැහැ. අපි ඒකට ඊර්ෂ්‍යා කරන්නෙ නැහැ. අපි කියන්නෙ තමුන්නාන්සේගේ ව්‍යාපාර කොළඹට විතරක් සීමාවෙලා බැහැ කියන එකයි. එමෙන්ම තමුන්නාන්සේගේ ව්‍යාපාරය පිටරට ක්‍රීඩා තරඟවලට මේ රටෙන් ක්‍රීඩා කණ්ඩායම් යැවීමේ කටයුත්තට විතරක් සීමාවෙලා බැහැ. මේ රටේ මහජනයාට පළල් වශයෙන් ප්‍රයෝජන ගැනීමට හැකිවන විධියට ක්‍රීඩා අංශය සකස් වන්ට ඕනෑ. තමුන්නාන්සේගේ සැලැස්ම මොකක්ද? අපෙන් මෙවැනි මුදලක් ඉල්ලා සිටින විට "මෙන්න ක්‍රීඩා අමාත්‍යාංශය මගින් මේ රටේ ක්‍රීඩා දියුණු කිරීම සඳහා ඇති කළ සැලැස්ම" යයි යම් කිසි සැලැස්මක් ඉදිරිපත් කිරීමට ගරු ඇමතිතුමාට යුතුකමක් තිබෙනව. "විදේශීය ක්‍රීඩාවලට මේ විධියේ තත්ත්වයක් දෙනව, ස්වදේශීය හෙවත් මේ රටේ ජාතික ක්‍රීඩාවලට මේ විධියේ තත්ත්වයක් දෙනව. ජාතික නැටුම් කියන්නෙ මේ රටේ එක්තරා ක්‍රීඩා විශේෂයක්. ජාතික නැටුම් වලට මේ විධියේ තත්ත්වයක් දෙනව" ආදි කරුණු ඇතුළත් සැලැස්මක් ගරු ඇමතිතුමාට ඉදිරිපත් කරන්ට යුතුකමක් තිබෙනව. එතුමා ඒවා ගැන නොදන්නවා නම් ඒ පිළිබඳව දැනුම් ඇති විශේෂඥයන්ගෙන් උපදෙස් ලබා ගන්න ඕනෑ. නොයෙකුත් ක්‍රීඩා පිළිබඳ විශේෂඥයන් මේ රටේ ඉන්නව. ඒ උදවියගෙන් හෝ උපදෙස් ලබාගෙන විශේෂ කමිටුවක් පත් කරල හෝ මේක කළ යුතුව තිබෙනව. තමුන්නාන්සේලා හැම දේකටම කොමිටි පත් කරනවනෙ. මෙවැනි වැදගත් දෙයක් සඳහා සැලැස්ම හදන්නට කමිටුවක් පත් කරන්නට බැරි ඇයි? මෙය ටිකක් අමාරු ප්‍රශ්නයක් බව අපි දන්නව. පැරණි ආවේණික ක්‍රීඩා හිමිකරුවන් ඒවා තමන්ගේ පෞද්ගලික දේවල් හැටියට අයිතිකර ගෙන සිටිනව. උඩරට නැටුම්, පහත රට නැටුම්, සබරගමු නැටුම් ආදී ක්‍රීඩා යම් යම් කොටස් වැරදි විධියට අයිතිකරගෙන පෞද්ගලික දේවල් හැටියට පාවිච්චි කරන නිසා ඒවායේ දියුණුව ඇණහිට තිබෙනව. ඒවා දියුණු කිරීම මේ ඇමතිතුමා සතු යුතුකමක්. යම් යම් අය තමන්ගේ පෞද්ගලික වාසියට යම් යම් ජාතික ක්‍රීඩා යට පත් කරගෙන සිටීමෙන් ඒවා නැත්තටම නැති වී යන්නට පුළුවන්. සමහරවිට ඒ වෙනුවට සුගතදාස ක්‍රීඩා කියා වර්ගයක් ඇති වන්න පුළුවන්.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
**(The Hon. Wanninayake)**

ඒවත් ජාතිකනෙ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ටී. බී. එම්. හේරත් මයා.**

*(திரு. ரி. பி. எம். ஹேரத்)*

(Mr. T. B. M. Herath)



ඒවා මොන ජාතියේද කියා විස්තර කරන්න අපට අමාරුයි. ක්‍රීඩා පිළිබඳව අමාත්‍යාංශයක් ඇති කිරීමෙන් පමණක් මේ ප්‍රශ්නය විසඳෙන්නේ නැහැ. ඒ නිසා කරුණාකර කමිටුවක් පත් කර මේ රටේ තිබෙන සුදුසු ජාතික ක්‍රීඩා මෙන්න මේවාය, විදේශීය ක්‍රීඩා මේවාය, මෙන්න මේ සැලැස්ම යටතේ මේ මේ විධියට ක්‍රීඩා සකස් කරගෙන යනවාය, කියා කියන්නට සැලැස්මක් ඇත්තෙ නැහැ.

අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ක්‍රමානුකූලව ළමයින් පුහුණු කරන ශාරීරික අභ්‍යාස උපදේශකයින් පිරිසක් සිටිය. ඒ අයත් මේ ඇමතිතුමා ගන්නව. තව ටික දවසක් ගිය විට පාසැල්වල සිටින ළමයි ටිකත් ඉල්ලාවි. ළමයි නැති අයට ළමයි ලැබිච්චාවෙ. ඒකට කමක් නැහැ. ඇමතිතුමා මැතිවරණවලදි කියා තිබෙනව "මම සෙල්ලම් ඇමති; සෙල්ලම් පෙන්වන්නම්" කියල. අපිත් බලාගෙන සිටිනව. නමුත් පෙන්වල නැහැ. ඉදිරියේදීවත් පෙන්වා විය කියා අපි බලාපොරොත්තු වෙනව. එහෙත් එසේ පෙන්වන්නේ කොයි ආකාරයටද කියා ගරු ඇමතිතුමා සැලැස්මක් හදන්න ඕනෑ. පාඨශාලාවල ශාරීරික අධ්‍යාපන කටයුතුවල යෙදී සිටි ගුරුවරුන් නැත්නම් උපදේශකයින් ටික අරගෙන ළමයින් අතරමං කරන්නට තමුන්නාන්සේ සැරසෙනවා නම් අපි එයට විරුද්ධත්වය ප්‍රකාශ කරනව. වැඩිහිටියන්ටත් ක්‍රීඩා නැහැ; ළමයින්ට තිබුණ ක්‍රීඩාවත් නැහැ. ඒ නිසා ගරු ඇමතිතුමා මේ ක්‍රීඩා අංශය සකස් කර ජාතික ක්‍රීඩාවලටත් අනිකුත් ක්‍රීඩාවලටත් නැනක් ලැබෙන අන්දමට කටයුතු කරන්න. ගම්බද ක්‍රීඩා පිළිබඳ තත්ත්වය දැන් සම්පූර්ණයෙන්ම පරිහානියට වැටී තිබෙනව. ටිකක්වත් ක්‍රීඩාව තිබුණේ පාඨශාලාවලයි. ගම්බද ක්‍රීඩාව රැක ගෙන සිටියේ පාඨශාලායි. එයත් දැන් නැති වෙනව. හෙට අනිද්දා ගරු අධ්‍යාපන ඇමතිතුමාට කියාවි පාඨශාලාවල නැටුම් උගන්වන ගුරුවරු ටිකත් දෙන්නය කියල. අන්තිමේ දී සිදු වන්නේ පාඨශාලාවල තිබුණු ජාතික ක්‍රීඩා ටිකත්, නැටුම් ටිකත් නැතිවීමයි. අන්තිමට පාසැල්වල ඉතිරිවන්නෙ බයිලා පමණයි. එංගලන්තයේ ක්‍රමයට බයිලා නැටුම් බදාගෙන නැටුම් පමණක් මේ රටේ ඉතිරි වේවි. සංස්කෘතික වශයෙන් ගරු ඇමතිතුමාට වෙනස් වන්නට කියන්නෙ නැහැ. ගරු ඇමතිතුමාට එය බැරි නම් සංස්කෘතික වශයෙන් කමිටුවක් පත් කර සැලැස්මක් හදා මේ රටේ හැම නැනකටම ක්‍රීඩා බෙදී යන ආකාරයට කටයුතු කරන්න ඕනෑ. මේවා ගැන පසුගිය රාජාසන කථා විවාදයේදීත් අපි කිව්වා. ක්‍රීඩා අමාත්‍යාංශයක් තිබෙනවාය කියලවත් පිටිසර අය දන්නෙ නැහැ. හිසේ රදයට කොට්ටය මාරු කරනවා වගේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සිටි ගුරුවරු ටික මේ ඇමතිතුමා ගන්නව. "වොලි බෝල්" ආදිය ගෙන්වීමත් වෙළඳුන්ට දෙන්න බැරිය කියල තමුන්නාන්සෙ එය සමාගමකට බාර දෙනව. ඔක්කොම පැලැස්තර. මොකක්ද තමුන්නාන්සෙගෙ සැලැස්ම? මේ කටයුත්ත යම්කිසි වැඩ පිළිවෙළක් නැත්නම් සැලැස්මක් ඇතිව කරන්නය කියා මා කියනව. එසේ බැරි නම් ඒ අයටවත් කරන්නට මෙය අතහැර දමන්න. එක ආසනයකට එක බැගින්වත් ගම්බද ප්‍රදේශවලත් ක්‍රීඩා මධ්‍යස්ථාන ඇති කරන්න. තමුන්නාන්සෙ බලා පොරොත්තු වන වොලිබෝල්, රගර් ආදි ඕනෑම ජාතියක් පුහුණු කරන්න. ඒ සමගම මේ රටේ ජාතික ක්‍රීඩා උගැන්වීමත් ආරම්භ කරන්න. මේ රටේ වැදගත් සංස්කෘතික අංගයක් වන කලාව දියුණු කිරීමට රජයේ කලායතන වැනි ස්ථාන තිබෙනව. ක්‍රීඩා ඇමතිතුමා කළ යුත්තෙත් එවැනිම සංස්කෘතික අංගයක් දියුණු කිරීමයි. එම නිසා අපේ ජාතික ක්‍රීඩා, ජාතියේ ප්‍රයෝජනය සඳහා යොදන්නට පුළුවන් වන විධියේ වැඩ පිළිවෙලක් සකස් කරන්න. එහෙම නැත්නම් තියෙන ක්‍රීඩා ටිකත් විනාශ නොකර නිකම් ඉන්න. මේ තත්ත්වය අනුව සිදුවන්නෙ තියෙන ක්‍රීඩා ටිකත් විනාශ වී යාමයි. පාඨශාලාවල පුහුණු කරවන ක්‍රීඩාවලට මෙයින් හානියක් සිදු වෙනව. පාසල්වල සිටින ක්‍රීඩා උපදේශකයින් නොගත්තට වොලිබෝල් රගර් වැනි ක්‍රීඩා සඳහා ඕනෑ තරම් උපදේශකයින් සොයා ගන්න පුළුවනි. මෙයින් සිදුවන්නෙ, ක්‍රමානුකූල ශාරීරික අධ්‍යාපනයක් ලබා සිටින පාසල් ළමයින් ලක්ෂ ගණනකට පහර වැදීමයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. එම්. හේරත් මයා.]

අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ සිටින ලක්ෂ ගණනක් ළමයින්ගේ ශාරීරික අධ්‍යාපනයට මේ විධියට පහර ගහද්දී ගරු අධ්‍යාපන ඇමතිතුමා බලා ඉන්නෙ මන්දැයි මම අහනවා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
**(The Hon. Iriyagolle)**

වෙලාවට වැඩේ කරල ඇති.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
**(Mr. T. B. M. Herath)**

ඒ අත්දැකීම තිබෙන්නෙ තමුන්නාන්සෙට තමයි. මට නම් වෙලාව ගැන වැඩි අත්දැකීමක් නැහැ. වෙලාව එනතුරු තමුන්නාන්සෙ බලා ඉන්න කොට මේ වැඩේ කෙරිල ඉවර වෙනවා. වෙලාව කවද ඒවිදැයි මම දන්නෙ නෑ. මේ ඉල්ලා තිබෙන ටික ක්‍රීඩා ඇමතිතුමාට දෙන්න. කමක් නැහැ. එතුමාට නැති නිසානෙ ඉල්ලා තිබෙන්නෙ. එහෙත්, පාඨශාලාවල ශාරීරික අධ්‍යාපනය බාර ගුරුවරුන්ගෙ සම්පූර්ණ තත්ත්වය ශිෂ්‍යයින්ට පාඩුවක් නොවන හැටියට සකස් කිරීම ගැන වග බලා ගන්නා ලෙස අධ්‍යාපන අමාත්‍යාංශයෙන් මම ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා. ඉතාමත් ක්‍රමානුකූලව සංවිධානය වූ ශාරීරික අධ්‍යාපන සැලැස්මක් අද අපේ පාසල්වල තිබෙනවා. අවුරුදු ගණනක් තිස්සේ සකස් වී හැඩ ගැසී තිබෙන ඒ සැලැස්මට මෙයින් පාඩුවක් සිදුවන්නට ඉඩ දෙන්න එපායැයි අධ්‍යාපන ඇමතිතුමාගෙන් මා නැවත වරක් ඉල්ලා සිටින අතරම ක්‍රීඩා ඇමතිතුමාගෙනුත් එක් ඉල්ලීමක් කරනවා. තමුන්නාන්සෙගෙ ඔය ක්‍රිකට් ආදී එංගලන්ත ක්‍රීඩා කොළඹට පමණක් සීමා නොකර, මා කලිනුත් කීවාක් මෙන් ජාතික ක්‍රීඩා දියුණු කරන ගමන්ම, සෑම ආසනයකටම ක්‍රීඩා අමාත්‍යාංශයෙන් ප්‍රයෝජනයක් ලැබෙන ආකාරයට ක්‍රමානුකූල සැලැස්මක් ඇති කරන්න. තමුන්නාන්සෙට දැනෙන්නෙ නැත්නම් ක්‍රීඩකයින් ලවාවත් එවැනි සැලැස්මක් පුළුවන් තරම් ඉක්මණින් සකස් කරන ලෙස ඉල්ලා සිටිමින් මගේ වචන සවලය මෙයින් අවසාන කරනවා.

පූ. භා. 11.40

**ජී. බී. විජයසුන්දර මයා.** (කිරිඇල්ල)
*(திரு. பீ. பி. விஜயசுந்தர—கிரியல்ல)*
**(Mr. P. B. Wijesundara—Kiriella)**

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වැය ශීර්ෂය සම්බන්ධයෙන් කථා කරන්න මටත් අවස්ථාවක් ලබා දීම ගැන මා තමුන්නාන්සේට ස්තුති වන්ත වෙනවා. මෙවැනි වැය ශීර්ෂයක් සාකච්ඡා කරන මේ අවස්ථාවෙ ගරු ඉඩම් ඇමතිතුමා මෙහි නොසිටීම ගැන මම කනගාටු වෙනවා. අධ්‍යාපන අමාත්‍යාංශයටත් ජනසතු සේවා අමාත්‍යාංශයටත් ක්‍රීඩා භූමි ඇති කිරීම සම්බන්ධයෙන් අවහිර වී තිබෙන්නෙ ඉඩම් අමාත්‍යාංශය බව අප හොඳාකාර දන්නවා. යම් ජන්ද කොට්ඨාශයක ක්‍රීඩා භූමියක් පිහිටුවන්නට ගිය බොහෝ අවස්ථාවල ඉඩම් අමාත්‍යාංශයෙන් ඊට අවහිර ඇති වුණු බව අප දන්නවා.

මෙවැනි ප්‍රශ්නයක් සාකච්ඡා කරන විට, ලෝකයෙ මනුෂ්‍ය ජීවිතය ගැනත් සත්වයාගේ ආරම්භය ගැනත් වැදගත් මත පළ කළ චාල්ස් ඩාවින්ගේ කියුම් සිහිපත් කරන්නට අපට සිදුවී තිබෙනවා. සත්වයා ඇති වී නොයෙක් විධියට වෙනස් වෙමින් ගොස් මනුෂ්‍යයා බිහි වුණු හැටිත් මධ්‍යම ආසියාවේහි ඇති වුණු මනුෂ්‍ය සන්තතිය ලෝකයෙ නොයෙක් ප්‍රදේශවල විසිර ගිය හැටිත් අප අසා තිබෙනවා. මධ්‍යම ආසියාවෙහි ඇති වුණු මිනිසුන් අතර පැවැති නොයෙක් විධියේ ක්‍රීඩාවලින් පැවතීගෙන එන නොයෙකුත් ක්‍රීඩා අදත් තිබෙන බව අප දන්නවා. ක්‍රිකට්, බාස්කට් බෝල්, එල්ලෙ ආදී ක්‍රීඩාත් එදා මධ්‍යම ආසියාවෙහි බිහිවුණු ක්‍රීඩාවලින් පැවැත එන ඒවා හැටියට සලකන්න පුළුවනි. ඊයෙ නීති කොමිසන් සභාව පිළිබඳ පනත ගැන විවාද යෙදී, උසාවිවල කටයුතු ආරම්භ කරන වෙලාව ගැන හබරාදූවේ ගරු මන්ත්‍රීතුමා (ප්‍රින්ස් ගුණසේකර මයා.) කීවාක් මෙන්, අපේ රටේ ක්‍රිකට් ආදී ක්‍රීඩා පටන් ගැනීමේ වෙලාවෙත් වරදක් තිබෙනවා. එංගලන්තයෙ සිරිතට අනුව මෙහෙත් දවල් 12 ට ක්‍රිකට් ගැහීම පටන් ගන්නවා. එහෙත්, ලංකාවෙ දේශගුණය අනුව එය උදේ 9 ට පමණ පටන් ගන්නව නම් සුදුසුයි. එවැනි වෙනස්කම් ඇති කළ යුතු බව මා විශේෂයෙන්ම සඳහන් කරනවා.

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

ක්‍රීඩා සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයටත් ජනසතු සේවා අමාත්‍යාංශයටත් බාධා සිදු වන්නෙ ඉඩම් අමාත්‍යාංශයෙන් බව මගේ ඡන්දදායක කොට්ඨාශයෙන් මට ලැබුණු අත්දැකීම් අනුව කියන්නට පුළුවනි. ඒ මන්ද? මගේ ඡන්ද කොට්ඨාශයෙ තිබෙනව තලාවිටිය විද්‍යාලය. තලාවිටිය විද්‍යාලය ඒ ඡන්ද කොට්ඨාශයෙ තිබෙන විද්‍යාල අතරින් පමණක් නොවෙයි, සිංහල මාධ්‍යයෙන් උගන්වන සබරගමු දිස්ත්‍රික්කයේම තිබෙන විද්‍යාල අතරින් හැමදාම, දැන් අවුරුදු දහයක පමණ කාලයක් තිස්සේ හැම සංවත්සරයකදීම ක්‍රීඩා තරඟවලින් පළමුවැනි අංකය ගන්නව. නමුත් ඒ තලාවිටිය විද්‍යාලයට තවම ක්‍රීඩා භූමියක් ලබා ගන්ට බැරිවී තිබෙනව. ඒ විද්‍යාලයට යාබදව කණාටු වූ ප්‍රයෝජනයට ගත නොහැකි රබර් ඉඩමක් තිබෙනව. බේරුවල මහත්මයෙකුටයි ඒ ඉඩම අයිති. දැන් අවුරුදු දහයක් තිස්සෙ හැම අවස්ථාවකදීම මේ ඉඩම ක්‍රීඩා භූමියක් තැනීම සඳහා පවරා ගන්න යන විට ඒ මහත්මය කොහොම හරි ඉඩම බේරා ගන්නව. ඒ මහත්මය ඉඩම බේරා ගන්නා විධි ගැන මා මේ අවස්ථාවේදී යමක් කියන්ට අදහස් කරන්නෙ නැහැ. ඒ මහත්මය ඉඩම බේර ගන්නෙ කොහොමද කියා ගරු ඉඩම් ඇමතිතුමාත්, ගරු අධ්‍යාපන ඇමතිතුමාත් ගරු ජනසතු සේවා ඇමතිතුමාත් දන්නව ඇති. ක්‍රීඩා භූමියක් නැතිකම තලාවිටියෙ විද්‍යාලයෙ ශිෂ්‍යයින්ට ලොකු අඩුපාඩුවක්. හැම සංවත්සරයකදීම මුළු දිස්ත්‍රික්කයේම පාඨශාලා අතරින් මුල් ස්ථානයට එන තලාවිටිය විද්‍යාලයෙ ශිෂ්‍යයින්ට ක්‍රීඩා පුහුණුවෙන්න තියෙන්නෙ අක්කර අරික්කාලයක් පමණ වූ සුලු ස්ථානයකයි. මේ විද්‍යාලයෙ ශිෂ්‍යයින් තාර පාරෙ දුවල පුහුණු වෙලා තමයි හැම අවුරුද්දෙම ක්‍රීඩා තරඟවලදී පළමුවැනි ස්ථානයට එන්නෙ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ සමගම මම ඇහැලියගොඩ මහා විද්‍යාලය ගැනත් සඳහන් කරන්නට සතුටුයි. සබරගමු පළාතෙ දක්ෂම ක්‍රිකට් කණ්ඩායම ඉන්නෙ ඇහැලියගොඩ මහා විද්‍යාලයෙ තමයි. දැන් අවුරුදු දහයක් තිස්සෙ හැම තරඟයකින්ම ඇහැලියගොඩ මහා විද්‍යාලයෙ කණ්ඩායම ප්‍රමුඛස්ථානය හිමි කර ගෙන තිබෙනව. නමුත් ඒ විද්‍යාලයටත් ක්‍රීඩා භූමියක් නැහැ. ඒ විද්‍යාලයෙ ශිෂ්‍යයිනුත් ක්‍රීඩා කරන්නෙ විද්‍යාලයෙ මිදුලෙ. ඒ විද්‍යාලයට ක්‍රීඩා භූමියක් ලබා දීමටත් දැන් අවුරුදු දහයක් තිස්සෙ වීර්ය කරනව. නොයෙක් ඉඩම් ගැනීමට යෝජනා කරනව. නමුත් හැම අවස්ථාවෙදීම අවහිරකම් ඇති වෙනව. එම නිසා මෙවැනි අවස්ථාවලදී නොයෙක් විධිවලින් පිටිපස්සෙන් සිට පිහියෙන් අනින්නෙ නැතිව පාඨශාලාවලට අවශ්‍ය ක්‍රීඩා භූමි සඳහා ඉඩම් ලබා දෙන ලෙස ගරු ජනසතු සේවා ඇමතිතුමාත්, ගරු අධ්‍යාපන ඇමතිතුමාත් ගරු ඉඩම් ඇමතිතුමාට බල කරන්න. අපේ ඉදිරි පරම්පරාවට, අපේ බාල දරුවන්ට නියම පුරවැසියන් හැටියට නැගිට සිටින්ට ක්‍රීඩා පිළිබඳව පුහුණුවක් ලබාදීම අවශ්‍යයි. ජනසතු සේවා ඇමතිතුමාගේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්ට නම් ඉඩම් අමාත්‍යාංශයේ සහයෝගයත් වුවමනා කරනව. අවසාන වශයෙන් හැම විද්‍යාලයකටම, හැම මහා විද්‍යාලයකටම ක්‍රීඩා භූමියක් ලබා දීමට කටයුතු කරන මෙන් මා ඉල්ලා සිටිනවා.

පූ. භා. 11.45

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
**(Mr. Tudawe)**

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ශාරීරික අධ්‍යාපනය පිළිබඳ උපදේශකවරුන් 150 ක් අරගෙන ලංකාවේ ක්‍රීඩා දියුණු කිරීම සඳහා ජනසතු සේවා ඇමතිතුමා ඉදිරිපත් කර තිබෙන මේ වැය ශීර්ෂය යටතේ මමත් වචන සවලපයක් කථා කරන්ට අදහස් කරනව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාතර ඡන්ද කොට්ඨාශයේ ක්‍රීඩාංගනයක් නැත්නම්, "ස්ටේඩියම්" එකක් පිහිටුවන මෙන් මාතර ක්‍රීඩා සමාජය ළඟදී ඉල්ලීමක් කළ බව ගරු ජනසතු සේවා ඇමතිතුමාත් දන්නවා ඇති. ගරු ඇමතිතුමාගේ අමාත්‍යාංශය ඒ සඳහා ආධාරත් දී තිබෙනව. පසුගිය දවස්වල, අවුරුද්දකට පමණ කලින් ගරු රාජ්‍ය ඇමතිතුමා මාතර ගිහින් මුල් ගලක් එහෙම තබා ඒ ක්‍රීඩාංගනය පිහිටුවීමේ කටයුත්ත ආරම්භ කළා. මෙම ක්‍රීඩාංගනය පිහිටුවීමේ කාර්යය සඳහා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඹවේ මයා.]

අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ මූලිකත්වයෙන් පාඨශාලා ශිෂ්‍යයින්ගෙන්, ගුරුවරුන්ගෙන් සහ මහජනතාවගෙන් විශාල මුදලක් එකතු කළා. ඒ සඳහා මහා උත්සවයකුත් පවත්වා තිබෙනවා. මේ ක්‍රීඩාංගනය පිහිටුවීමේ කටයුත්තට ඒ ආකාරයෙන් රුපියල් 51,000 ක් එකතු කර තිබෙනවා. මට දැනගන්නට ලැබී තිබෙන විධියට ජනසතු සේවා අමාත්‍යාංශයෙනුත් මේ කටයුත්තට රුපියල් 50,000 ක් ලැබී තිබෙනවා. එවිට මේ ක්‍රීඩාංගනය පිහිටුවීමට රුපියල් 1,01,000 ක මුදලක් තිබෙනවා. නමුත් මාතර ක්‍රීඩා සමාජයත් මාතර පළාත් පාලන ආයතනයත් අතර මතභේදයක් නැත්නම් කඹ ඇදිල්ලක් තිබුණා මේ ක්‍රීඩාංගනය පිහිටුවීමේ කාර්යය භාර දිය යුත්තෙ කාටද කියා. මාතර ක්‍රීඩා සමාජය ඉල්ලීමක් කළා ඔවුන්ට මේ ක්‍රීඩාංගනය තැනීමේ කටයුත්ත භාර දෙන්නය කියා. ඒ අතර මාතර නගර සභාව නගර සභාවට මේ කටයුත්ත භාර දෙන්නය කියා ඉල්ලා සිටියා. ඒ අවස්ථාවේදී මාතර ක්‍රීඩා සමාජය කියා සිටියා මාතර නගර සභාව අකාර්යක්ෂම, අදක්ෂ, දූෂිත නගර සභාවක්ය, හැම අවස්ථාවක දීම ඒ නගර සභාවෙ හොරකම් කෙරෙන වාය කියා. එවැනි නගර සභාවකට මහා ආණ්ඩුවේ මුදල් රුපියල් 50,000 ක් දීම ඥානාන්විත නොවේය, එම නිසා මේ ක්‍රීඩාංගනය තැනීමේ කටයුත්ත ඉක්මණින් ආරම්භ කර ඉක්මණින් අවසාන කරන්ට නම් ඒක අපට භාර දෙන්නය කියා ක්‍රීඩා සමාජය ඉල්ලා සිටියා.

මේ විධියෙ කඹ ඇදිල්ලක් තිබුණා. ඒ කොයි හැටි වෙතත් අවසාන තීරණයක් ගත්තාද යන්නවත් ගත්තා නම් ඒ කුමක්ද යන්නවත් මා දන්නෙ නැහැ. මට ලැබී තිබෙන ආරංචියේ හැටියට නම් දැනට එකතු වී තිබෙන රුපියල් එක්ලක්ෂ පණස් එක්දාහ මාතර නගර සභාවට භාර දී ඒ මගින් ඉතා ඉක්මණින් වැඩ කටයුතු ආරම්භ කරන්නට එකඟ වී තිබෙනවා.

මාතර නගර සභාවේ ගනුදෙනු ආදිය සම්බන්ධයෙන් නොයෙකුත් වරක් ආන්දෝලනයක් ඇති වී තිබෙනවා. මාතර නගර සභාවේ ගණුන් හිලවු සෝදිසි කිරීමට ගණුන් පරීක්ෂකයින් ගිහිල්ල තිබෙනවා. ඒ අයගෙ ගණුන් පරීක්ෂණ පවත්වා ගෙන යන අවස්ථාවෙ ගණුන් තබන ලද පොතක් අතුරුදහන් වීම නිසා රුපියල් විසි දහසක පමණ මුදල් වංචාවක ලකුණු පෙනී ගෙන යන බවක් දැන ගන්න තිබෙනවා. මේ ආරංචිය පැතිර යාම නිසා දැන් මාතර නගරයේ මහජනයා තුළ බියක් පහළ වී තිබෙනවා. මහජනයා එකතු කළ රුපියල් පණස් දාහත්, ආණ්ඩුවෙන් ලැබුණු රුපියල් පණස් දාහත්, ක්‍රීඩා සමාජයෙන් එකතු කර දෙන රුපියල් පණස් එක් දාහත් මාතර නගර සභාවට දුන්නොත් එම මුදල ප්‍රවේශම් වේදැයි සැකයක් මහජනයා තුළ දැන් තිබෙනවා. හිටපු ගමන් ගණුන් පොත් අතුරුදහන් වෙනවා නම්, ගණුන් පරීක්ෂකවරුන් ගණුන් පොත් බලා ගියාම පොත් අතුරුදහන් වෙලා යනවා නම්, එවැනි නගර සභාවකට මහජන මුදල් භාර දීමෙන් සෑහෙන අන්දමට වැඩක් කෙරේදෝයි විමතියක් ඇති වීම පුදුමයක් නොවෙයි. ඒ ගැන ජනයා තුළ ලොකු සැකයක් පහළ වෙලා තිබෙනවා. එකතු කරන ලද ලක්ෂයකට වැඩි මුදලින් තවම ශතයක්වත් පාවිච්චි කර නැති බව ගරු ඇමතිතුමාට මතක් කර දෙන්න කැමතියි. වැඩ කිරීම සඳහා පෙන් ඩ්‍රිව් කැදෙව්වෙත් නැහැ. තවම කිසි වැඩක් ආරම්භ කළෙත් නැහැ. මේ තරම් විශාල මුදලක් එකතු කර තිබියදීත් වැඩක් කරන්නෙ නැතිව නිකම් බලාගෙන ඉන්නවා. ඒ නිසා වහාම මේ සම්බන්ධයෙන් පියවරක් ගන්නා ලෙස ගරු ඇමතිතුමා ගෙන් මා ඉල්ලා සිටිනවා.

තවත් කාරණයක් ගැන සඳහන් කළ යුතුව තිබෙනවා. දෙවැනි කාරණය වශයෙන් මා ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන්නෙ මෙයයි. අකුරැස්සෙ ගරු මන්ත්‍රීතුමා (වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ) අකුරැස්සෙ ක්‍රීඩා භූමිය බස් නැවතුම්පොළක් හැටියට පාවිච්චි කරනු ලබනවය කිව්වා. පෞද්ගලික වශයෙන් මා දන්න කාරණයක් තමයි අකුරැස්ස මණ්ඩලයේ සිටින පාඨශාලා ශිෂ්‍ය ශිෂ්‍යාවන් ක්‍රීඩා තරඟවලට සහභාගි වෙන්න වුවමනා වුණාම සැලකිය යුතු මුදලක් වියදම් කර වැන් රථ කුලියට ගෙන අකුරැස්සේ සිට මාතරට එන්න ඕනෑ. හැතැප්ම විසි ගණක් මිඟ ගෙවා ක්‍රීඩෝත්සව ආදිය සඳහා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අකුරැස්ස ප්‍රදේශයේ උදවිය මාතරට එන්න ඕනෑ. මේ තත්ත්වය ඉතා කරදර කාරී එකක් බව කල්පනා කරන්න ඕනෑ. එහෙත් ඒ ගැන ගරු ඇමතිතුමා සැලකිල්ලක් නොදැක්වීම ගැන අපේ කනගාටුව ප්‍රකාශ කරන්න ඕනෑ. මේ තත්ත්වය දිගින් දිගටම පවත්වාගෙන යාමට ඉඩ තැබීම කනගාටුදායකයි. අකුරැස්සේ ගරු මන්ත්‍රීතුමා ඉල්ලා සිටි පරිදි ක්‍රියා කරනු ඇතැයි අප ඉතා ඕනෑකමින් බලාපොරොත්තු වන බව කරුණාවෙන් සඳහන් කරන්න කැමතියි. බස් නැවතුම්පොළ ආපසු දිසාපතිවරයාට භාර දීමට අදහස් කර තිබෙන බවක් මට දැන ගන්න ලැබී තිබෙනවා. එය එසේදැයි ජනසතු සේවා ඇමතිතුමා අපට පැහැදිලි කර දෙනු ඇතැයි බලාපොරොත්තු වෙනවා. මේ ගැන එතුමාගෙන් අපට පැහැදිලි පිළිතුරක් අවශ්‍ය බව දන්වන්න කැමතියි. ඒ සම්බන්ධයෙන් එතුමා දිසාපතිතුමාට කරන්නෙ කොයි විධියෙ නියෝගයක්දැයි අපට කියන ලෙස එතුමාගෙන් මා ඉල්ලා සිටිනවා. ක්‍රීඩා භූමියක අවශ්‍යතාව මේ තරම් ඉහළින් පවතිද්දී, පාඨශාලා ශිෂ්‍යයින්ගේ අවශ්‍යතාවත් මේ තරම් උග්‍ර අන්දමින් තිබෙද්දී ශිෂ්‍යයන් අමාරුවට වැටී සිටිද්දී මොන විධියේ නියෝගයක් දිසාපතිතුමා වෙත නිකුත් කරනවාදැයි දැන ගන්න ඕනෑ බව සඳහන් කරන්න කැමතියි. බස් නැවතුම් පොළ ආපසු දෙනවද යන්න පැහැදිලිව ප්‍රකාශ කරන ලෙස ඉල්ලා සිටිනවා. තුන්වැන්න මෙයයි. වලපනේ ගරු මන්ත්‍රීතුමා (ටී. බී. එම්. හේරත් මයා.) සහ බෙන්තර-ඇල්පිටියෙ මන්ත්‍රීතුමා (කාරිය වසම් මයා.) විසිනුත් ඒ ගැන සඳහන් කර තිබෙනවා. ක්‍රීඩා දියුණු කිරීමේදී ක්‍රිකට් ක්‍රීඩාව ගැන පමණක් හෝ වොලි බෝල් ක්‍රීඩාව ගැන පමණක් නොවෙයි කල්පනා කළ යුතුව තිබෙන්නෙ. ගම්බද ක්‍රීඩා සම්බන්ධයෙනුත් විශේෂ සැලකිල්ලක් දැක්විය යුතුව තිබෙනවා. ගම්බද ක්‍රීඩා ගැන විශේෂයෙන් සැලකිල්ල දක්වන්න ඕනෑ බව කියන්න කැමතියි. ගැමි ඉරුවටත්, අපේ සංස්කෘතියටත් හරි යන විධියෙ වැඩ පිළිවෙළක් අනුව ක්‍රීඩාවන් සංවිධානය කිරීම ගැන සලකා බලන මෙන් ඉල්ලා සිටිනවා. ගමේ දරුවන්ට ක්‍රිකට් ගහන්න උගන්වන්න ගම්වලට ගිහින් ක්‍රිකට් භූමි හදන්නෙ නැතිව, අපේ පාරම්පරික ක්‍රීඩාවන් දියුණු කිරීමට, ඒවා පණ ගැන්වීමට එතුමා අදහස් කරාවිය කියා මා විශ්වාස කරනවා. මා කථා කරන්නට බලා පොරොත්තු වන්නෙ එපමණයි.

පූ. භා. 11.52

**ටී. බී. තෙන්නකෝන් මයා.** (දඹුල්ල)
*(திரு. ரீ. பி. தென்னகோன்—தம்புள்ள)*
**(Mr. T. B. Tennekoon—Dambulla)**

නියෝජ්‍ය කථානායකතුමනි, ක්‍රීඩා පිළිබඳව කථා කරන්නට කලින්, අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙ සිටින ක්‍රීඩා උපදේශක වරුන් ක්‍රීඩා අමාත්‍යාංශයට මාරු කිරීම ප්‍රඥාගෝචර ක්‍රියාවක් නොවන බව කියන්නට ඕනෑ. දැනට අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙ සිටින මොනම ක්‍රීඩා උපදේශකයකුවත් ක්‍රීඩා අමාත්‍යාංශයට මාරු කළොත්. දැනට තිබෙන ක්‍රීඩාත් නැතී වන්නට පුළුවන් බව ස්පිර ලෙසම ප්‍රකාශ කරන්නට කැමතියි.

ක්‍රීඩා අමාත්‍යාංශයක් ඇති කර තිබීම ගැන අප සතුටු වන්නට ඕනෑ. නමුත් ක්‍රීඩා සම්බන්ධ මූලික කරුණු මොනවාද කියා ඒ ක්‍රීඩා අමාත්‍යාංශයෙ නිලධාරීන්වත්, ගරු ඇමතිතුමාවත්, මේ රජයවත් කල්පනා කරන්නෙ නැති බව කියන්නට සිදු වී තිබෙනවා. "රටේ නාන මිනිස්සු නානව" කිවා වගේ, කොහේවත් රටවල තිබෙන පිළිවෙළට මේ රටෙත් ක්‍රීඩා ඇති කරනවා. නමුත් රටකට උචිත ක්‍රීඩාවන් තෝරා ගත යුත්තෙ ඒ රටේ දේශ ගුණයට ඔබින විධියටයි.

ක්‍රීඩා තෝරා ගැනීමේදී මූලික කරුණු දෙකක් ගැන බලන්නට ඕනෑ. එයින් එකක්, මිනිසුන් කරන ව්‍යාපාර නැත්නම් රක්ෂා මොකක්ද යන්න සොයා බැලීම. ගොවීන් වැනි ඇඟ මහන්සි කොට වැඩ කරන අයට ක්‍රිකට් වගේ ක්‍රීඩාවකින් වැඩක් නැහැ. ජාතික ක්‍රීඩාවන් ඇති කර තිබෙන්නෙ කරන රැකියාව අනුව සිදු වන ව්‍යායාමයෙ හැටියට විශ්‍රාමයක් වශයෙනුයි. ව්‍යායාම් කරන සෑම මිනිහකුටම විශ්‍රාමයක් ලබා දීම පිණිසයි, ක්‍රීඩා යොදා ගත යුත්තෙ. ඒ වගේම දේශගුණය අනුවයි, ක්‍රීඩා යොදා ගත යුත්තෙ. නමුත් අපේ රටේ—

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

නියෝජ්‍ය කථානායකතුමනි, රීති ප්‍රශ්නයක් මතු කරන්නට කැමතියි. සභාවෙ ගණපූරණයක් නැහැ.

**මන්ත්‍රී මණ්ඩලය ගණන් කොට ගණපූරණයක් නොතිබියෙන් බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදී.**

පසුව ගණපූරණයක් තුබුයෙන්—

*சபை எண்ணப்பட்டு நிறைவெண் இல்லாததால் பிரிவு மணி அடிக்கப்பட வேண்டுமென ஆணையிடப் பட்டது.*

*பிறகு நிறைவெண் இருந்ததனால்—*

*House counted, and a Quorum not being present, the Division Bells were ordered to be rung.*

*Later, a Quorum being present—*

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

නියෝජ්‍ය කථානායකතුමනි, මේකත් එක සෙල්ලමක් වගෙයි මට පෙනෙන්නෙ. ගණපූරණය නැති බව කීම, කෑමට හෝ නිවාසවලට යෑමට ගිය මැති ඇමතිවරුන් ආපසු ගෙන්වා ගැනීමේ සෙල්ලමක් හැටියටයි, අපට නම් පෙනෙන්නෙ. එයත් එක ක්‍රීඩාවක් හැටියට අපි ගණන් ගනිමු.

ක්‍රීඩා අමාත්‍යාංශයක් තිබෙනව නම් ක්‍රීඩා ඇති වීමට හේතුව කුමක්ද කියා සොයා බැලිය යුතු බව මා ගරු සෙල්ලම් ඇමතිතුමාට මතක් කරන්නට කැමතියි. මා කලිනුත් කීවා වගේ, ඒ ඒ අයගෙ ව්‍යායාම් අනුව විශ්‍රාමයක් ඇති වන පිළිවෙළටයි ක්‍රීඩා කළ යුත්තෙ. ඇඟ වෙහෙසන, පුරාණ ජාතික ක්‍රීඩා කිසි එකක් දවල් කාලයෙ නොකළ බව ඉතිහාසයෙනුත්, අපේ අත්දැකීම්වලිනුත් අපට සහිරවම කියන්නට පුළුවන්. මේවා කියන විට ගරු අධ්‍යාපන ඇමතිතුමා හිනා වෙනව. ක්‍රීඩා ගැන හොඳට කල්පනා වෙලා වෙන්න ඇති එතුමා හිනා වෙන්නෙ.

අපේ ජාතික නැටුම් හා තවත් කෙළි සෙල්ලම් තිබෙනව. අපි දන්නව, ඒ ක්‍රීඩාවෙ සරඹ 12 ක් තිබුණ. ඒ සරඹ 12 න් තමයි, මනුෂ්‍යයා සම්පූර්ණයෙන්ම හැඩ ගස්වන්නෙ. ඒ සරඹ ගැන කියන කොට මතක් වෙනව, අපේ දණ්ඩියම. අඩි දෙකක් නැත්නම් දෙකහමාරක් පමණ උසට හරහට ඇද නැති ගහක් දමා තිබෙනව. ඒ උසින් දණ්ඩියම උඩ අත් දෙක තබාගන ඒ සරඹ 12 කරන පිළිවෙල මට හොඳට මතකයි. අපි කුඩා කාලෙ අපේ ගම්වල හැම කුඩා ළමයෙක්ම මේ සරඹ 12 ඉගෙන ගන්නට ඕනෑ. අත් දෙක මෙහෙම තබාගන "තේයි, තේයි තේයි, තේයි, තේයි" කියල පළමු වැනි එක. දෙවැනි එක "තෙයි කිට, තෙයි කිට, තෙයි කිට, තෙයි කිට, තෙයි කිට" කියල ඉගෙන ගන්නට ඕනෑ. ඊළඟට තුන්වැනි එක "තෙයි කිට, තෙයි කිට, තෙයි කිට, තෙයි තම්; තෙයි කිට, තෙයි කිට, තෙයි කිට, තෙයි තම්" කියල ඉගෙන ගන්නට ඕනෑ. ඔය කියන පිළිවෙළට ලස්සණට මේ සරඹ 12 කුඩා කාලයෙ ඉගෙන ගන්නට පුළුවන්කම තිබුණ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ කාලයේදී මේ සරඹ 12 ලක්ෂණ පිළිවෙළට ඉගෙන ගන්න පුළුවන්කම් තිබුණා. අපේ අධ්‍යාපන ඇමතිතුමා හිනහ වුනත්, මේ සරඹ කරන්නෙ දවල් කාලයේ නොවෙයි, සවස් කාලයෙයි. ඒකට නියම වෙලාවක් තියෙනව. කාල වේලා දැන ගෙනයි, ක්‍රීඩා කරන්න ඕනෑ. දේශයේ හැටියටයි, ක්‍රීඩා කරන්න ඕනෑ. එංගලන්තයේ දේශ ගුණය නොවෙයි, ලංකාවෙ තියෙන්නෙ. ඒ නිසා එංගලන්තයේ කරන සෙල්ලම් මෙහාට හරියන්නෙ නැහැ. එංගලන්තයේ දවල් කරන සෙල්ලම් ලංකාවේ දවල් කළාට හරියන්නෙ නැහැ. එංගලන්තය ශීතල රටක්. ඒ රටේ දවල්ටවත් දාඩිය දමන්නෙ නැහැ. අපේ රටේ නිකම් සිටියත් දාඩිය දමනව. මේ වගේ ශීත කළ කාමරයක්වත් අපේ රටේ සිටින්න පුළුවන්කමක් නැහැ.

අපේ ක්‍රීඩා අමාත්‍යාංශයක් තියෙනව නම් ඒ අමාත්‍යාංශය මගින් දේශීය ක්‍රීඩා පුහුණු කරවීම අවශ්‍යයි. අපේ ගරු ක්‍රීඩා ඇමතිතුමා දේශීය ක්‍රීඩා දැකල තියෙනවද මම දන්නෙ නැහැ. අං ඇදීම, පොල් ගැහීම, ඔළිඳ සෙල්ලම වැනි ක්‍රීඩා එතුමා දන්නවද දන්නෙ නැහැ. [බාධා කිරීමක්] ඇට බෝල නම් සිංහල එකක් නොවෙයි. මුස්ලිම් එකක්ද දන්නෙ නැහැ. සමාජ සේවා ඇමතිතුමා දන්නව ඇති. කව්රුත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඇට බෝල සෙල්ලම කරනවලු. කොලොන්නාවෙ මන්ත්‍රීතුමයි, (ඉලංග රත්න මයා.) එහෙම කියන්නෙ. පන්දු ගැහීමත් අපි කුඩා කාලයේ තිබුණා. ඒ දැන් කරන ක්‍රිකට් ක්‍රීඩාව නොවෙයි. දෙසියයක් පමණ එක පැත්තකටත්, තවත් දෙසියයක් පමණ අනිත් පැත්තටත් බෙදිල සෙල්ලම් කරනව. පාර්ලිමේන්තුවටත් වඩා ලක්ෂණයි. උඩු පිල, යටි පිල කියා දෙපැත්තක් තියෙනව. දෙපැත්තෙම හැතැප්මක් විතර ඇතිනුයි, දිනුම් කනු තියෙන්නෙ. පන්දුව ගහන අයත්, පන්දුව රකින අයත් ඉන්නව. සමහර විට මේ ක්‍රීඩාව සතියකින්වත් අවසන් කරන්න බැරිව—තීරණයක් ගන්න බැරිව—දිගටම කරගෙන යන බව අපි දන්නව.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

The Sitting is suspended till 2 P.M.

**රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්සිටුවන ලදින් අ. භා. 2 ට නැවත පවත්වන ලදී.**

அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு மீண்டும் பி. ப. 2 மணிக்கு ஆரம்பமாயிற்று.

***Sitting accordingly suspended till 2 P.M. and then resumed.***

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රැස්වීම අත්සිටුවන විට අපි කථා කරමින් සිටියේ සෙල්ලම් ඇමතිතුමාගේ වැය ශීර්ෂය පිළිබඳවයි. මේ පිළිබඳව දීර්ඝ විස්තරයක් කරන්ට මා අදහස් නො කරන්නෙ සමාජ සේවා ඇමතිතුමා එතුමාගේ වැය ශීර්ෂයක් සම්මත කර ගන්ට පුල පුලා බලා සිටින නිසයි.

අපි පොඩි දවස්වල අපි මේ විධියේ ගම් බද කවියක් අහල තිබෙනව:

"සෙල්ලම් කඩේ බඩු තරඟෙට නො ගනිල්ලා
බල්ලන් බුරා එන කළ පැන නො දුවල්ලා
කොල්ලන් ගසට ඇර ගස මුල නො සිවිල්ලා
සෙල්ලම් කළොත් නිස්පල වෙයි දැන ගල්ලා"

මෙතැන මේ "සෙල්ලම් කළොත්" කියන්නෙ මේ සෙල්ලම් ගැනම නොවෙයි. මේ සෙල්ලම කියන එක නොයෙක් දෙනා නොයෙක් අතට තේරුම් කරනව.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

සෙල්ලම ලෙල්ලම.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

සෙල්ලම ලෙල්ලම වන බවත් කියා තිබෙනව. අපේ සෙල්ලම් හුඟක් නම් වලින් හඳුන් වනව. මිහින්තලේ මන්ත්‍රීතුමා (පී. එම්. කේ. තෙන්නකෝන් මයා.) කියන්නා වගේ ක්‍රීඩා කියනවා වගේම කෙළි කියලත් කියනව. අපේ හොඳ ක්‍රීඩාවක් තමයි, ලී කෙළිය. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යුරෝපයෙන් සහ වෙනත් විදේශවලින් බෝ වුණු සෙල්ලම්වලට වඩා උසස් සෙල්ලමක් අපේ ලී කෙළිය. තමුන්නාන්සෙත් දැකල ඇති. පිටිසරබදව තිබෙන ඒ ලී කෙළිය මට හොඳට මතකයි.

"එක පඳුරෙන් ලී සයක් කපාගෙන
එක නම ඇති සඳෙනෙක් කැඳවාගෙන
ගුරුන් අතට දී ලී බෙදවාගෙන
අපිත් කෙළිමු ලී සඳෙන බෙදා ගෙන"

කියා කවියකුත් තිබෙනව.

ඔය ලී කෙළි ගැන එහෙම ක්‍රීඩා ඇමතිතුමා දන්නවාදැයි මා දන්නෙ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ක්‍රීඩා අංශයෙන් අපේ රටට අවශ්‍ය නැති ඒවටයි, සැලකිල්ලක් තිබෙන්නෙ. හරියට ඇඳුම වගෙයි. අපේ ක්‍රීඩා ඇමතිතුමාගේ ඇඳුමත් මේ රටට අවශ්‍ය ඇඳුමක් නොවෙයි. මම යුරෝපා රටවල ඇවිදලා තිබෙනව. යුරෝපයට අපි යන අවස්ථාවක මේ වගේ බැනියමයි රෙද්දයි ඇඳගෙන ගියොත් ඒක විහිළුවට කාරණයක් වෙනව. ඇයි? දේශයට අනුව ඇඳුම තිබෙන්න ඕනෑ. ලංකාවේ මෙතරම් දාඩිය දමද්දී ටයි දමා ගෙන, කර හිර කරගෙන කෝට් 4ක් 5ක් දමාගෙන, සිටිනව නම් ඒකත් විහිළුවට කාරණයක්. ඒ වගේ තමයි, ලංකාවේ ක්‍රීඩාවලටත් සිද්ධ වෙලා තිබෙන්නෙ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී .බී. තෙන්නකෝන් මයා.]

ඉවක් බවක් නැතිකමයි. පිටරටින් කොපි කර ගත්ත දේ ඉහළින් සැලකීම නිසා තමයි, අපේ ජාතික ක්‍රීඩාවලට නැනක් නැතිව ගිහින් තිබෙන්නේ.

ලී කෙළිය වගේම තවත් සෙල්ලමක් තමයි, කලගෙඩි සෙල්ලම.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
**(The Hon. J. R. Jayewardene)**
මහසොප්.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
**(The Hon. M. D. Banda)**
තට්ටු පැනීම.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
**(Mr. T. B. Tennekoon)**

තට්ටු පැනීමත් බොහොම හොඳ සෙල්ලමක්. අපි කුඩා කාලයේ ඒව කරල තිබෙනව. ඒ කාලයේ දඹුල්ල ආසනයට අයිතිව තිබුණු දැනට ලග්ගල ආසනයට අයිති ගමක් තිබෙනව මාරාගමුව කියා. මම දවසක් කොප්පිලිය නමැති ගමක සිට මාරාගමුවට එන කොට පාර අයිනෙ කුඹුරුවල වැඩ කරමින් සිටි—හාමින් වේලි බදිමින් සිටි—මිනිස්සු හැමදෙනාම හැන්දෑවේ ඇවිත් දැලක් බැඳගෙන දෙපැත්තට වෙලා බෝල ගහනව මම දැක්ක. බොහොම මහන්සියෙන් එහාට මෙහාට ගහනවා. [බාධා කිරීමක්] ගොවි බෝල් ගහනවා යයි වැඩ බලන රාජ්‍ය නායකතුමා කියනව.

විශ්‍රාම ලබා ගත යුත්තේ ව්‍යායාමය අනුවයි. ඒ බව මා මුලින්ම කිව්වා. හොඳට මහන්සි වී කුඹුරුවල හේන්වල වැඩ කරන අය වොලි බෝල් ගහන්නට ගියාම ඒක මැරෙන වැඩක් වෙනව. ඔළිඳ කෙළිය දාම් ඇදීම, නෙරෙංචි ඇදීම වැනි සෙල්ලම් ඉස්සර කාලෙ තිබුණ. මහන්සි වී වැඩ කරන උදවියට ඒ වගේ සෙල්ලම් සුදුසුයි. දැන් ආදි කාලෙ ඇදුම් පැලඳුම් කෑම් බීම් මෙන්ම කෙළි සෙල්ලම්ද නරක් වී තිබෙනවා. ව්‍යායාමය අනුව විශ්‍රාමය සඳහා කෙළි සෙල්ලම් සකස් කර නොගෙන ඔහේ ඉවක් බවක් නැතිව නොයෙකුත් කෙළි සෙල්ලම් යොදාගෙන තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තමුන්නාන්සේ කළගෙඩි සෙල්ලම දැක ඇති. ස්ත්‍රී පක්ෂයේ අය කළගෙඩි සෙල්ලම ලස්සන විධියට කරගෙන යනවා. අප පොඩි කාලෙ තවත් විධියක කළගෙඩි සෙල්ලමක් තිබුණා. ඒ කළගෙඩි සෙල්ලම ගැන නම් බාගදා තමුන්නාන්සේ දන්නෙ නැතිව ඇති. හොඳ රත්තරනින් සෑදූ බඩු වලින් කළගෙඩිය පුරවනවා. ඊට පසු සල්ලිකාරයන් සිටින ස්ථානයකට ගොස් එහි තිබෙන බඩු විකුණනවා. ඊළඟට පොලිස් ඇදුම් ඇඳගත් උදවිය ගොස් අර විකුණන ලද බඩු හොර බඩු බව කියමින් ඒවා අරගෙන එනවා. ඒ කාලෙ ඔහොමත් කළගෙඩි සෙල්ලමක් තිබුණා. [බාධා කිරීමක්] දැන් කාලෙ නම් කළගෙඩිය ඇතුලෙ දමාගෙන යන්නෙ රත්තරන් බඩු නොවෙයි; කසිප්පුලු.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ බොහෝ කටයුතු ක්‍රීඩා ස්වරූපයෙන් කරන්නට පුළුවනි. කුඹුරු නෙළීම, ගොයම් කැපීම, පැල් රැකීම, පැදුරු විවීම ආදී හැම දෙයක්ම ක්‍රීඩා ස්වරූපයෙන් කරගෙන යන්නට පුළුවනි. ඉස්සර කාලෙ නැන්දම්මා හා ලේලි තරඟෙට පැදුරු දියා තිබෙනවා. තවද, වී කෙටීමත් ක්‍රීඩාවක් වගේ කරන්නට පුළුවනි. ඒ නිසා අපේ රට ප්‍රාණවත් කිරීමට ක්‍රීඩා ඇමතිතුමාට ආශාවක් තිබෙනවා නම් ඊට සුදුසු අන්දමට ක්‍රියා කළ යුතුයි. කරන්නන් වාලේ සෙල්ලම් කළොත් නිෂ්ඵල වේය යන පදේ ඇති වෙනවාට සැකයක් නැති නිසා අපේ ගරු ඇමතිතුමා ශාරීරික වශයෙන් හා මානසික වශයෙන් කාටත් ප්‍රයෝජනයක් ලබා ගත හැකි වන අන්දමේ ක්‍රීඩා ඇති කරන්නට ක්‍රියා කළ යුතුයි. අපේ දේශගුණය අනුව ඒ ඒ ක්‍රීඩා පැවැත්විය යුතු කාලය සුදුසුද යන්න ගැන කල්පනා කොට වැඩ කළයුතු බව තරයේ කියා සිටිනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ ක්‍රීඩා ගැන කතා කළාට තමුන්නාන්සේ වේලාව ගැන කල්පනා කරන බව තමුන්නාන්සේගේ මුහුණෙන් පේනව. මේ කතා ඉක්මනින් නවත්වනවා නම් හොඳය කියන හැඟීම තමුන්නාන්සෙගෙ හිතේ තිබෙන බව පේනව. අධ්‍යාපන අමාත්‍යාංශයට අයිති ක්‍රීඩා එක එක අරගෙන ඒ ඒ ක්‍රීඩාවලට පත් කර සිටින උපදේශකයන් ප්‍රාදේශීය ආදායම් නිලධා

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

ඊන්ට භාර දීමෙන් කවදාවත් වැඩක් සිදු වන්නේ නැති බව අපි ස්ථිරවම කියා සිටිනව.

කෘෂිකර්ම ඇමතිතුමා ප්‍රාදේශිය ආදායම් නිලධාරියකු වශයෙන් ඉතා සාර්ථක ලෙස වැඩ කර තිබෙන නිසා ඒ ඇමතිතුමා දන්නවා ඇති ප්‍රාදේශිය ආදායම් නිලධාරීන්ට තිබෙන බහු කායීයන් මොනවාද යන්න ගැන. ඒ කායීයන් සියල්ල කරන ගමන් මේ ක්‍රීඩා උපදේශකවරුන් පරීක්ෂා කිරීම, ඔවුන්ට උපදෙස් දීම සහ ඔවුන් පාලනය කිරීම යනාදි වැඩ කටයුතු කර ගෙන යාමට අණ කළාට එය කෙසේවත් කෙරෙන්නේ නැහැ. ඒ ඇමතිතුමා අධ්‍යාපන ඇමතිවරයා වශයෙන් කලක් කටයුතු කර තිබෙන නිසා එතුම දන්නව ඇති මේ පිළිබඳව තිබෙන තත්වය. අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ කට යුතු කරන ක්‍රීඩා උපදේශකවරුන්ගේ වැඩ කටයුතු ගෙනයාමට හැකි ලෙහෙසිම අන්දම ගැන එතුමාට හොඳ අවබෝධයක් තිබෙනවාට කිසිම සැකයක් නැහැ. එම නිසා මේ වැඩේ නම් හිසරදයට කොට්ටය මාරු කිරීම තරමටවත් හොඳ දෙයක් නොවන බව ප්‍රකාශ කරමින් ගරු නියෝජ්‍ය කථානායකතුමා කාලය ඉතිරිකර ගැනීමට බලාපොරොත්තු වන නිසා මගේ කථාව අවසාන කරනව.

අ. භා. 2.12

**රාජා කුලතිලක මයා.** (තෙල්දෙණිය)
*(திரு. ராஜ குலத்திலக்க—தெல்தெனிய)*
**(Mr. Raja Kulatillake—Teldeniya)**

පාඨශාලා ශිෂ්‍යයන්ගේ ශාරීරික සෞඛ්‍ය තත්ත්වය වර්ධනය කිරීම සඳහා යෝජිත මෙම සැලැස්ම පිළිබඳව වචන සවලප යක් කතා කරන්ට මා අදහස් කරනවා. අපේ රටේ බාල පරපුර සෞඛ්‍ය තත්ත්ව යෙන්ද සදාචාරයෙන්ද වර්ධනය කර ගැනීම උදෙසා මේ ආකාරයේ සෞඛ්‍ය අභ්‍යාස වැඩ පිළිවෙලක් මෙතෙක් මේ රටේ සිරිතක් වශයෙන් පවත්වාගෙන ආව. මෙම යෝජනාවෙන් එම වැඩ පිළිවෙළේ පැහැදිලි වෙනසක් ඇති වන බව අපට පේනව. මේ රටේ ජනතාවගේ විනෝදයත් බාල පරපුරේ ප්‍රබෝධයත් ඇති කිරීම සඳහා තිබුණාටත් වඩා හොඳින් යහපත් සැලැස්මක් අනුව වැඩ පිළිවෙළක් ගෙන යාමයි, අප විසින් කළ යුතුව තිබෙන්නෙ. අන්න ඒ පරමාර්ථය මෙම වැඩ පිළිවෙළෙන් ඉටු වෙනවාද යන්න කල්පනා කර බැලිය යුතුව තිබෙ **නව. ශාරීරික** වශයෙන් මෙන්ම මානසික වශයෙනද බාල පරම්පරාවේ සෞඛ්‍ය තත්වය දියුණු කිරීමට හැකි බලගතු සැලැස්මක් මේ මගින් සකස් වී තිබෙනවාද යන්න ගැන කල්පනා කර බලන විට, මෙම වැඩ පිළිවෙල එතරම් සාර්ථක නොවන බව අපට පෙනී යනව. අමාත්‍යාංශ කීපයකට බල පාන ලෙස මෙම වැඩ පිළිවෙළ යොදා ගැනීම එතරම් කල්පනාකාරී දෙයක් හැටියට අපට පෙනෙන්නේ නැහැ. අධ්‍යාපන අමාත්‍යාංශයත්, ඉඩම් අමාත්‍යාංශයත්, ජනසතු සේවා අමාත්‍යාංශයත් කියන අමාත්‍යාංශ තුනම මීට බල පාන බව පෙනෙනව. පූර්ණ බල ඇතුව අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් මේ සැලැස්ම ගෙන යනොත් ඒ වැඩ පිළිවෙළ වඩාත් හොඳින් ක්‍රියාත්මක කරන්ට පුළුවන් වේවිය කියා මා සිතනවා.

ජනතාව යන එන මං නැතිකම නිසා ආර්ථික පීඩනවලින් සහ මන්ද පෝෂණයෙන් පෙළෙන නමුත් ලෝකයේ ඉහල පෙලේ ජාත්‍යන්තර ක්‍රීඩාවලට අපේ තරුණ තරුණියන් යවන්ට සිතීම මුළාව කැයි මා හිතන්නේ නැහැ. අපේ රටේ ජනතාව සෞඛ්‍ය වශයෙන් මෙන්ම මානසික වශයෙන්ද පෙළෙන බව පේනව. ඔවුන්ට ජීවත් වීමට තැනක් නැතිකමින් පෙළෙනව. ආහාර හිඟකමින් පෙළෙනව. ආර්ථික වශයෙන් තත්ත්වය නහාලන්නේ නැතිව ක්‍රීඩාවට පමණක් ජනතාව පොළඹවන්නට හදන එක මේ සැලැස්මේ ඇති ලොකු අඩු පාඩුවක් හැටියට මට පෙනෙනව. මෙය කොයි පක්ෂයකට වුණත් කොයි රජයකට වුණත් මුහුන දෙන්නට සිදු වන ප්‍රශ්නයක්. මෙය පටු වාද භේදවලින් තොරව සිතිය යුතු ප්‍රශ්නයක්. ළඟදී මගේ ආසනයේ ආදායම් පාලක නිලධාරී මහත්මයාගේ ප්‍රධානත්වයෙන් ඒ ප්‍රදේශයේ ගම්සභාපතිවරුන් හා නිලධාරීන් අතර පැවැති මේ පිළිබඳව සාකච්ඡාවකට මාත් සහභාගී වුණා. එහි දී මා කෙලින්ම කියා සිටියේ මෙයයි: මේ අදහස අගෙයි; මේ සැලැස්ම අගෙයි; අපි පිළිගන්නව; නමුත් මන්දපෝෂණයෙන් පෙළෙන එමෙන්ම කායික මෙන්ම මානසික වේදනාවෙන් රෝගීව සිටින ජනතාවකට ක්‍රීඩා පිළිබඳ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කුලතිලක මයා.]

පණිවුඩය පමණක් දී—සැලැස්මකින් ඒ පණිවුඩය පමණක් දී—මදි. ඒ නිසා කළ යුත්තේ මෙයයි: ක්‍රීඩාවට සුදුසු කායික මෙන් ම මානසික ශක්තියකින් ඔදවැඩුණු සිසු දරු පිරිසක් ඇති කිරීමට පළමුවෙන්ම අපි අදහස් කරමු. ඒ අනුව මේ සැලැස්ම ක්‍රියාවට පරිවර්තනය කරන විට අවශ්‍ය පෝෂ්‍යදායක ආහාරත් ලැබෙන පරිදි වැඩ පිළිවෙළක් අප විසින් සකස් කරන්නට ඕනෑ.

මගේ ආසනයේ මහා විද්‍යාල 4 ක් තිබෙනවා. පාඨශාලා ගොඩනැගිලි 26 ක් පමණ තිබෙනවා. ඒ එකකටවත් හරිහැටි ක්‍රීඩා භූමි නැහැ. රඹුක්ගල්ල මහා විද්‍යාලයට පමණක් ක්‍රීඩා භූමියක් තිබෙනවා. එයත් හරියට පිළිකන්නේ තිබෙන මිදුලක් වගෙයි. තමුන්නාන්සේලාට අපේ අමාරුකම් අඩු පාඩුකම් කියමින් අපි බොහොම මහන්සි වෙනවා. අපේ ප්‍රදේශවල ජනතාවටත් ක්‍රීඩා භූමි ඕනෑය කියා කියනවා. එහෙත් අද වන තුරුත් අපට ඒ සහනය ලැබී නැහැ. කරුණාකර අපේ ප්‍රදේශයේ තිබෙන පාඨශාලාවලටත් ක්‍රීඩා භූමි ලබා දෙන්න. ක්‍රීඩාවලට සහභාගිවන දරුවන්ටවත් කිරි බිත්තර ආදී පෝෂ්‍යදායී ආහාර ටිකක් ලැබෙන පිළිවෙළක් සලස්වන්න. එදා පැවැති සාක ච්ඡාවේදී මම තවත් කරුණක් කිව්වා. දරුවන්ට පෝෂ්‍යදායී ආහාර ටිකක් සැපයීමට ඒ සඳහා අරමුදලක් සකස් වන්නට ඕනෑ; එයට රජයෙන්ද සහයෝගය ලැබෙන්නට ඕනෑ; ඒ ප්‍රදේශයේ සිටින මුදල් හැදල් ඇති වතු අධිකාරී මහත්වරුන් වැනි අයගෙන්ද එයට සහයෝගය ගන්නට පුළුවන්; පළාතේ මන්ත්‍රීවරයා වශයෙන් ඒ සඳහා අපෙන්ද ලැබිය යුතු සහයෝගය දෙන්නට කැමතියි; කියල කිව්වා. තමුන්නාන්සේලාටත් අපි කියන්නේ ඒකයි. ක්‍රීඩාව ගැන කථා කිරීම විනෝදයෙන් කළ එක නරක නැහැ. නමුත් ඇත්ත වශයෙන් ම මෙය සෙල්ලමක් නොවෙයි. මෙය හරියාකාර හිතට අරගෙන වැඩ කළොත් හැදී ගෙන එන අනාගත බාල පරම්පරාවෙන් අප බලාපොරොත්තු වන පරමාර්ථය සාක්ෂාත් කරගන්නට පුළුවන්. මේ වැඩේ වැරදුණොත් ලෙල්ලමක් වන බවත් අප කවුරුත් තේරුම් ගත යුතුයි. හරිහැටි ආහාර යක් නැතිව, ජීවත්වීමට මං නැතිව, සිටින අය ගැන සිතන විට "කුමට නැවුම් කෙළි කවට සිතා දා" කියන සිංහල කවියක ඇති ප්‍රසාපිරුළ මතක් කර දෙන්න කැමතියි. මේවා ඉදිරිපත් කරන්නේ දේශපාලන වාසි සඳහාද, එසේ නැතිව අවංකවම මේ ප්‍රශ්නය විසඳන්නට සිතා මෙය කරනවාද යන්න මේ ගැන සිතන විට අපට අවබෝධ වෙනවා. ඒ කරුණා උඩ අපට සැකයක් පහල වෙනවා. ඒ නිසා ජාතිය නඟාලීම සඳහා ශාරීරික සෞඛ්‍ය යෙන්ද මානසික සෞඛ්‍යයෙන්ද ඔදවැඩුණු ජනතාවක් බිහිකිරීම සඳහා අප දරන මේ ප්‍රයත්නය සර්වප්‍රකාරයෙන්ම ඉෂ්ට කර ගන්නට නම් අවංකව මේ පිළිබඳව සිතා අඩුපාඩු තේරුම් ගෙන සැලැස්මක් වහාම සකස් කර ගන්නය කියා මා තමුන්නාන්සේලාගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

විශේෂයෙන්ම දිළිඳු වූ අපේ කොටස්වලට ක්‍රීඩා භූමි දෙන්න ඕනෑ. නාගරික ප්‍රදේශවල නම් ක්‍රීඩා භූමිවලින් හිඟයක් නැහැ. කොළඹ නම් පාරක් නොටක් ගාණේ මහා විශාල ක්‍රීඩා පිට්ටනි තිබෙනවා. එහෙත් අපේ ප්‍රදේශවල ජනතාවට ඔය විධියේ පිට්ටනි දකින්නවත් නැහැ. ඒ නිසා මේ සැලැස්ම සාර්ථක කර ගැනීමට නම් විශේෂයෙන්ම නොදියුණු ආසනවලට ක්‍රීඩා භූමි ලබා දෙන්න. එමෙන්ම අඩු වශයෙන් ක්‍රීඩාවලට සම්බන්ධ වන දරුවන්ටවත් උපදෙස් සමගම පෝෂ්‍යදායී ආහාරත් ලැබෙන ක්‍රමයක් ඇතිකිරීමද ක්‍රීඩා වෙනුවෙන් අවශ්‍ය බඩු බාහිරාදිය නොපමාව ලබාදීමේ වැඩ පිළිවෙළක් ඇති කිරීමද ඔය සැලැස්මට අඩංගු කර ගන්නය කියා මා තමුන්නාන්සේලාගෙන් ඉතා ඕනෑකමින් අවසාන වශයෙන් ඉල්ලා සිටිනවා. මේ පිළිබඳව හිතා බලන විට, මතක් කළ යුතු තවත් වැදගත් කරුණක් තිබෙන බව පෙනී යනවා. ක්‍රීඩා පිළිබඳව දීර්ඝ වශයෙන් විවරණයක් කරන්නට මා අදහස් කරන්නෙ නෑ. මේ සම්බන්ධයෙන් නුසුදුසු දේවලුත් සමහර ගරු මන්ත්‍රීවරුන් විසින් කියන්නට යෙදුණා. අන්ධානුකරණයෙන්, කරන්නන් වාලේ අපේ රටට යම් ක්‍රීඩා ඇතුළු කිරීම සමහර විට භයානක වන්න පුළුවනි. එමගින් සමහර විට බලාපොරොත්තු වන පරමාර්ථය සාර්ථක නොවන්න පුළුවනි; පරමාර්ථයෙන් බැහැර යන්න පුළුවනි. එම නිසා ජනතාව ගෙ ගති පැවතුම් යනාදිය සලකා බලා ඇත්ත වශයෙන්ම ජනතාවගෙ සෞඛ්‍ය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වර්ධනයට අවශ්‍ය ක්‍රීඩා මොනවාද ජනප්‍රිය ක්‍රීඩා මොනවාද යන කරුණු ගැන සිතා බලා ශාස්ත්‍රීය වශයෙන් ඒ ගැන යළිත් හිතා සැලැස්ම සකස් කරන ලෙස ඉල්ලා සිටිනව.

තමුන්නාන්සේලා අපේ අදහස්ද පිළිගෙන රටේත් ජනතාවගේත් වර්ධනය සඳහා සැලැසුම් සකස් කිරීමට උත්සාහ කරනොත් තමුන්නාන්සෙලාගෙ මේ වැඩ පිළිවෙළ සාර්ථක කර ගැනීමට අපගේ ආශීර්වාදයත් සහයෝගයත් දෙන බව ප්‍රකාශ කරන අතර, ජනතාවගේ සෞඛ්‍ය වර්ධනය සඳහා සැලැස්ම සකස් කරන ලෙස ඉල්ලීමින් මගේ වචන සංක්ෂිප්ත කරනවා.

අ. භා. 2.21

**ලෙස්ලි ගුණවර්ධන මයා.**

*(திரு. லெஸ்லி குணவர்தன)*

**(Mr. Leslie Goonewardene)**

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ඇමතිතුමා පිළිතුරු දෙන්නට පෙර එතුමාට ඉදිරිපත් කළ යුතු කරුණක් තිබෙන ව. මා මෙතෙක් නොදැන සිටි කරුණු රාශියක් අද මේ සාකච්ඡාවෙදි මට දැන ගන්න ලැබුණ. මා එසේ කියන්නෙ මෙන්න මේ කරුණ නිසයි: ක්‍රීඩා ඇමති අංශය යනුවෙන් අලුත් ඇමති අංශයක් ඇති කළ බව අපට දැන ගන්න ලැබුණු නමුත් ඒ අංශයට කුමන විෂයයන් අඩංගු වෙනවිද් යන්න අපට මෙතෙක් දැන ගන්න ලැබී නැහැ. කුමනාකාරයේ වැඩ කොටසක් මේ ඇමති අංශයෙන් කරන්නට බලාපොරොත්තු වෙනවද යන බව විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන් වන අපට මෙතෙක් කිසිම විධියකින් දැනගන්න ලැබුණෙ නැහැ. එම නිසා, ක්‍රීඩා අමාත්‍යාංශය මගින් මේ විධියෙ වැඩ කොටසක් කරන්න බලාපොරොත්තු වෙනවායයි අපට විස්තර වශයෙන් කියා දෙන ලෙස මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනව.

අද මේ සාකච්ඡාවෙදි කථා කළ ගරු මන්ත්‍රීවරුන් කිප පොලක්ම ක්‍රීඩා භූමි ගැන විශෙෂයෙන් සඳහන් කළා. ක්‍රීඩා භූමි සැපයීමේ කාර්යයත් මේ ක්‍රීඩා අමාත්‍යාංශය බාර ගෙන තිබෙනවැයි මම නවම දන්නෙ නෑ. නිදසුනක් වශයෙන් මගේ කොට්ඨාශයෙන් එක් කරුණක් ඉදිරිපත් කරන්නට පුළුවනි. 25,000 ක පමණ ජනඝණයක් වාසය කරන කෙසෙල් වතු සුළු නගර සභා ප්‍රදේශය නමින් පළාතක් මගෙ කොට්ඨාශයෙහි තිබෙනව. එම නගර සභාව ඒ ප්‍රදේශයෙහි ක්‍රීඩා භූමියක් පිහිටුවීමට දැන් අවුරුදු 6ක 7 ක පමණ කාලයක් තිස්සෙ ක්‍රියා කරගෙන යනව. පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලැබුණු රුපියල් 9,000 ක පමණ මුදලකුත් පැත්තක තබා තිබෙනව. මා හිතන හැටියට, එම සුළු නගර සභාවේ සභාපති මහත්මයාගේ අදහස තව මුදලක් පළාත් පාලන අමාත්‍යාංශයෙන් ඉල්ලා සිටීමයි. ක්‍රීඩා භූමි පිළිබඳ කටයුතු බාරව තිබෙන්නෙ ක්‍රීඩා ඇමති අංශයට නම්, එකී සුළු නගර සභාවෙ ඉල්ලීම කරන්නට තිබෙන්නෙ පළාත් පාලන අමාත්‍යාංශයෙන් නොව ක්‍රීඩා අමාත්‍යාංශයෙනුයි. මා ඊයෙ පෙරෙසිදා ඒ ස්ථානය බලන්න ගියා. ඊට විශාල වියදමක් වුවමනා කරනව. නිවාස ක්‍රමයක් ඇති කිරීමට එම ඉඩම සුදුසු බවත් ක්‍රීඩා භූමියක් සඳහා එතරම් හොඳ ඉඩමක් අවශ්‍ය නැති බවත් ගොඩ නැගිලි හදන්නට බැරි, වතුරටද යටවන ඉඩමක් ක්‍රීඩා භූමිය සඳහා තෝරා ගන්නට පුළුවන් නම් හොඳ බවත් මා එම සුළු නගර සභාවේ සභාපතිතුමා සමඟ සාකච්ඡා කළ අවස්ථාවෙදි කිව්ව. පළාත් පාලන ඇමතිතුමාට මේ පිළිබඳව කරුණු ඉදිරිපත් කරන්නට අදහස් කරගෙන සිටි නමුත්, එම කරුණු ඉදිරිපත් කළ යුත්තේ ක්‍රීඩා ඇමතිතුමාට බව මෙම සාකච්ඡාවෙදි මට පෙනී ගියා. මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් ක්‍රියා කළ යුත්තේ කුමන ආකාරයකටද යන වග විරුද්ධ පක්ෂයෙ මන්ත්‍රීවරුන් වශයෙන් අපගේ දැන ගැනීම සඳහා ප්‍රකාශ කරන ලෙස මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනව.

පානදුරේ ප්‍රදේශයට ක්‍රීඩා උපදේශකයින් දෙදෙනකු පත් කර යවා තිබෙන බව අහම්බෙන් වගේ මට දැනගන්න ලැබුණා. ඒ දෙදෙනාගෙන් ප්‍රයෝජන ගන්නෙ කෙසේද කියා මා දන්නෙ නැහැ. මීට කලින් නම් පාසැල් මාගීයෙන් තමයි ඒ කටයුතු කළේ. නමුත් දැන් කුමන සැලැස්මක් උඩ මේ දෙදෙනාගෙන් ප්‍රයෝජන ගන්න බලාපොරොත්තු වෙනවාද කියා මා දන්නෙ නැහැ. ප්‍රදේශයේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලෙස්ලි ගුණවර්ධන මයා.]

තිබෙන ක්‍රීඩා සංගම්වලට මේ දෙදෙනාගේ සේවය ලැබෙනවාද කියා මා දැනගන්නට සතුටුයි. එහෙම නැත්නම් වෙනයම් ක්‍රමයක් තිබෙනවාද? මේ දෙදෙනාගේ සේවය ලබා ගත හැක්කේ කොයි ආකාරයටද, කොයි විධියටද කියා අපි දැන ගන්නට සතුටුයි. දැන් ශාරීරික අභ්‍යාස උපදේශකවරුන් 150 ක් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ජනසතු සේවා අමාත්‍යාංශය යටතට භාර ගෙන තිබෙනව. ඒ 150 දෙනා කොයි ආකාරයට සේවයේ යොදවන්නට යනවාද, ඔවුන්ගේ සේවය මහජනතාවට කොයි ආකාරයෙන් ලබා ගන්නට පුළුවන්ද යන කරුණු ගැනත් අපට විස්තරයක් කරන මෙන් මා ඉල්ලා සිටිනවා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
**(The Hon. Iriyagolle)**

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යාංශයත් මේකට ඇතුළත් නිසා මමත් වචන සවලාපයක් කථා කරන්නට බලාපොරොත්තු වෙනව. අධ්‍යාපන අමාත්‍යාංශයේ මේ ක්‍රීඩා උපදේශක ගුරුවරුන් තුන්හාරසියයකට කිට්ටු ගණනක් හිටිය.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
**(Mr. Leslie Goonewardene)**

දැන් කී දෙනෙක් ඉතිරිවී සිටිනවද?

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
**(The Hon. Iriyagolle)**

දැන් 150 ක් අඩුවෙන් ඉන්නව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පිළිබඳව ඇතිවූ සාකච්ඡාවකදී අධ්‍යාපන අමාත්‍යාංශයේ ශාරීරික අභ්‍යාස උපදේශක ගුරුවරුන්ගෙන් 150 දෙනෙක් හා පරීක්ෂක වරුන් 5 දෙනෙක් ජනසතු සේවා අමාත්‍යාංශයේ ක්‍රීඩා අංශයට භාර දෙන්නට තීරණය කළා. මගේද අනුමැතිය ඇතිව අපේ මුළු කැබිනට් මණ්ඩලයම එවැනි තීරණයකට එළඹුණේ පාඨශාලා ශිෂ්‍යයින්ගේ ශාරීරික අභ්‍යාසවලටත් ක්‍රීඩාවලටත් හානියක් නොවන පරිද්දෙන් ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්ට පුළුවන් බව අපට පෙණුනු නිසයි. පාඨශාලා ශිෂ්‍යයින්ගේ ශාරීරික අභ්‍යාස පිළිබඳව මේ ජනසතු සේවා අමාත්‍යාංශයේ ක්‍රීඩා අංශයේ ශාරීරික අභ්‍යාස උපදේශකවරුන්ගේ සම්බන්ධයක් නැහැ. මා හිතන හැටියට ඒ අයගෙන් විශේෂයෙන්ම බලාපොරොත්තු වෙන්නෙ—ජනසතු සේවා ඇමතිතුමා ඒ ගැන විස්තරයක් කරාවි—පාඨශාලාවෙන් වෙන්ව ගිය තරුණ තරුණියන්ට හා ගම්බද ප්‍රදේශවල සිටින වැඩිහිටියන්ට අනුබල දී ක්‍රීඩා දියුණුවට විධිවිධාන යෙදීමයි. පාඨශාලා ක්‍රීඩා කටයුතු ඉතා දියුණු අන්දමින් කෙරී ගෙන ගියාය කියා විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් ප්‍රකාශ කළා. ඒ වැඩ කටයුතුවලට මෙයින් හානියක් වෙයිද කියා සමහර ගරු මන්ත්‍රීවරුන් සැකයක් පහළ කළා. එහෙම එකක් වෙන්නෙ නැහැ. මේ අංශ දෙකේ සහයෝගයෙන් තමයි මේ වැඩේ කෙරී ගෙන යන්නෙ. යම්හෙයකින් එවැනි හානියක් වන තැනට කරුණු යෙදුණහොත් ඒ පිළිබඳව ප්‍රතිකර්ම යෙදීමට අපේ අමාත්‍යාංශය බලාපොරොත්තු වෙනව. එමනිසා මේ වැඩ පිළිවෙළ ගැන ගරු මන්ත්‍රීවරුන් භයක් ඇති කර නොගත යුතුයි.

පාඨශාලාවල ක්‍රීඩා භූමි පිහිටුවා ගෙන යාම දිගටම කෙරී ගෙන යනව. මුදල් තත්ත්වය අනුව අවුරුද්දෙන් අවුරුද්ද වැඩි වැඩියෙන් පාඨශාලාවල ක්‍රීඩා භූමි පිහිටුවීමට විධිවිධාන සලසා තිබෙනව. ඇත්ත වශයෙන්ම අපේ පාඨශාලා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ක්‍රීඩා කෞශල්‍යය ලෝකයේ ඕනෑම රටක පාඨශාලා ශිෂ්‍යශිෂ්‍යාවන්ගෙ ක්‍රීඩා කෞශලයට සමාන බව මා සන්තෝෂයෙන් ප්‍රකාශ කරන්නට සතුටුයි. අපේ වාර්ෂික ක්‍රීඩා සන්දර්ශන පෙලපාළි බැලුවොත් ලංකාවෙ පාඨශාලා ශිෂ්‍යශිෂ්‍යාවන් ක්‍රීඩා හා ශාරීරික අභ්‍යාස අතින් මේ තරම් දියුණුද කියා තමුන්නාන්සේලා පුදුම වේවි. මේ වාරයේ වාර්ෂික ක්‍රීඩා සන්දර්ශනයට මේ සියලුම ගරු මන්ත්‍රීවරුන්ට ආරාධනා කරන්නට මා බලාපොරොත්තු වෙනව. එම නිසා මේ වැඩ පිළිවෙළ සම්බන්ධයෙන් තමුන්නාන්සේලා කිසිම භයක් ඇති කර ගන්නට එපා. මේ 150 දෙනා යාමෙන් පාඨශාලා ශිෂ්‍යයින්ගේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ක්‍රීඩා හා ශාරීරික අභ්‍යාසවලට බාධාවක් වෙයිද කියා භයක් ඇති කර ගන්නට එපා.

ඒ සමගම මා තවත් කාරණයක් කියන්නට සතුටුයි. මේ ශාරීරික අභ්‍යාස උපදේශකවරුන්ගෙන් විශේෂ පුහුණුවක් ලත් පාඨශාලාචාර්‍යවරුනුත් විශාල සංඛ්‍යාවක් අපේ පාඨශාලාවල ඉන්නවා. විදේශවලට ගොස් විශේෂඥතා ලබාගෙන නැතත් මෙහිදී ලබා ගත් පළපුරුද්ද සහ පුහුණුව ඔවුන්ට තිබෙනවා. එක්සිය පණස් දෙනා නැති වීමෙන් ඇති විය හැකි පාඩුව පිරිමසා ගන්නට ඔවුන්ට පුළුවනි. අන්න ඒ කාරණය පමණක් දන්වන්ටයි මා බලාපොරොත්තු වන්නෙ. ක්‍රීඩා අංශය භාර ගරු ඇමතිතුමා ඒ 150 දෙනා වැඩට යොදා ගන්න ආකාරය ගැන වැඩ පිළිවෙළක් සකස් කරනු ඇතැයි මා කල්පනා කරනවා.

**කාරියවසම් මයා.**
*(திரு. காரியவசம்)*
**(Mr. Kariyawasam)**

අපේ පැත්තේ නම් එහෙම අය නැහැ.

**ගරු ඊරියගොල්ලෙ**
*(கௌரவ ஈரியகொல்ல)*
**(The Hon. Iriyagolle)**

මුළු දිවයින පුරාම එක වරටම ක්‍රියාත්මක වන විධියේ වැඩ පිළිවෙළක් දීපව්‍යාප්ත ව්‍යාපාරයක් හැටියට යෙදීමට තරම් ලංකාව තවම පොහොසත් නැහැ. අපේ කාලය ඇතුළතදීම ඒ තත්ත්වය ලබා දීමට බලාපොරොත්තු වෙනවා. ඒ ගැන එපමණයි කියන්නට මා බලාපොරොත්තු වන්නෙ.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
**(Mr. Tudawe)**

බොහෝ ප්‍රදේශවල උපදේශකවරුන් නැහැ.

**ගරු ඊරියගොල්ලෙ**
*(கௌரவ ஈரியகொல்ல)*
**(The Hon. Iriyagolle)**

මාතර ගරු මන්ත්‍රීතුමා පසුගිය දා මාතර දී දකින්නට ඇති නේද? එතුමා එදා මාතර උත්සවයට පැමිණ සිටියා නොවෙයිද?

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
**(Mr. Tudawe)**

සිටියා.

**ගරු ඊරියගොල්ලෙ**
*(கௌரவ ஈரியகொல்ல)*
**(The Hon. Iriyagolle)**

අප බලාපොරොත්තු වන තරම් උසස් තත්ත්වයට තවමත් අප පැමිණ නැතත්, සෑහෙන තරම් උසස් තත්ත්වයට දියුණු වූ ගුරුවරුන් අපට අද සිටින නිසා කිසිම බාධාවක් නැතිව ඒ වැඩ කටයුතු කෙරෙන තැනට සලස්සන බව පමණක් මේ අවස්ථාවෙදි කියන්න කැමතියි.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்சா சிறிவர்தன)*
**(Mr. de Zoysa Siriwardena)**

මේ අවුරුදු දෙකේදී කෙරෙන්න ඕනෑ.

අ. භා. 2.32

**ගරු සුගතදාස**
*(கௌரவ சுகததாச)*
**(The Hon. Sugathadasa)**

I am indeed happy to answer some of the questions raised by some of the hon. Members in respect of this Supplementary Estimate before the House. I am however surprised to note that some of the hon. Members did not know of the existence of a Sport Division under the Ministry of Nationalized Services. This is utter ignorance, if I may say so.—[*Interruption*]. I will prove it. You have been a Member of this House for the last two years, and in the Budget that was presented last year there was a suggestion for the creation of a Sport Division and an allocation too was made for the purpose.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඩී. පී. ආර්. වීරසේකර මයා. (දෙහිඔවිට)

(திரு. டீ. பீ. ஆர். வீரசேக்கர—தெஹியோவிற்ற)

(Mr. D. P. R. Weerasekera—Dehiowita)

What about football ?

ගරු සුගතදාස

(கௌரவ சுகததாச)

(The Hon. Sugathadasa)

You like football ? I will teach you that also. You have a propensity for such things.

The hon. Member for Panadura (Mr. Leslie Goonewardene) stated that he did not know of the existence of a Sport Division under the Ministry of Nationalized Services.

ලෙස්ලි ගුණවර්ධන මයා.

(திரு. லெஸ்லி குணவர்தன)

(Mr. Leslie Goonewardene)

I said that I did not know the sphere covered by this section.

ගරු සුගතදාස

(கௌரவ சுகததாச)

(The Hon. Sugathadasa)

I shall reply to you. Some of the hon. Members said that they did know of this. If the hon. Member for Kolonnawa (Mr. T. B. Ilangaratne) had said so I could have understood it and excused him because he came into this House only the other day.

ඉලංගරත්න මයා.

(திரு. இலங்கரத்ன)

(Mr. Ilangaratne)

I know that you are interested in sports. During our time we used to grant you the necessary exchange to go abroad in connection with sports activities.

ගරු සුගතදාස

(கௌரவ சுகததாச)

(The Hon. Sugathadasa)

At the same time some of the hon. Members said that they did not know the objectives of the Sport Division. I shall read out the objectives. I think in the course of the last Budget Debate the details were given. Now, they have either forgotten them or they are pretending to have forgotten them. Anyway, I shall now give the reason and the purpose for the creation of this section for the information of hon. Members. I hope that when the next Budget comes they will not repeat the same arguments, unnecessarily and waste the time of the House. The objectives are :

(*a*) to foster, promote, organize and encourage the development of sport and provide facilities for sport generally throughout Ceylon with a view to promoting the physical welfare of the people ;

(*b*) to formulate and implement measures to raise the standard of sport in Ceylon.

To achieve these objectives the department proposed to :

(1) Establish and maintain facilities for sport.

(2) Encourage competition on a local, district, national or international basis.

(3) Undertake, or organize and finance inter-district competitions for youths.

(4) Provide grants, scholarships, technical assistance, sports gear and equipment to National Controlling Bodies, Local Bodies and Voluntary Sports Organisations.

(5) Maintain and improve the standard of judging, umpiring and refereeing of sports and of officiating at sports events and to conduct courses for such purposes and such other responsibility as may be assigned by the Ministry."

Those are the objectives.

ලෙස්ලි ගුණවර්ධන මයා.

(திரு. லெஸ்லி குணவர்தன)

(Mr. Leslie Goonewardene)

What about playgrounds ?

ගරු සුගතදාස

(கௌரவ சுகததாச)

(The Hon. Sugathadasa)

I shall come to that. Let me answer the points one by one. I am sorry that I have to take a longer time than I thought I would.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

One or two hon. Members said that in granting money and in the establishment of playgrounds throughout the country we have adopted a partisan attitude. In this connection I wish only to draw the attention of the House to the way in which assistance was given in the past especially to areas represented by the Members of the Opposition and how it is being done now. The hon. Member for Teldeniya (Mr. Raja Kulatillake) said that there is no playground in his constituency. I shall deal with that matter later.

Assistance has been given to the following local bodies : Galahitiyawa Village Council which is in the Gampaha Electorate, Baddegama Village Council, Matugama Town Council, Matara Urban Council—the hon. Member for Matara (Mr. Tudawe) did mention that we have given some money to the Matara Urban Council—Badulla Municipal Council, Kalutara Urban Council, Teldeniya Town Council, Anuradhapura Preservation Board. We give the money to local authorities.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

You are mentioning only the Electorates of Opposition Members.

**ගරු සුගතදාස**
*(கௌரவ சுகததாச)*
(The Hon. Sugathadasa)

Yes. I am replying to the charge made against us. The complaint made by Opposition Members was that nothing had been done for their electorates.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)

Who made the charge ?

**ගරු සුගතදාස**
*(கௌரவ சுகததாச)*
(The Hon. Sugathadasa)

Two or three Members of the Opposition made that charge, particularly the Member for Walapane (Mr. T. B. M. Herath).

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)

Are they all not honourable Members ? They are being referred to merely as " Members ".

**ගරු සුගතදාස**
*(கௌரவ சுகததாச)*
(The Hon. Sugathadasa)

They are very honourable Members, including the hon. Member himself.

Further, we have given assistance to the Yatiyantota Town Council. There we are trying to get a suitable block of land. We have also given assistance to the local bodies of Elpitiya, Maharagama, Minuwangoda, Dehiowita, Balangoda, Kegalle, and Eheliyagoda. What have hon. Members got to say about all this assistance that has been given to the electorates of Opposition Members ?

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)

For what purpose was it given ?

**ගරු සුගතදාස**
*(கௌரவ சுகததாச)*
(The Hon. Sugathadasa)

The assistance was given either to open new playgrounds or to improve the existing playgrounds. The list I have read to you just now will prove that there has been no partiality on the part of my Ministry in giving assistance for playgrounds.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

You have not given anything to Kolonnawa.

**ගරු සුගතදාස**
*(கௌரவ சுகததாச)*
(The Hon. Sugathadasa)

With regard to Kolonnawa I must say that the Hon. Minister of Health has agreed to give about ten acres of land for a playground for this area.


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

Lunatic Asylum.

**ගරු සුගතදාස**
*(கௌரவ சுகததாச)*
(The Hon. Sugathadasa)

Yes. I think it is somewhere there.

You will see that hon. Members have wasted their time making charges without knowing what they were speaking about. That is the position.

Hon. Members, particularly the hon. Member for Walapane and the hon. Member for Dambulla (Mr. T. B. Tennekoon), criticized us saying that we had not done anything to foster national games. I like to ask hon. Members, particularly those two,—unfortunately they are not present—what they did when their Government was in power during the last nine years.

We have done something in regard to national games and we are continuing with that work but they are criticizing us merely because they want to talk.

With regard to the 150 officers who were transferred from the Ministry of Education to the Ministry of Nationalized Services, they are to carry on their activities in regard to organizing and improving the standard of sport in co-ordination with the school authorities. They are not going to hamper those activities.

My idea is to have at least one playground in every electorate. I have already mentioned the electorates to which assistance has been given. [*Interruption*]. I can give the amount of the assistance given to each electorate. That will take a little time. The Member for Matara himself said that Matara had received Rs. 50,000. The Member for Panadura says that he wants assistance for his electorate. I am prepared to give that assistance whether he asks for it or not. It is my duty and my responsibility to do so.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වල පනේ ගරු මන්ත්‍රීතුමාගේත්, දඹුල්ලේ ගරු මන්ත්‍රීතුමාගේත් කථාවලට පිළිතුරු වශයෙන් වචන දෙක තුනක් සිංහලෙන් කථා කරන්න බලාපොරොත්තු වෙනව. ජාතික ක්‍රීඩා ගැන එතුමන්ලා කථා කළා. ජාතික ක්‍රීඩා කියන්නෙ මොනවටද කියන්න මම නම් දන්නෙ නැහැ. එයින් එතුමන්ලා අදහස් කළේ මොනවද කියා තේරුම් කළා නම් ප්‍රයෝජනයක් වෙන්න තිබුණා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

සමාජසේවා ඇමතිතුමා කියලා දුන්නෙ නැතුවායැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

කළගෙඩි සෙල්ලම වගේ සෙල්ලම්වලට වෙන්න ඇති.

**ගරු සුගතදාස**
*(கௌரவ சுகததாச)*
(The Hon. Sugathadasa)

මම නම් දන්නෙ නැහැ මොනව ගැන හිතාගෙන කිව්වද කියල.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

පොර පොල් ක්‍රීඩාව වැනි ක්‍රීඩා ජාතික ක්‍රීඩා හැටියටයි සලකන්නෙ.

**ගරු සුගතදාස**
*(கௌரவ சுகததாச)*
(The Hon. Sugathadasa)

ඒ ගරු මන්ත්‍රීතුමන්ලා මෙතන නැහැ. හිටියා නම් අහගන්නවත් තිබුණා. ඒ කොයි හැටි වෙතත් **හැන්සාඩ්** වාර්තාවෙන් වත් බලා ගන්න පිළිතුරක් දෙන්නයි මගෙ කල්පනාව. ඒ ගරු මන්ත්‍රීතුමන්ලාගේ ශාරීරික සංවර්ධනය දිහා බලන කෙනෙකුට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

හොඳටම පෙනී යනවා උන්නැහේලා මොන විධියේ ජාතික ක්‍රීඩාවන් කර තිබෙනවිද යන්න. මේ විධියට කථා කරන්න සිදු වීම ගැන මා කනගාටු වෙනව. එපමණයි ඒ ගැන කියන්න තියෙන්නෙ.

දඹුල්ලෙ ගරු මන්ත්‍රීතුමා මෙතන නැහැ. එහෙත් එතුමා ජාතික ක්‍රීඩා ගැන බොහොම කථා කළා. එතුමට ජාතික ක්‍රීඩා ගැන හොඳ හැඟීමක් තිබෙන බව එතුමා කථා කළ ආකාරයෙන් පෙනී ගියා. එතුමට හොඳ ජාතික මමත්වයක් තිබෙන බවත් ඒ කථාවෙන් පැහැදිලි වුණා. කාලයක් තිස්සෙ මා එතුමගෙ ජාතික ක්‍රීඩා අභිලාෂය ගැන දැනගෙනයි ඉන්නෙ. මේ ගරු සභාව ඇතුළෙත් ඒ ගැන කියැවී තිබෙනව. එසින් මේ ගරු සභාව තුළත් විශාල ලෙස කරදර ඇති වුණා. ශ්‍රාවස්තියෙදිත් ජාතික ක්‍රීඩාවල යෙදුණු බව ඒ දවස්වල අපට අහන්නට ලැබුණා. ගරු මන්ත්‍රීතුමා මෙතන නැති අවස්ථාවක එතුමා ගැන මීට වඩා දීර්ඝ වශයෙන් යමක් කියන්නට මා කැමති නැහැ. ජාතික ක්‍රීඩා ගැන කථා කරන අවස්ථාවෙ නම් එතුමා බොහොම විනෝද වෙමිනුයි කථා කළේ. ඒ කථා වෙන්ම අපට පෙණුනා එතුමා බලවත් උනන්දුවකින් ජාතික ක්‍රීඩා සම්බන්ධ යෙන් ක්‍රියා කර තිබෙන බව.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
**(The Hon. Iriyagolle)**
සවස.

**ගරු සුගතදාස**
*(கௌரவ சுகததாச)*
**(The Hon. Sugathadasa)**
සවසද, රෑද, දවාලෙද කියල කියන්න මම දන්නෙ නැහැ. ජාතික ක්‍රීඩාවල යෙදෙන වෙලාව මම දන්නෙ නැහැ. උන්නැහේ දැනගෙන හිටියද දන්නෙ නැහැ. දැන ගෙන හිටියා නම් කියන්න ඕනෑ. මම නම් කවදාවත් හිතුවෙ නැහැ මේ විවාදය මේ තරම් දුරට යාවිය කියා.

අකුරැස්සේ ගරු මන්ත්‍රීතුමා (වෛද්‍ය චාර්ය ඒ.ස්. ඒ. වික්‍රමසිංහ) ක්‍රීඩා පිට්ටනියක් සම්බන්ධයෙන් සුළු නගරසභාවට කරදරයකට මුහුණ පාන්නට සිද්ධ වෙලා තිබෙන බව කියා සිටියා. ඒ ගැන සොයා බලන්නට මම පොරොන්දු වුණා. මොන විධියේ සහනයක් දෙන්න පුළුවන් ද කියා කල්පනා කර බලන්නම්. මාතර ගරු මන්ත්‍රීතුමා (තුඩාවෙ මයා.) ප්‍රශ්නයක් ඉදිරිපත් කළා. ඒ ප්‍රශ්නය ගැන සොයා බලා ඒ ගරු මන්ත්‍රීතුමාට මම ලියා එවන්නම්.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
**(Mr. Tudawe)**
බස් නැවතුම්පොළ ගැනද?

**ගරු සුගතදාස**
*(கௌரவ சுகததாச)*
**(The Hon. Sugathadasa)**
නැහැ, නැහැ, පිට්ටනිය ගැන. ඒජන්තතුමාට නැවතත් භාර දෙනවද කියන එකයි ඇහුවෙ. මම ඒ ගැනත් සොයා බලන්නම්. මම බොහොම සන්තෝෂයි මේ අවස්ථාවෙදි ගරු මන්ත්‍රීන් විශාල උනන්දුවක් දැක්වීම ගැන. පානදුරේ ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ කරුණු ගැනත් හැකි තරමට වැඩ කරන බව කියන්න කැමතියි. එහෙමයි බලා පොරොත්තු වන්නෙ. ඒවා කරන්නයි අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් 150 දෙනකු ගන්න යන්නෙ. ඒ ගණන මදි. අපට නියම ආකාරයට වැඩ කරගෙන යන්න ඒ ගණන මදි වුණත් මතුවට තව තවත් උදවිය යොදාගෙන වඩ වඩාත් හොඳින් වැඩ කටයුතු කරගෙන යාමට අද හස් කරනව.

**ප්‍රශ්නය විමසන ලදින් සභාසම්මත විය.**
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
*Question put, and agreed to.*

PUBLIC LIBRARY
JAFFNA.
Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

# පරිපූරක මුදල :
## සමාජසේවා දෙපාර්තමේන්තුව : විපත් සහන

குறைநிரப்புந் தொகை : சமூக சேவைத் திணைக்களம் : கஷ்ட நிவாரணம்

SUPPLEMENTARY SUPPLY : DEPARTMENT OF SOCIAL SERVICES : DISTRESS RELIEF

අ. භා. 2.50

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න (සමාජ සේවා ඇමති)**

(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன— சமூக சேவை அமைச்சர்)

(The Hon. N. H. A. M. Karunaratne—Minister of Social Services)

මෙම යෝජනාව මා ඉදිරිපත් කරනවා :

"1966 ඔක්තෝබර් මස 1 වෙනිදාසින් ආරම්භ වී 1967 සැප්තැම්බර් මස 30 වෙනිදාසින් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවය සඳහා ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් හෝ ලංකාණ්ඩුවේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ලංකාණ්ඩුවට සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ලංකාණ්ඩුව විසින් ණයට ලබාගන්නා මුදලකින් හෝ රුපියල් විසිහත් ලක්ෂ පනස් දහකට (රු. 27,50,000) නොවැඩි සම්පූර්ණ මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත පෙනෙන උපලේඛනයේ නියමිත පරිදි වැය කළ යුතුය.

**උපලේඛනය**

| | |
|---|---|
| ශීර්ෂය : 181—සමාජසේවා දෙපාර්තමේන්තුව ... ... | රු. |
| සම්මතයේ අංකය : 4—දෙපාර්තමේන්තුව විසින් සැපයෙන සේවා පුනරාවර්තන වියදම් ... | 27,50,000 " |

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා සිතනවා මේ සම්බන්ධයෙන් සාමාන්‍ය විස්තරයක්වත් ඉදිරිපත් කිරීම අවශ්‍ය වේවිය කියා. නියඟයක් ඇති වුණත්, අවශ්‍ය පමණට වඩා වැස්ස ඇති වුණත්, ගොවි ගෑන් පාළු වුණත්, ඒවාට සුදුසු පරිදි ආධාර සඳහා මුදල් ගෙවන්ට සමාජ සේවා දෙපාර්තමේන්තුවට සිදු වෙනවා. ජලගැලීම්, සුලි සුළං ඇතිවීම්, යනාදී සාවාභාවික ආපදා වලදී ආධාර දෙන්ට සමාජ සේවා දෙපාර්තමේන්තුව සූදානමින් සිටින්ට ඕනෑ. පසු ගිය අවස්ථාවලදි ජලගැලීම් යනාදී සාවාභාවික



උපද්‍රව ඇතිවීම හේතුකොටගෙන ඒ සඳහා වෙන් කර තිබුණු මුදල් ප්‍රමාණය මදි වූ හෙයින් ඒ සඳහා රුපියල් විසි ලක්ෂයක මුදලක් ලබා ගන්ට සිදු වුණා. ඉදිරි කාලයේ පිං පඬි දීම යනාදී හදිසි කටයුතු සඳහාත් රුපියල් 7,50,000 ක පමණ මුදලක් ඉතිරි කරගන්ට ඕනෑ. [බාධා කිරීමක්] විසි ලක්ෂය ලබා ගන්නෙ ගත්තු මුදල පියවීමටයි. මා සඳහන් කළ කටයුතුවලට තව 7,50,000 ක මුදලක් තබාගන්ට වෙනවා. එම නිසයි රුපියල් 27,50,000 ක මුදලක් අවශ්‍යව තිබෙන්නෙ.

තමුන්නාන්සේලා මේ ගැන දීර්ඝ සාකච්ඡාවක් කරාවිය කියා මා විශ්වාස කරන්නෙ නැහැ. තමුන්නාන්සේලාගේ සහයෝගය දී මෙය ඉක්මනින් සම්මතකර ගන්ට ආධාර දෙනවා ඇතැයි මා විශ්වාස කරනවා. රුවන්වැල්ල, යටියන්තොට, මාතර, ගාල්ල, වැනි ප්‍රදේශවලට හදිසි යෙන්ම මුදල් සපයන්ට වෙලා තියෙනවා. එනිසයි, මෙය ඉක්මනින්ම සම්මත කර ගන්ට උත්සාහ දරන්නෙ. ගාලු නගර සභාවට මුදලක් දෙන්ට නීතියෙන් ඉඩ ප්‍රස්තාව නොතිබුණත් කැබිනට් අනුමැතියක් ඇතිව ගාලු නගර සභාව විසින් දැරිය යුතු මුදලක් සමාජ සේවා අමාත්‍යාංශය මගින් මේ වතාවේදී දරන්ට කැමැත්ත දුන් බව දන්වන්ට කැමතියි. කඩා වැටුණු ගෙවල් අයිතිකරුවන්ට හෝ ගංවතුරෙන් අනාථ වූ උදවියට යම් යම් ආධාර නිසි පරිදි නොලැබුණා නම්, මට ඒ බව දන්වන ලෙස ඉල්ලා සිටිනවා. එතකොට ඒවා ගැන නිසියාකාර පරීක්ෂා කර බලා සුදුසු පරිදි කටයුතු යොදන්ට පුළුවනි.

දැනටමත් ජලගැලීම් කීපයක් ඇති වී තිබෙනවා. ඒ සෑම අවස්ථාවකදීම අපි ජනතාව බඩගින්නෙ නොතබා ඔවුන්ට වුවමනා කරන කෑම බීම උපකරණ යනාදිය සපයා දුන් බව තමුන්නාන්සෙල දන්නවා ඇති. ඒ සෑම දෙයක්ම අපක්ෂපාතීව කරන බවට අපි පොරොන්දු වෙනවා.

**ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදි.**

வினா எடுத்தியம்பப்பெற்றது.

*Question proposed.*

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

අ. භා. 2.54

**වීරසේකර මයා.**
*(திரு. வீரசேகர)*
(Mr. Weerasekera)

ඒයෙ පෙරේදා ගංවතුර ගැලීම නිසා දෙහිඕවිට ප්‍රදේශයට සිදු වූ හානිය ගැන වචන සවලාපයක් කියන්ට අදහස් කරනවා. ගරු ඇමතිතුමාට ඒ පළාතෙ තත්ත්වය පිළිබඳව කරුණු අවබොධ කර දීම සඳහායි, මා මේ කරුණු ඉදිරිපත් කරන්නෙ. දෙහිඕවිට නගරයෙ ජල මට්ටම අඩි 24කින් නැග්ග බව තමුන්නාන්සෙල පත්‍ර මාර්ගයෙන් දකින්ට ඇති. කඩමණ්ඩියෙ සෑම තැනක්ම යට වෙලා තිබුණ. සොල්දර තට්ටුවල තිබුණු භාණ්ඩ පවා යට වුණා. සී. ඩබ්ලිව්. ඊ. එක එහෙම ඒ ආකාරයට යට වී තිබුණු බව අපි දන්නවා. එවැනි ගොඩනැගිලිවල හිටි අය ඒවායෙ උළු කැට ගළවාගෙනයි එළියට ඇවිත් තියෙන්නෙ. නගරයෙ උදවියට ඒ තත්ත්වය ටිකක් උසුලන්ට පුළුවන් වෙතත් පනාවල, මානියංගම, උඩහේන්කන්ද, දැරණියගල ප්‍රදේශය සහ ගොඩගම්පල යනාදි පළාත්වල සම්පූර්ණයෙන්ම නැති වූ ගෙවල් ගණන 438 යි. අත්තිවාරම පමණයි, ඉතුරු වෙලා තියෙන්නෙ. රුවන්වැල්ලෙ මන්ත්‍රීතුමත් බොහොම මහන්සි වෙලා වැඩ කළා. තල්දූවෙ හන්දිය ඇත්තෙම නැහැ. පාර විතරයි, ඉතුරු වෙලා තියෙන්නෙ. ආධාර දීම සම්බන්ධයෙන් මේ ඇමතිතුමා ගාල්ලේදි අනුගමනය කළ ප්‍රතිපත්තිය දෙහිඕවිටදිත් අනුගමනය කරන ලෙස මම ඉල්ලා සිටිනවා. රුපියල් 100 ක් නොව 150 ක් ආදයම් ලැබෙන අයටත් ආධාර දෙන්න ඕනෑ. ඒ වගේම ගෙයක් හැදීමට දෙන ආධාර මුදල රුපියල් 450 ක් වත් කළොත් හොඳයි. සුළු මුදලක් දුන්නට කෑගෙන වැඩක් කර ගන්න ලැබෙන්නෙ නැහැ. ඇමතිතුමා සමග මම ඊයේත් මේ ගැන කථා කළා. මුදලක් දුන්න පමණින් වැඩක් වෙන්නෙ නැහැ. මුදල් අරගෙන ගේ හදන්නෙත් කලින් තිබුණු තැනමයි. අනික් අවුරුද්දෙ ඒ ගේ නැවතත් සෝදා ගෙන යනවා. කොයි රජයක් බලයේ සිටියත් ඒ රජයට අවුරුදුපතා ඒ මුදල දෙන්න සිදු වෙනවා. ටෙලිග්‍රෑම් එකක් එවා මම මේ ගැන සාකච්ඡාවක් ඉල්ලුවා. දිසාපතිතුමත් එනවය කිව්වා. රුවන්වැල්ලෙ මන්ත්‍රීතුමත් එනවා. යට වෙන ගෙවල් අයිතිකාරයන්ට කොහෙන් හෝ යට නොවෙන තැනකින් බිම් කොටසක් දීල, අඩුත් ගොඩනැගිල්ල එහෙම තැනක හදන්න නියම කරල මුදල දුන්නොත් හොඳයි. මගේ කොට්ඨාශයේ අය හමු වෙලා එහෙම කරන්නය කියා මමත් ඉල්ලීමක් කරන්නම්. එහෙම කළොත් ඒ පවුල්වලට හානියක් වන්නෙත් නැහැ; අවුරුදුපතා ආධාර දෙන්න සිදු වන්නෙත් නැහැ.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
එහෙම සතුටු නැහැ.

**වීරසේකර මයා.**
*(திரு. வீரசேகர)*
(Mr. Weerasekera)
මම සතුටු කරවා ගන්නම්. එහෙම සතුටු නැති එක් කෙනෙක් දෙන්නෙක් ඉන්න පුළුවන්. එහෙම අසතුටු අයට මම කියන්නම් ලබන අවුරුද්දෙ අපට කරදර කරන්න එපාය කියා. මා උත්සාහ කරන්නෙ දේශපාලන වාසියක් ලබා ගැනීමට මේ ප්‍රශ්නය විසඳන්න නොවෙයි. යම් විධියකින් ඔය වතුර ගැල්ම පැය 4 ක්, 5 ක් තිස්සෙ නැතිව එක වරටම සිදු වුනා නම්—පාන්දර එකට, දෙකට සිදු වුණා නම්—දහස් ගණනක් යට වේවි. වතුර මට්ටම ටිකක් නැංගට පස්සෙ තවත් නගීවිය කියන බලාපොරොත්තුවෙන් ගොඩ බිමට ආ නිසා මිනිස්සු ඉතුරු වුනා. එහෙම නැත්නම් ඔක්කොම ගහගෙන යනවා. එක ලොරියක චැසිය තියෙනවා, කුඹුරෙ යාර දෙසිය ගණනක් එහායින්. බොඩිය කොහේද කියා හොයන්නවත් නැහැ. එක පවුලක 8 දෙනාම මළා. ඒ මළගෙදරට මමත් ගියා.

මම ඇමතිතුමාට ප්‍රශංසා කරනවා, ටෙලිග්‍රෑම් එක ලැබුණු වහාම 1 වැනිදා සාකච්ඡාවක් ඇති කරන්නට පොරොන්දු වීම ගැන. මේ ප්‍රශ්නයට ස්ථිර විසඳීමක් ඇති කළේ නැත්නම් මේ භාරසිය ගණනට යළිත් වරක් මේ වගේ තත්ත්වයට මුහුණ දෙන්න සිදු වෙනවා. බිම් කැබෙල්ලක් දීලා, මුදලුත් දීලා මේ ප්‍රශ්නයට ස්ථිර විසඳුමක් ඇති කළොත් මන්ත්‍රීවරයා හැටියට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වීරසේකර මයා.]

මටත් පහසුයි, ඇමතිතුමාටත් පහසුයි, ඊටත් වඩා ඒ දුප්පත් මිනිසුන්ට බය නැතිව ජීවත් වෙන්නත් පුළුවන් වෙනව.

දිසාපතිතුමත්, දෙහිඕවිට ඩී. ආර්. ඕ. මහත්මයත් පුදුම විධියේ උනන්දුවක් ඇතිව වැඩ කළ නිසා වැඩි ප්‍රමාදයක් නැතිව ආධාර දීමේ වැඩ කරගෙන යන්නට පුළුවන් වුන බව, මගේ යුතුකමක් වශයෙන් සඳහන් කරන්නට ඕනෑ. ඒ නිලධාරීන් බොහොම හොඳට වැඩ කිරීම නිසා ඒ ජනතාවට වැඩි කරදරයක් නැතිව තාවකාලිකව හෝ ඒ ප්‍රශ්නය විසඳා ගන්නට පුළුවන් වෙලා තියෙනව. පින් පඩි දීමේදිත් මේ විධියට ඉක්මනින් කටයුතු කරන ලෙසත් මම ඉල්ලා සිටිනව. පින් පඩියක් ඉතාම අවශ්‍ය කෙනෙක් ආධාරයක් ඉල්ලුවත් එය ලබා ගන්න මාස 4ක්, 5ක් ගත වෙනවා. ඒ තරම් දීර්ඝ කාලයක් පින් පඩියක් නැතිව ඉන්න පුළුවන් කෙනකුට පින් පඩියක් අවශ්‍ය නැහැ. පින් පඩියක් අවශ්‍ය කෙනකුට වහාම පින් පඩියක් දිය යුතුය කියන ප්‍රතිපත්තිය උඩ වැඩ කළොත් මේ සම්බන්ධයෙන් ඒ තරම් ප්‍රශ්නයක් ඇති වෙන්නෙ නැහැ. හුඟක් දෙනෙක් නියම සුදුසුකම් නැතිව පින් පඩි ඉල්ලන බව අපි දන්නව.

තව කාරණයක් ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරන්නට කැමතියි. මේ ජල ගැල්මට අසු වූවන්ට ආධාර කරන්නය කියා නාවික හමුදාවෙන් මහා බෝට්ටු වගයක් ආවාය කියා පත්‍රයේ පළ වුනා. මම දන්නව, ඒ සිද්ධිය. නාවික හමුදාවෙ බෝට්ටු අවිස්සාවේල්ලට ගෙනැවිත් ඇතැම් නීතිඥ මහත්වරුන් ඔවුන්ගෙ යහලුවන් සමග ඇල්සේෂන් බල්ලනුත් පටවාගෙන සවාරි ගියා මිසක් කාටවත් ආධාර කළේ නැහැ. කෘෂිකර්ම හා ආහර ඇමතිතුමගෙ පාලිර්මේන්තු ලේකම්තුමා එය අනුමත කරයි කියා මා විශ්වාස කරනව. ඒ අය කළේ අඩිපුඩි ගහමින් විනෝද ගමන් යෑම පමණයි. මේ ගැන කාට කියන්නද කියන එකයි, ප්‍රශ්නය. මෙය රාජ්‍ය ඇමතිතුමාට කිව යුතු ප්‍රශ්නයක්ද කියා මා ගැසට් පත්‍ර අරගන බැලුව. අගමැතිතුමා රටින් බැහැර ගියත් මේ අංශය—හමුදාව—රාජ්‍ය ඇමතිතුමාට භාර දී නැහැ. අගමැතිතුමා ඒ බලය එංගලන්තයට ගෙන ගොස් තිබෙනව. ඒ නිසා ඒ ප්‍රශ්නය ගැන අගමැතිතුමා ආපසු ලංකාවට ආවාම එතුමාට දන්වන්නට වේවි.

සමාජ සේවා අමාත්‍යාංශයෙන් ලැබුණු ආධාර හා සහයෝගය ගැන ස්තුති කරන අතරම, ලබන මස 1 වන දා කෙරෙන සාකච්ඡාවේදී එක්තරා ප්‍රමාණයකටවත් මේ ප්‍රශ්නයට විසඳීමක් ලබා දීමට කටයුතු කරාවිය කියා විශ්වාස කරන බව පවසමින් මගේ කථාව අවසන් කරනව.

අ. භා. 3.01

**පර්සි වික්‍රමසිංහ මයා.** (කඹුරුපිටිය)

*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ—கம்புறுப்பிட்டிய)*

(Mr. Percy Wickremasinghe—Kamburupitiya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා නියෝජනය කරන්නෙ ගං වතුරට යට වන ප්‍රදේශයක් බව පළමුවෙන් මතක් කරන්නට කැමතියි. සමාජ සේවා ඇමතිතුමා මේ මුදල නොවෙයි, මීට වඩා මුදලක් සඳහා අපේ අනුමැතිය ඉල්ලා සිටියත් ඒ සෑම අවස්ථාවකදීම අප එයට අනුමතිය දෙන බව කියන්නට කැමතියි. සමාජ සේවා අමාත්‍යාංශයට රජයෙන් වෙන් කර තිබෙන මුදල ප්‍රමාණවත් නැහැ. ස්ථිර සැලැස්මක් අනුව ස්ථිර වැඩ පිළිවෙළක් පෙන්නුම් කරන්නට සමාජ සේවා අමාත්‍යාංශයට පුළුවන්කමක් නැහැ. ජල ගැලීම්, ගිනි ගැනීම් හා වෙනත් උපද්‍රවවලින් සිදු වන හානි සියල්ලක් සම්බන්ධයෙන්ම මුහුණ දෙන්නට සමාජ සේවා අමාත්‍යාංශයට සිදු වී තිබෙනව සමාජ සේවා ඇමතිතුමා කොයි තරම් උත්සාහ දැරුවත්, සමාජ සේවා අමාත්‍යාංශයෙන් මුදල් වෙන් කර ඒ ඒ දිස්ත්‍රික්කවල ඇති කච්චේරි ආදියට පිටත් කළත්, ඒ ස්ථානවලදි එම වැඩ පිකක් ප්‍රමාද වන බව කණගාටුවෙන් නමුත් සඳහන් කරන්නට සිදු වී තිබෙනව. සමාජ සේවා අමාත්‍යාංශය දක්වන උනන්දුවම කච්චේරි ආදි අනෙක් ස්ථානවලත් දක්වනවා නම්, මීට වඩා ඉක්මණින් ආධාර දිය යුතු පුද්ගලයන්ට ආධාර ලබා දෙන්නට පුළුවන්කම තිබෙනව.

අපේ පළාත පසුගිය අවුරුද්දෙත් ගං වතුරට යට වුණා. එසේ ගං වතුරට යට වී තව මත් ආධාර මුදල් නොලැබුණු නැන් අපේ ප්‍රදේශයෙ තිබෙනව. මට ලැබුණු ලිපියක් අනුව

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

මම ගිය සතියෙ අපේ පළාතේ එක්තරා ප්‍රදේශයකට ගොස් බැලුව. ඒ ගෙවල් පරීක්ෂා කර ඇතත් මේ වන තුරු ආධාර ලැබී නැහැ. එහෙම වන්නෙ ඇයි? සහනාධාර ඉල්ලා ඉල්ලුම් පත්‍ර යවනව, ප්‍රාදේශීය ආදායම් නිලධාරියාට නැත්නම් කච්චේරියට. එතැනින් ග්‍රාම සේවකයාට යවනව. ඔය ආදි කරුණු නිසා බොහොම ප්‍රමාදවීම් ඇති වෙනව. ඒ හේතු කොට ගෙන, ගංවතුරින් හානි වූ ගෙවල් හිමියන්ට තව මත් ඒ ගෙවල් අලුත්වැඩියා කර ගන්නට පුළුවන් වුණේ නැහැ. සමාජ සේවා අමාත්‍යාංශයෙන් ගෙයක් අලුත්වැඩියා කර ගැනීමට දෙන වැඩිම මුදල රුපියල් 300 යි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
රුපියල් 400 යි.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

පසුගිය වතාවෙ සමාජ සේවා ඇමතිතුමා හමු වී සාකච්ඡා කළ අවස්ථාවෙදි ඒ මුදල රුපියල් 400 දක්වා වැඩි කරන්නට එතුමා පොරොන්දු වුනා. එසේ රුපියල් 400 දක්වා වැඩි කළත්, තවමත් ඇතැම් දිස්ත්‍රික්කවල ගණන් හදන්නෙ, රුපියල් 300 ගණනෙයි. මම මේවා ඇමතිතුමාට පෙන්නුම් කරන්නෙ දෙපාර්තමේන්තුවල ඉකෙරෙන වැරදි හරි ගස්සන්නට ඕනෑ නිසයි.

ගින්නෙන් හෝ ගංවතුරෙන් හෝ හානි වුණු ගෙයක් අසල්වැසියන් හෝ ග්‍රාම සංවර්ධන සමිති හෝ වෙනත් සමිති හෝ එක්තු වී හදා දුන්නොත් ආධාර මුදල් නොදෙන ප්‍රතිපත්තියකුත් තිබෙනව. දෙපාර්තමේන්තුවෙන් ඇවිත් බලා පරීක්ෂණය අවසාන කරන තුරු ඒ තැනැත්තාට ගේ අලුත්වැඩියා කරන්නට පුළුවන්කමක් නැහැ. ගෙයක් පිළිස්සුණොත් ප්‍රාදේශීය ආදායම් නිලධාරියා එන තුරු සුමාන දෙකක් හෝ ඉන්නට ඕනෑ, ගෙට පොල් අතු බැඳ ගන්නට. එතෙක් වැස්සට තෙමී තෙමී හෝ සිටින්නට ඕනෑ. ඒ තත්ත්වය තවමත් තිබෙනව. සමාජ සේවා ඇමතිතුමා සමඟ මේ ගැන සාකච්ඡා කළ අවස්ථාවෙ, ඒ තත්ත්වය වෙනස් කරන බවට එතුමා පොරොන්දුවක් දුන්නා මට මතකයි. එතුමා ඒ සම්බන්ධයෙන් නියෝගයක් නිකුත් කර තිබෙනවාද කියා මම දන්නෙ නැහැ. නමුත් අදත් මේ තත්ත්වය පවතිනව. ඒ තත්ත්වය වෙනස් කරන ලෙස මා ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනව. යම්කිසි කෙනකුගෙ ගෙයක් ගින්නෙන් පිළිස්සුණා නම් ඒ ගේ පරීක්ෂා කර වහාම අලුත්වැඩියා කර ගැනීමට ආධාර මුදල් දිය යුතුයි. ගින්නෙන් හානි සිදු වුණු ඒ ගෙට පොල් අතු බැඳ හෝ වෙනත් අන්දමකින් ප්‍රතිසංස්කරණය කර හෝ තිබීම නිසා ආධාර මුදල් නොදීම වැරදියි. ඒ මන්ද, ඒ ගෙට ගින්නෙන් හෝ ගංවතුරෙන් හානි සිදු වුණු බව හොඳාකාර දැනගන්නට පුළුවන් නිසයි.

තවත් ප්‍රශ්නයක් තිබෙනවා. මෙය පවතින්නේ කෘෂිකර්ම අමාත්‍යාංශයත් සමාජ සේවා අමාත්‍යාංශයත් අතරයි. අපේ ප්‍රදේශවල කුඹුරුවලට හානි සිදු වූ විට ඒවාට ආධාර ලබා ගැනීමේදී නොයෙකුත් කරදර ඇති වෙනවා. රක්ෂණය කරන ලද කුඹුරුවලට රක්ෂණ අංශයෙන් වන්දි ලැබෙන නිසා ඒවාට ආධාර දෙන්නට සමාජ සේවා දෙපාර්තමේන්තුව ඉදිරිපත් වන්නේ නැහැ. ජලයෙන් යටවන කුඹුරු වැඩි වශයෙන් රක්ෂණය කරන්නේ නැහැ. සුළු ජල ගැල්මකට යට වී හානි සිදු වන කුඹුරු යායවල් රක්ෂණයට යටත් වන්නේ නැහැ. අන්න ඒ කුඹුරුවලටයි, සමාජ සේවා දෙපාර්තමේන්තුවෙන් ආධාර ලබා ගන්නට සිදු වී තිබෙන්නේ. ඇත්තෙන්ම මෙම ප්‍රශ්නයේදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට වඩා සැලකිල්ලක් දක්වා කටයුතු කරන්නට සිදු වී තිබෙන්නේ සමාජ සේවා දෙපාර්තමේන්තුවට යි. ඒ දෙපාර්තමේන්තුවට කොතරම් මුදල් තිබුණත් ආධාර දීම සඳහා ඒ මුදල් මදි වෙනවා. එසේ හෙයින් කෘෂිකර්ම අමාත්‍යාංශයත් සමාජ සේවා අමාත්‍යාංශයත් අතර ඇති මෙම කුඹුරු පිළිබඳ ප්‍රශ්නය නිරාකරණය කර ගන්නට ඕනෑ. රජය ශීඝ්‍රයෙන් ඉදිරියට ගමන් කිරීමට අදහසක් තිබෙනවා නම් ජල ගැලීමෙන් හානිවන කුඹුරුවලට වහාම වන්දි ගෙවීමට ඉදිරිපත් වෙනවා ඇතැයි මා විශ්වාස කරනවා. පසුගිය කාලයේදී ජල ගැල්මෙන් හානි සිදු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පර්සි වික්‍රමසිංහ මයා.]

වුණු කුඹුරුවලට ආධාර ලබා ගන්නට ගිය විට නොයෙකුත් ප්‍රශ්නවලට මුහුණ පාන්නට සිදු වුණා. "බිත්තර වී විතරක් දෙන්නට පුළුවනි; වෙන ආධාරයක් දෙන්නට බැහැ; භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව අපට කරන්නට පුළුවන් එපමණයි" යනාදී වශයෙන් දිසාපති කියනවා. ඉතින් මෙවැනි ප්‍රශ්න නිරාකරණය කරනවා ඇතැයි බලාපොරොත්තුවෙන් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

අ. භා. 3.8

**ආර්. එම්. අප්පුහාමි මයා.** (බණ්ඩාරවෙල)

*(திரு. ஆர். எம். அப்புஹாமி—பண்டாரவெல)*

(Mr. R. M. Appuhamy—Bandarawela)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමාජ සේවා ඇමතිතුමා විසින් ඉදිරිපත් කරන ලදුව දැනට සාකච්ඡා වෙමින් පවතින පරිපූරක මුදල සම්බන්ධයෙන් මාද වචන ස්වල්පයක් කථා කරන්නට බලාපොරොත්තු වෙනවා. මෙම මුදල් ඉල්ලන්නේ ජල ගැල්මෙන්, ගින්නෙන් හා සුළි හින් වන හානි සඳහා සහනාධාර දීමටයි. අප නියෝජනය කරන කඳුරට ප්‍රදේශවල ජල ගැල්මෙන් තම් හානි සිදු වන්නේ නැහැ. එහෙත් කඳු කඩා වැටීමෙන් හානි සිදු වෙනවා. අප නියෝජනය කරන ප්‍රදේශවල වැඩි වශයෙන්ම ඉන්නේ දුප්පත් උදවියයි. ඒ අය බොහොම දෙනකුට සමාජ සේවා දෙපාර්තමේන්තුවෙන් පිං පඩි ලැබෙනවා. එහෙත් එම පිං පඩිය ලබා ගැනීම සඳහා නොයෙකුත් කරදර විඳින්නට සිදු වෙනවා. ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ විට පළාතේ ආදායම් පාලක නිලධාරිතුමාට ඒක ඉදිරිපත් කරනවා. ඊට පසුව එතුමා ග්‍රාම සේවක තැනට ඒක ඉදිරිපත් කරනවා. ග්‍රාම සේවක තැන මාස දෙකක් තුනක් ඒක තබාගෙන සිට ගමේ තිබෙන මණ්ඩලය සමඟ සාකච්ඡා කර එයට සටහනක් එකතු කර නැවත ආදායම් පාලක නිලධාරි තැන වෙත එය ඉදිරිපත් කරනවා. ආදායම් පාලක නිලධාරි තැනට මේ ගැන පරීක්ෂණයක් කරන්නට මාස තුන හතරක් ගත වෙනවා. ඊට පසුව පිං පඩිය ලැබෙනවා. එතකොට පිං පඩිය ලබා ගැනීමට බලාපොරොත්තුවෙන් සිටි තැනැත්තා මිය ගොස් වන්නටත් පුළුවනි. මේ වගේ දෙයක් මා නියෝජනය කරන කොට්ඨාශයේ සිදු වුණා. එක්තරා රෝගියකු තම දරු පවුලට ජීවත් වන්නට ක්‍රමයක් නැති නිසා පිං පඩියක් ඉල්ලුවා. නමුත් පිං පඩිය ලබා ගැනීම සඳහා ඔහුට කාඩ් පත ලැබුණේ ඔහු මිය ගියාට පසුවයි. නිලධාරීන්ගේ ප්‍රමාදය නිසා මේ වැඩ අතපසු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පිංපඩි කාඩ්වල කාලය අවසාන වුණාම ඒවා අළුත් කරන්ට ආපසු යවන්න ඕනෑ. බදුලු දිස්ත්‍රික්කයේ සිය ගණනකට ආසන්න පිරිසකට අළුත් කරන්ට යැවූ කාඩ්පත් ලැබෙන්ට මාස දෙක තුනක් ගත වුණා. ඒ අංශයේ වැඩ කරන ප්‍රධාන ලිපිකාර මහතාගෙන් මේ ප්‍රමාදය පිළිබඳව කරුණු විමසුවාම දැන ගන්ට ලැබුනේ නිලධාරීන් හිඟ නිසා මේ ප්‍රමාදය සිදුවන බවයි. පසුගිය සිංහල අවුරුදු කාලයේ ඒ ස්ථානයේ වැඩ කරන ප්‍රධාන ලිපිකාර මහත්මයා රාත්‍රී අට නවය වනතුරු වැඩ කරල ඒ විධියේ පිංපඩි කාඩ් ගණනාවක් පිංපඩි ලබන්නන්ට එව්ව. යමෙක් තමන්ට ජීවත් වන්නට වෙනත් මාර්ගයක් නැති නිසයි, මෙවැනි පිංපඩියක් ලබාගන්නෙ. සමහරවිට ඒ ලැබෙන අනාථාධාර මුදල රුපියල් 8ක්, 10ක්, 15ක් වෙයි. වැඩිම ගණන රුපියල් 20 යි. ජීවත් වන්ට වෙන මාර්ගයක් නැති නිසා ඒ විධියේ සුළු මුදලක් බලාපොරොත්තු වන ඒ අසරණයන්ට ඒ මුදල් ඉක්මණින් ලැබෙන්න කටයුතු යොදන්න ඕනෑ. යමෙකු පිංපඩියක් ඉල්ලා සිටි විට ඔහුට පිංපඩි දීම සුදුසුදැයි කරන පරීක්ෂණත් මීට වඩා ඉක්මන් කළයුතුයි. පිංපඩි ඉල්ලුම්කරන උදවිය අතරින් සුදුස්සන්ට පිංපඩි ඉක්මණින් ලබා දීමට ක්‍රියාකාරී වැඩ පිළිවෙළක් ඉක්මණින් යොදන්ට ගරු අමාත්‍යතුමා ක්‍රියා කරනවා ඇතැයි බලාපොරොත්තු වෙමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනව.

අ. භා. 3.12

**කාරියවසම් මයා.**

*(திரு. காரியவசம்)*

(Mr. Kariyawasam)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශාලී ප්‍රදේශයේ නිතරම වගේ ගංවතුර ගලනව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නිතරම ගංවතුරෙන් ගොවිතැන්වලටත් වෙනත් දේවලටත් අලාභහානි සිදු වෙනව. එහෙත් සමාජ සේවා දෙපාර්තමේන්තුව දැනට නොගෙවන ආධාරයක් තිබෙනව. අපේ ප්‍රදේශයේ ගඩොල් කපා ජීවත් වන මිනිසුන් විශාල සංඛ්‍යාවක් සිටිනව. මැටියෙන් ගඩොල් කපල එව පෝරණුවල පුච්චල විකුණා ගැනීමෙන් ඒ අයගේ ජීවනමාර්ගය සලසා ගන්නව. හදිසියේ ගංවතුර ගැලුවාම ඒ උදවියගේ ගඩොල් දහස් ගණන් විනාශයට පත් වෙනව. ඒ වගේම ගඩොල් පෝරණුත්, ගඩොල් පිලිස්සීමට රැස් කරගෙන තිබෙන දරත් ගංවතුරෙන් ගසාගෙන යනව. ඒ උදවිය සමාජ සේවා දෙපාර්තමේන්තුවෙන් ආධාර මුදල් ඉල්ලා සිටියත් ඔවුන්ට ආධාරයක් ලැබෙන්නෙ නැහැ. දිසාපති තුමාගෙන් ඉල්ලා සිටියත් ආධාර මුදල් ලැබෙන්නෙ නැහැ. ඔවුන්ට ආධාර මුදලක් ලබා දෙන ලෙස මා ඉල්ලා සිටි අවස්ථාවක මට දැනගන්න ලැබුණා, දෙපාර්තමේන්තුවේ නියම යක් අනුව මෙවැනි උදවියට ආධාර දෙන්නෙ නැති බව. ඒ උදවිය වත්කම් ඇති ලොකු ආදායම් ඇති උදවියය කියන හැඟීම නිසයි, ඒ විධියේ ආධාරයක් ඔවුන්ට නොදෙන්නෙ. මේ පිරිස ගැන මා පෞද්ගලිකව දන්නව. ඒ ප්‍රදේශයේ සිටින ගඩොල් පෝරණු කාරයින් ඉතාම දිළිඳු තත්ත්වයෙන් කාලය ගත කරන්නෙ. ඒ අයට ලොකු ආදායමක් ඇත්තෙ නැහැ. එම නිසා කරුණාකර ඒ උදවියටත් ආධාර දීමේ වැඩ පිළිවෙළක් සකස් කර දෙන ලෙස ගරු ඇමතිතුමා ගෙන් විශේෂයෙන් ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනව.

අ. භා. 3.14

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்காரத்ன)*
**(Mr. Ilangaratne)**

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කොලොන්නාව ගැනත් වචන සඛලපයක් කථා කළයුතුව තිබෙනව. කොලොන්නාව අවුරුදුපතා වතුරට යට වෙන ප්‍රදේශයක්. ඒ කොට්ඨාශයේ ස්ථිර වශයෙන් අනිස්ථිර නිවාසවල පදිංචි ගංවතුරෙන් හානිවන උදවිය විශාල පිරිසක් සිටිනව. මේ අයට සහනාධාර සලසන්න වගේම, මේ අවුරුදු පතාම නැත්නම් නිතරම වගේ යටවන ගෙවල්වල පදිංචිව සිටින අයට ස්ථිර නිවාස ක්‍රමයක් මේ ඇමති අංශයෙන් සාදා දීම පිණිස වැඩ පිළිවෙළක් ආරම්භ කරන ලෙස මා ඉල්ලා සිටිනව.

වැල්ලම්පිටිය අවට ප්‍රදේශයේ දිය වන්නා ඇළ වගේ නමින් ඇළක් තිබුණ. ඒ ඇළ හරහා බැම්මක් බැන්ද, එය "හාවාඩ්" බැම්ම නමින් හඳුන්වන බැම්මයි. එය බැන්දෙ උතුරු කොළඹ හා කොළඹ අනික් කොටස් ජල ගැලීම්වලින් සිදුවන හානිවලින් ආරක්ෂා කර ගැනීම ටයි. අපි ඒකට විරුද්ධ නැහැ. ඒ ආරක්ෂක බැම්මෙන් විශාල සේවයක් ඒ පෙදෙස්වලට සැලසී තිබෙනව. එහෙත් ඒ බැම්ම බැඳීම නිසා මා හිතන්නෙ සෞඛ්‍ය ඇමතිතුමාගේ කොට්ඨාශයේ ගම්ද ඇතුළු ගම් 50 කට විතර නොයෙකුත් විධියේ අලාභහානි සිදු වෙනව. කොලොන්නාව කොට්ඨාශයත් ඊට යාබදව තිබෙන සෞඛ්‍ය ඇමතිතුමාගෙ කොට්ඨාශයත් යන මේ කොට්ඨාශවලින් උළු කර්මාන්තය නිසා රටට විශාල සේවයක් සිදු වෙනව. වැඩි පුරම උළු කර්මාන්ත හිමියන් මේ ආණ්ඩුවට ආධාර කරන උදවියයි. එහෙත් එය ජාතික ව්‍යාපාරයක් නිසා යම්කිසි විධියකින් ස්ථිර වශයෙන්ම මේ ජලගැලීම් නැවැත්වීමට වැඩ පිළිවෙළක් ඇති කළොත් ඒ අයටත් එය විශාල උපකාරයක් වෙනවා ඇති. මගේ ආරංචියේ හැටියට අවුරුදු කීපයකට කලින් ගංවතුර නැවැත්වීමට යම්කිසි වැඩ පිළිවෙළක් සූදානම් කර තිබුණ. මා හිතන විධියට එය වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඇති. එම නිසා සමාජ සේවා ඇමති අංශයත්, රජයේ වැඩ ඇමති අංශයත්, වාරිමාර්ග ඇමති අංශයත් මේ ගැන කල්පනා කර ස්ථිර වැඩ පිළිවෙළක් යෝජනා කර ක්‍රියාත්මක කරන හැටියට මා ඉල්ලා සිටිනව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනී, ගාල්ලේ නගර සභාවට එක්තරා මුදලක් වෙන් කර තිබෙනවාය කියා ගරු සමාජ සේවා ඇමතිතුමා කිව්ව. එය අහන්නටත් ආසයි. එමෙන්ම කොළොන්නාව ආදී අනිකුත් පළාත්වල ප්‍රාදේශීය බල මණ්ඩලවලටත් යම්කිසි ස්ථිර මුදලක් දුන්නොත් හදිසි කටයුතුවලදී ඒවායින් ප්‍රයෝජන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

ගන්නට පුළුවන් වෙනවා ඇති. විශේෂයෙන්ම කොළොන්නාව ආසනයේ සේදවත්ත කියන කොටස—අලුත් පාලම යට ප්‍රදේශය—විශාල ජලගැලීම්වලට භාජනය වෙනවා. පොඩි බැම්මක් බැන්දොත් එය නතර කරන්න පුළුවන්ය කියා මට ආරංචියි. ජලගැලීම් නතර කිරීමේ ප්‍රශ්නයත් සමගම රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ කල්පනාවට භාජනය විය යුතු තවත් දෙයක් තිබෙනවා. අලුත් පාලමත් සේදවත්ත පාරත් සම්බන්ධ කළොත් ජලගැල්මත් නවත්වා ජලගැල්මට අසුව අනාථ වන අයට යම්කිසි සහයෝගයක් ලබාගැනීමට ඒ ගෙවල්වලින් පිටවී යන්නට පහසුකම සැලසීමත් කරන්නට පුළුවන් වෙනවා. එම නිසා ඒ කරුණක් ඉදිරිපත් කරන්නට මා කැමතියි.

අකුරැස්සේ ගරු මන්ත්‍රීතුමා (වෛද්‍ය චාර්ය එස්. ඒ. වික්‍රමසිංහ) කීවා වගේ තවත් කරුණක් මතක් කළ යුතුව තිබෙනවා. කැඩුණාට ආධාර මුදලක් නොදෙන සමහර ගෙවල් තිබෙනවා. එයට හේතුව එම ගෙවල් හිමියන් වෙනත් අය වීමයි. ඔවුන්ට ආධාර මුදල් දෙන්නටය කියා අපිත් කියන්නෙ නැහැ. එහෙත් ගෙවල් හිමියන් ඒ ගෙවල් අලුත්වැඩියා කර නොදෙනවා නම්, ඒ ගෙවල්වල සිටින අයට ඒවා අලුත්වැඩියා කර ගැනීම සඳහා ආධාර මුදලක් දී එම මුදල ගෙවල් හිමියාගෙන් අයකර ගැනීමේ ක්‍රමයක් ඇති කළොත් එය ඒ ගෙවල්වල සිටින අයට විශාල සේවයක් වෙනවා ඇති. මේ අදහස් කීපය තමුන්නාන්සේගේ සැලකිල්ලට භාජනය කරනවා.

අ. භා. 3.17

**විජයසුන්දර මයා.**

*(திரு. விஜேசுந்தர)*

(Mr. Wijesundara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම මේ රට ගංවතුරට භාජනය වී පවතින අවස්ථාවකදී මේ වැය ශීර්ෂය සම්මත කරවා ගැනීමට අපේ සමාජ සේවා ඇමතිතුමා දක්වන උනන්දුවම අපිත් දක්වනවා. ඒ නිසා මේ වැය ශීර්ෂය සම්මත කර ගැනීමට අපේ සම්පූර්ණ සහයෝගය දෙන බව ප්‍රකාශ කරන අතරම මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් කථා කිරීමට කරුණු කීපයක් ඉදිරිපත් වී තිබෙන නිසා එය මේ ගරු සභාව හමුවේ ප්‍රකාශ කරන්නට සිදු වී තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හෙට අනිද්දා රාජාසන කථාව පවත්වන විටත්, මීට කලින් රාජාසන කථා පැවැත්වූ අවස්ථාවලදීත් ගැහැණු ළමයින් කණ්ඩායමක් ඇවිත් පාළි ගාථා වාක්‍ය වගයක් සිංදුවක ආකාරයෙන් කියනවා. එහි තේරුම නම් සාධාරණ ආණ්ඩුවක් ආණ්ඩු කරන කල ගංවතුරු හා භයානක ඇති වන්නෙ නැත කියන එකයි. එම නිසා මේ අවස්ථාවේදී ඒ පාළි වාක්‍යය පාවිච්චි කර මේ ආණ්ඩුවට නිග්‍රහ කිරීමට මා අදහස් කරනවා නොවෙයි. මේ ගංවතුරෙන් බේරෙන්නේ කොහොමද කියා අපි සාකච්ඡා කළ යුතුයි කියා මා හිතනවා. මෙවැනි ගංවතුරු හා භයානක නිසා ඇති වූ අලාභහානි වලට ආධාර සඳහා අතිරේක වැය ඇස්තමේන්තු මේ ගරු සභාවට ඉදිරිපත් කිරීමට ගරු සමාජසේවා ඇමතිතුමාට මේ අවුරුද්දෙත් සිදු වුණා; ගිය අවුරුද්දෙත් සිදු වුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙය සෙල්ලමක් නොවෙයි. මේ ගරු සභාව ඉදිරියට ඇවිත් ගරු සමාජ සේවා ඇමතිතුමා හැම වර්ෂයකම විශාල මුදලක් ලබා ගන්නවා. එතුමා අවංකවම තමා වෙත පැවරී තිබෙන වගකීම ඉටු කිරීමට උත්සාහ ගන්නවා. ඒ කෙසේ වෙතත් ගංවතුරෙන් ගැලවීම සඳහා අපි යම්කිසි ක්‍රියාමාර්ගයක් ගත යුතු අවස්ථාවට දැන් එළඹ සිටිනවා. මෙවර ඇති වූ ගංවතුරෙන් අපට අත්දැකීමක් ඇති වුණා. මේ ගංවතුර ඇති වුණේ බලාපොරොත්තු නොවූ විධියටයි. කවදාවත් ගංවතුරක් ඇති නොවූ ප්‍රදේශවලටත් හදිසියේ ගංවතුර ගැලුවා. දැන් ගංවතුරු ගලන්නේ කැළණි ගඟ, කළු ගඟ හෝ වලවේ ගඟ ආදී ගංගාවලින් පමණක් නොවෙයි. ඒ ගංගාවලට අමතරව ඇති හැම සුළු ගංගාවක්මත් හැම සුළු ඇළක්මත් ගලන්නට පටන් ගෙන තිබෙනවා. වැස්සක් ඇති වූ වහාම ගංවතුරක් ඇති වෙනවා. මෙදා කැළණි ගඟේ ගංවතුර ඇතිවුණේ බලාපොරොත්තු නොවූ ස්ථානයකිනුයි. මෙදා එය ඇති වුණේ සීතාවක බැරැණ්ඩියා කෝවිල අසලිනුයි. එයට හේතුව ගැන අපි බලන්නා ඕනෑ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු කෘෂිකර්ම ඇමතිතුමාගේ අවධානයට යොමු කළ යුතු තවත් දෙයක් තිබෙනවා. සුළු රබර්වතු හිමියන්ට වගා කිරීම සඳහා රබර් පැලක දෙපාතීමේන්තුවෙන් සම්මත කරන්නේ ගංවතුරින් යට නොවන ඉඩම් පමණයි. නමුත් ඒ සුළු රබර් වතු හිමියන්ගේ ගංවතුරින් යට වන්නේ නැත කියා සම්මත කළ ඉඩම් රාශියක් දැන් ගංවතුරෙන් යට වී තිබෙනවා. සුළු රබර් ඉඩම් ගංවතුරෙන් යට වීම නිසා ඒ ඉඩම් අයිතිකරුවන්ට සිදු වී තිබෙනවා අද ආණ්ඩුවෙන් ආධාර ඉල්ලන්න. මේ වතාවේ ගංවතුර ගැලුවෙ කවුරුවත් බලා පොරොත්තු නොවූ විධියටයි. මගේ කොට්ඨාශයෙ තිබෙන මිල්ලවිටිය නමැති සුළු ඇලෙන් ඇති වූ ගංවතුර නිසා ඒ ප්‍රදේශයෙ ගෙවල් සිය ගණනක් කැඩී බිඳී ගියා. ඒ වගේම දෙහිඹිවිට, තල්දුව ආදී ප්‍රදේශවලත් ගෙවල් සිය ගණනක් කැඩී ගියා. අප මෙයින් අත්මිදෙන්නට වැඩ පිළිවෙළක් විධාන සකස් කළ යුතුයි. අවුරුද්දක් පාසා මේ විධියට ගංවතුර උවදුර ඇතිවීමට හේතුව කුමක්දැයි අප විසින් සොයා බැලිය යුතුයි. දුප්පත් වැසියන්ට ඉඩම් දෙන්නට එපායයි අප කියන්නෙ නෑ. මේ රටේ තිබෙන මහා ධන නිධානයක් වන වනය, කැලෑව, කොන්ත්‍රාත්කාරයින් ජාවාරම්කාරයින් විසින් කිසිම පිළිවෙළක් නැතිව එළි කිරීම නිසා ඇති වන පස සෝදා යාමේ ප්‍රතිඵලයක් වශයෙනුයි ප්‍රධාන වශයෙන්ම මේ ගංවතුර ගැලීම් ඇති වන්නෙ. අද මෙය නොවැළැක්විය හැකි කරුණක් බවට පත් වී තිබෙනවා. මේ හේතුව නිසා ගංවතුර ගැලීම ශීඝ්‍රයෙන් වර්ධනය වී වර්ෂයක් පාසා ගේ දොර ඉඩකඩම් ගම් නියම්ගම් විනාශ කරගෙන මේ උවදුර ඇති වෙනවා.

ඉදිරිපත් කර තිබෙන වැය ශීර්ෂය අප අනුමත කරතත්, මෙවැනි තාවකාලික පිළියම්වලින් නම් මේ උවදුරෙන් බේරෙන්න බැහැ. මේ ප්‍රශ්නය කැබිනට් මණ්ඩලයට හෝ ඉදිරිපත් කර අවුරුදුපතා ඇති වන ගංවතුර උවදුර පිළිබඳ සම්පූර්ණ කරුණු සොයා බලා ඊට නිසි පිළියම් යෙදීමට කටයුතු කරන ලෙස සමාජ සේවා කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා. එතුමා ගත් අලුත් තීරණයක් අනුව දැන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් නිදහස් වූ අයගෙනුත් එතුමා නිදහස් වී එක්සත් ජාතික පක්ෂයට බැඳී සිටින බවක් අපට දැනගන්න ලැබුණා. එම නිසා, ගංවතුර උවදුර සම්බන්ධයෙන්ද වහාම තීරණයක් අරගෙන, ඉඩම් ඇමතිතුමා සමඟත් සාකච්ඡා කොට වහාම සුදුසු පියවරක් ගන්නවා ඇතැයි අප විශ්වාස කරනවා. ගංවතුර මේ විධියට අවුරුදු පතා ඇති වන්නෙ හිතුවක්කාර විධියට කැලෑ එළි කිරීමෙන් බව මා මුලිනුත් කිව්ව. මෙය සිදු වන්නෙ දුප්පත් ගොවියා අතින් නොවෙයි. විශාල කොන්ත්‍රාත්කරුවන් ජාවාරම්කරුවන් අතිනුයි මේ වැරැද්ද සිදු වන්නෙ. ඉඩම් ඇමතිතුමාත් මේ තත්ත්වය අවබෝධ කරගෙන මේ ගංවතුර උවදුරින් රට මුදා ගැනීම සඳහා පියවරක් ගන්නා ලෙස මතක් කරනවා. මේ වැය ශීර්ෂය අප අනුමත කරන අතරම අද මුළු රටටම මුහුණ පාන්නට සිදු වී තිබෙන මේ කරදරය සදාකාලිකවම නතර කිරීම සඳහා ක්‍රියා කරන ලෙස මතක් කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා.

අ. භා. 3.22

**තුඩාවේ මයා.**

*(திரு. துடாவ)*

**(Mr. Tudawe)**

සමාජ සේවා ඇමතිතුමා විසින් ඉදිරිපත් කර තිබෙන මේ වැය ශීර්ෂය අප ඉතා සන්තෝෂයෙන් අනුමත කරන අතර, පසුගිය වතාවේ ගංවතුර ආධාර දීමෙදී දුප්පත් මිනිසුන්ට මුහුණ පාන්නට සිදු වූ දුෂ්කරතා ගැන කරුණු කීපයක් ගරු ඇමතිතුමාගේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරන්නට මා අදහස් කරනවා. පසුගිය කාලයෙ මාතර පළාතෙ විශාල ගංවතුරක් ඇති වී ගෙවල් රාශියක් කැඩී ගියා. ඒ වෘයෙහි සිටි මිනිසුන්ට, ආධාර මුදල් ලබා ගැනීමේදී නොයෙක් අමාරුකම්වලට මුහුණ පාන්න සිදු වුණා. ඊට හේතුව ඔවුන් අනුන්ගෙ ඉඩම්වල පදිංචි වී සිටීමයි. අනුන්ගෙ ඉඩමක පදිංචි වී සිටි කෙනකුගෙ ගෙයක් ගංවතුරෙන් කඩා වැටුණොත්, ඒ සම්බන්ධයෙන් ආධාර දීමේදී, සමාජ සේවා දෙපාතීමේන්තුවේ නිලධාරීන් අනුගමනය කරන ප්‍රතිපත්තිය අනුව, ඒ ගෙය නැවතත් ඒ ස්ථානයෙම, ඒ ඉඩමෙම, හදා ගැනීම ගැන ඉඩම් හිමියාගේ විරුද්ධත්වයක් නැති බව දක්වෙන ලියුමක් එම ඉඩම් හිමියාගෙන් ලබාගෙන ඉදිරිපත් කළ යුතුයි. අකාරුණික ඉඩම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

හිමියන් මේ නීතියෙන් අයුතු ප්‍රයෝජන ගන්නව. යම් ඉඩමක පදිංචි වී සිටි කෙනකු අස් කර ගන්නට බැරිව සිටියදී ඒ තැනත් තාගෙ ගෙය ගංවතුරෙන් විනාශ වුණොත්, නැවතත් එම ගෙය හදා ගැනීම ගැන කැමැත්ත දක්වන ලියුමක් ඒ ඉඩම් හිමිය ගෙන් නම් කවදාවත් ලබා ගන්නට බැහැ. එම නිසා, ගේ කඩා වැටීමෙන් අනාථ වූ අර තැනැත්තාට රජයෙන් ලැබෙන ආධාර මුදල ලබා ගන්නට ඉඩක් නොලැබෙන බව ගරු ඇමතිතුමාට විශේෂයෙන් මතක් කරන්න කැමතියි. එම නිසා, එවැනි ගෙයක් ගංවතුරෙන් විනාශ වුණු අවස්ථාවක දී නැවත එම ගෙය හදා ගැනීම සඳහා ඉඩම් හිමියාගෙන් ලියුම් ලබා ගැනීමේ නීතිය අමතක කරන ලෙස මා ගරු ඇමතිතුමා ගෙන් ඉල්ලනව. එවැනි ලියුමක් ඉල්ලූ වොත් කවදාවත් අර දුප්පත් මනුෂ්‍යයට ආධාර මුදල ලබාගන්න බැහැ. ඒ ලියුම ගැන නොසලකා ආධාර මුදල් දෙතොත්, කැඩුණු ගෙය එම ඉඩමෙහිම හදා ගන්නට එහි පදිංචිව සිටි තැනැත්තාට පුළුවන් වෙනව.

දෙවැනි කාරණය මෙයයි: සමහර අවස්ථාවලදි, දුප්පත් ගොවීන්ගේ එළවුළු කොරටුවලට ගංවතුරෙන් සිදු වන හානි සඳහා ආධාර මුදල් ලැබෙන්නෙ නැහැ. යම් කුඹුරක් හෝ එළවුළු කොරටුවක් හෝ ගංවතුරෙන් විනාශ වී ගිය විට, එම කුඹුර හෝ කොරටුව හෝ අයිතිකරු මසකට රුපියල් 40 ක් 50 ක් වැනි සුළු ආදායමක් ලැබෙන යම් රැකියාවක් කරන කෙනකු නම්, සමාජ සේවා දෙපාර්තමේන්තුව ක්‍රියා කරන ආකාරය අනුව ඔහුට ආධාර මුදල් ලැබෙන්නෙ නෑ. අර සුළු රක්ෂාවක් කිරීම නිසා ඔනු ගොවියකු වශයෙන් සලකන්නෙ නෑ. ඒ නිසා ආධාර මුදල දෙන්නෙ නෑ. එයින් ඔහුට විශාල අමාරුවකට මුහුණ පාන්නට සිදු වෙනව. ගොවියා ඔහුගෙ ගොවිතැන් කටයුතුවලට අමතරව අර කී විධියෙ සුළු රැකියාවක් කරන්නෙ එයිනුත් සුළු ආදායමක් ලබා ගන්නයි. අවසානයේ දී මෙවැනි ගංවතුර විපත්තියකදී ඔවුනට සිදුවෙන්නෙ ආණ්ඩුවේ කිසිම ආධාර මුදලක් නැතිව සම්පූර්ණයෙන්ම අලාභය විඳ ගන්නයි. එම නිසා ඉදිරි කාලයේදී මේ රටේ ආහාර දිගාව දියුණු කිරීමට ඔවුන්ගෙන් කෙරෙන්නට තිබෙන යුතුකම් කොටස ඉෂ්ට කරන්නට ඔවුන්ට අවස්ථාවක් ලැබෙන්නෙ නැහැ. මක්නිසදා? සමාජ සේවා අංශය ඒ ගැන සෑහෙන සැළකිල්ලක් නොදක්වීම නිසයි. එමනිසා මේ අවස්ථාවේදී මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරන්ට සතුටුයි. සුළු රක්ෂාවක් කරමින් ජීවත් වෙන්නට මාර්ගයක් නොමැති නිසා අමතර ආදායමක් ලබා ගැනීමට වැවූ එළවළු කොරටු යනාදියත් ගංවතුර කින් විනාශ වුණොත් ඒවා අයිති ගොවීන්ටත් ආධාර මුදලක් දෙන මෙන් මා ඉල්ලා සිටිනවා. මේ කරුණු පමණයි මා මේ අවස්ථාවේදී ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරන්නෙ. ගරු ඇමතිතුමා විශේෂයෙන්ම ගංවතුර අනාථයින්ගේත් සමාජ සේවා අංශයේත් වැඩ කරන්ට බොහොම ආශාව කින් ඉඳින බව අපි දන්නව. නමුත් ඒ සඳහා එතුමාගේ අමාත්‍යාංශයට ආණ්ඩුවෙන් සෑහෙන මුදලක් වෙන් කරන්නෙ නැහැ. රටේ දිළිඳුකම වැඩියි. රැකිරක්ෂා හිඟයි. ක්ෂය රෝගය හදා ගැනීමට සතුටු මිනිසුනුත් අපේ රටේ ඉන්නව. යම් විධිය කින් කෙනෙකුට ක්ෂය රෝගය සෑදී සනීප වුණොත් කොහොම හරි ඔහු නැවතත් එම රෝගය හදා ගන්නයි බලන්නෙ. මක් නිසාද? ජීවත් වෙන්නට ක්‍රමයක් නැති නිසා ක්ෂය රෝගීන්ට දෙන ආධාර මුදල, රුපියල් 80 ගන්නයි. එවැනි දිළිඳු තත්ත්වයකට මේ රට වැටී තිබෙනව. එමනිසා ආණ්ඩුවෙන් සෑහෙන තරම් මුදල් වෙන් කරවා ගෙන දුප්පත් ජනතාවට ආධාර කරන මෙන් අප ඉල්ලා සිටිනවා. මේ මාස් පතා දෙන රුපියල් පහක නැත්නම් රුපියල් හතහමාරක සහනාධාරය තවත් වැඩි කරන්ට කටයුතු කරන ලෙසත් මා ඉල්ලා සිටිනවා. සාමාන්‍ය දුප්පත් මනුෂ්‍යයකුට රුපියල් පහකින් දවස් දෙකක් ජීවත් වෙන්ට බැහැ. එමනිසා මේ මුදල වැඩි කිරීමට කටයුතු යොදන මෙන් මා ඉල්ලා සිටිනවා. මේ පිළිබඳව ඉදිරිපත් කරන වැය ශීර්ෂවලට අපේ සම්පූර්ණ සහයෝගය දීමට බලාපොරොත්තු වන බවත් මා අවසාන **වශයෙන් සඳහන් කරනව.**

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 3.28

**කුලතිලක මයා.**
*(திரு. குலதிலக்க)*
(Mr. Kulatillake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමාජ සේවා ඇමතිතුමා ඉදිරිපත් කර තිබෙන මේ වැය ශීර්ෂය අනුමත කරන අතරම මේ වැය ශීර්ෂය යටතේ වවන දෙක තුනකුත් කථා කිරීමට මා අදහස් කරනවා. අබල දුබල සෞඛ්‍ය තත්ත්වයෙන් යුත් අන්ධයින්, කොරුන් ආදී වශයෙන් ලෙඩ දුක් වලින් පෙළෙන අසරණ අනාථ උදවියට සහ නියඟවලින්, ගංවතුරෙන් අලාභ හානි වූ ප්‍රදේශවලටත් ජනතාවටත් ආධාර දීම ටයි මේ වැය ශීර්ෂය ඉදිරිපත් කර තිබෙන්නෙ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උඩරට ආසනයක් නියෝජනය කරන මන්ත්‍රීවරයකු වශයෙන් විශේෂයෙන්ම උඩරට ප්‍රදේශවලටත් ඒ ප්‍රදේශවල ජනතාවටත් සමාජ සේවා දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු සහයෝගය නොලැබෙන බව කණගාටුවෙන් වුවත් මට මේ ගරු සභා වේදී කියන්ට සිද්ධ වී තිබෙනවා. අද පිළි යෙල කර තිබෙන මේ සැලැස්මවල් ක්‍රියාවට පරිවර්තනය කරන විට නොයෙකුත් අකටයුතුකම් හා අසාධාරණකම් සිදු වෙනවා. ග්‍රාම සේවකවරුන්ගෙන්, ආදායම් පාලක නිලධාරීන්ගෙන් ලැබෙන වාර්තා අනුවයි අද දුප්පත්කමෙන් පෙළෙන ජනතාවට ආධාර ලැබෙන්නෙ. නමුත් මේ පිළිවෙළට ආධාර දීමට සුදුස්සන් තේරීමේදී නොමනා මත දරමින් පෞද්ගලිකව මනුෂ්‍යයින්ට විරුද්ධකම් පාමින්—ග්‍රාම සේවකයින් හෝ වේවා ආදායම් පාලක නිලධාරීන් හෝ වේවා—මේ නිලධාරීන් ආධාර මුදල් ලැබීමට නියම වශයෙන් සුදුස්සන්ට ඒ ආධාර මුදල නොලැබෙන ආකාරයෙන් කටයුතු කරන අවස්ථා ගැන අපට දැනගන්නට ලැබී තිබෙනවා. විශේෂයෙන්ම මගේ ආසනයේ සමහර ග්‍රාම සේවකවරු ඒ අන්දමට ක්‍රියා කරනවාය කියා මට පැමිණිළි රාශියක් ලැබී තිබෙනවා. රඹුක්වැල්ලෙ ග්‍රාම සේවක මහත්මය ඒ අන්දමට මට හිතවත්ව වැඩ කළ අහිංසක ජනතාවට, අනාථවී දුප්පත්කමෙන් පෙළෙන ජනතාවට දොස් කියමින් "පලයල්ලා, ගිහින් කුලතිලක මහත්මයගෙන් කරගනිල්ල" යන හැඟීම් ඇති කරවමින් ඒ ජනතාව නෙරපන බව මා තමුන්නාන්සේට කණගාටුවෙන් දන්වනවා. නිලධාරීන්ගෙන් සිදුවන එවැනි නොමනා ක්‍රියාවන් ගැන මා ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උඩරට ප්‍රදේශවල නාය යෑම්, කඳු කඩා වැටීම්, ගංවතුර අලාභ හානිවීම් එමට සිද්ධ වෙනවා. නමුත් මෙවැනි අවස්ථාවලදී දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට කරුණු ඉදිරිපත් කළාම මෙවැනි දේවල්වලට කලින් ආධාර මුදල් දී නැහැ, එමනිසා ආධාර දෙන්ට බැරිය කියා බොහොම ලේසියෙන් අපට පිළිතුරු එවා තිබෙනවා. ඒ කාරණය ගැනත් මා ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවනවා. ඔය උතුරු ප්‍රදේශය වැනි ප්‍රදේශවලට නම් බොහොම ලක්ෂණට ආධාර මුදල් දෙන්න කටයුතු සලස්වා තිබෙනවා. අපි ඒකට විරුද්ධ නැහැ; ඊර්ෂ්‍යා නැහැ. ආධාර ලැබිය යුතු කාටත් ආධාර මුදල් දීම සුදුසුයි. නමුත් උතුර ආධාරවලින් උතුරු වන අතර අවශේෂ ප්‍රදේශවල වාසය කරන අහිංසක පෙදෙ ජනතාවගේ දුක්ගැනවිලි වලට ඇහුම්කන් දෙන්නෙ නැහැ. සාධාරණ අන්දමින් අනික් ප්‍රදේශවල ජනතාවගේ දුක්ගැනවිලිවලටත් ඇහුම්කන් දෙන්න ඕනෑ. අද මේ කරන අසාධාරණකම් වහාම නවත්වා සියලු දෙනාටම සාධාරණ අන්දමින් යුක්තිය ඉටු වන ආකාරයට රාජකාර්යය කරන මෙන් ග්‍රාම සේවකවරුන්ටත් තමුන්නාන්සේගේ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ටත් නියෝග කරන මෙන් මා ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

ගංවතුර ගැන මෙන්ම නියඟය ගැනත් මෙවැනි වැය ශීර්ෂ ඉදිරිපත් කළ විට කථා කරන්න සිදු වෙනවා. මෙවැනි යෝජනා ඉදිරිපත් වුණාම ඒවාට අපේ සහයෝගය දීම පමණක් සම්ප්‍රදායයක් හැටියට ගෙන යාම ගැන කනගාටු වෙනවා. මෙවැනි කරුණු සාකච්ඡාවට භාජන වෙමින් පවතින අවස්ථාවල නිකම්ම කථා කළාට මදි. මෙහි ඇති ශාස්ත්‍රීය අංශය ගැනත් සලකා බලන්න ඕනෑ. ඒ ගැනත් කරුණු ඉදිරිපත් කරන්න ඕනෑ. නියඟය ගැන කථා කරද්දී ඊටම සම්බන්ධයක් ඇති තවත් දේවල් තිබෙනවා. සෝදා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කුලතිලක මයා.]

පාලුව ගැනත් කල්පනා කරන්න ඕනෑ. නියඟයට මුහුණ දීම සඳහාත් සෝදා පාලුව් නැති කිරීම සඳහාත්, රජය ගෙන ඇති පිය වර කවරේදැයි මේ ආණ්ඩුවෙන් අහන්නට සිදු වෙනව. නියඟයත්, ගංවතුරත්, සෝදා පාලුවත් බොහොම භයානක උවදුරු බව අමතක කරන්න බැහැ. මුහුදුකර ප්‍රදේශයෙත් රට මැද ප්‍රදේශවලත් සෝදා පාලුව ඇති වෙනව. මුහුදු නිසාත් ගංගාවල් නිසාත් සෝදා පාලුව ඇති වෙනව. රටේ නායකත්වය විශේෂයෙන් සලකා බැලිය යුතු උවදුරු අතර මේවා ප්‍රධාන තැන් ගන්න බව මතක් කර දිය යුතුව තිබෙනව. මේ ආපදාවන්ගෙන් අපේ රට බේරා ගැනීමටත් රටේ සංවර්ධනය ඇත්ත වශයෙන්ම ඇති කර ගැනීමටත් වැඩ පිළිවෙළක් තිබිය යුතුය යන්න පිළිගනිනවාත්, ඒ වැඩ පිළිවෙළ ශාස්ත්‍රීය ලෙසත් විද්‍යාත්මක ලෙසත් සකස් කර ගනු ලැබිය යුතුයි. නිසි පිළියම් යෙදීම ගැන කල්පනා කළොත් මතු වැයි මතක් කරන්න ඕනෑ. ඊට වඩා කථා කරන්න අදහස් කරන්නෙ නැහැ.

අප විසින් ඉදිරිපත් කරන ලද කාරණයක් ගැන සඳහන් කරන්න කැමතියි. පොද්දල්ගොඩ පවුලකට සිදු වූ දෙයක් ගැනයි කියන්නෙ. ඒ පවුලේ උදවියට අයිති කුඹුරක් නාය යාම නිසා විනාශ වුණා. බුසලක් වැපුරුවාම වී බුසල් 4ක් පමණ ලැබෙන සාරවත් කුඹුරක් එය. නාය යාම නිසා එය එහෙම පිටින්ම යට වුණා. නිලධාරීන් සමග පෞද්ගලිකවත් මේ ගැන මා සාකච්ඡා කළ නමුත් සතුටට පත් විය හැකි අන්දමට යමක් කරවා ගන්නට පුළුවන් වී නැහැ. අපට නිලධාරීන්ගේ මාර්ගයෙන් පළමුවෙන්ම ලැබුණු පිළිතුරේ සඳහන් වූයේ අප ඉදිරිපත් කළ කාරණය ඔවුන්ගේ සැලකිල්ලට භාජන කරනවාය යන්නයි. සැලකිල්ලට භාජන කිරීමෙන් පසු අපට ඔවුන්ගෙන් ලැබුණු පිළිතුරේ සඳහන් වූයේ අප ඉල්ලූ ආධාරය දෙන්න බැරිය යන්නයි. එසින් අපට සෑහීමකට පත් වෙන්න බැහැ. ඒ නිසා ඕය යටත් විජිතවාදී වැඩ පිළිවෙළ කඩා බිඳ දමා කාල යට සමාජ ක්‍රමයට ගැළපෙන සැලැස්මවල් අනුව වැඩ පිළිවෙළක් යළිත් වරක් සකස් කර ගත යුතු බව මතක් කරන්න කැමතියි. වඩා සතුටුදායක වැඩ පිළිවෙළක් යොදා ගන්න පුළුවන් නම් එසේ කරන මෙන් ඉල්ලා සිටිනව. මේ පිළිබඳව අපේ සහයෝගය දෙන බවත් ඒ සමගම ප්‍රකාශ කරන්න කැමතියි. වඩාත් උනන්දුවෙන් අප ඉදිරිපත් කරන අදහස් ආදිය ගැන ක්‍රියා කරන මෙන් ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනව.

අ. භා. 3.32

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දීර්ඝ පිළිතුරක් අවශ්‍ය නොවෙතැයි මා හිතනවා. කෙසේ වෙතත් ස්වල්ප වශයෙන් හෝ පිළිතුරු දීම මගේ යුතුකමක් හැටියට මා සලකනවා. සෑම ගරු මන්ත්‍රීවරයෙක්ම පාහේ අපේ අමාත්‍යාංශය ගැන ප්‍රශංසාත්මක ලෙස කථාකළ අතර යම් යම් අඩුපාඩුකම් ගැනත් සඳහන් කිරීම ගැන මා කෘතඥ වෙනව. දෙහිඕවිට ගරු මන්ත්‍රීතුමා (ඩී. පී. ආර්. විරසේකර මයා.) සඳහටම ගංවතුරක් වැලැක්වීමට යම්කිසි වැඩ පිළිවෙළක් පෙන්වා දුන්නා. ඒ සඳහා මිනිසුන් වෙනත් තැන්වල පදිංචි කිරීමට කඳුකර ප්‍රදේශ යොදා ගැනීම සුදුසු විය හැකියි. ගංවතුරට යට වන නිවාස බොහොමයක් තිබෙන්නෙ පාරවල් අසල ඇති නගරවලයි. ඒවායේ පදිංචි වී සිටින්නන් කඳුකරයට යැවීමොත් ඒ වෙනුවට වෙනත් කවුරු හෝ පැමිණ මුලින් මිනිසුන් සිටි ස්ථානවල පදිංචි වෙනවා. ඒ නිසා යම්කිසි නිර්මාණයක් අනුව වැඩ පිළිවෙළක් සකස් කර ගත යුතුව තිබෙන බව කියන්න ඕනෑ. ගංවතුරට යට වන ප්‍රදේශවල යම්කිසි හොඳ වැඩ පිළිවෙළක් තිබිය යුතුමයි. කැලණි ගඟ අසබඩ පුද්ගලයන් අයින් කර මොන විධිය කින් හෝ වැඩක් කළ යුතු වුවත් ඒ පුද්ගලයන් දැනට පදිංචි වී සිටින ප්‍රදේශ හිස්ව තැබීම නම් කවදාවත් කරන්න පුළුවන් දෙයක් නොවෙයි. ඒ මගේ හැඟුමයි. ගංවතුර ඇති වන ප්‍රදේශ ස්වභාවයෙන්ම සරු ප්‍රදේශ බව පිළිගත යුතුයි. ගංවතුරට වරින් වර යට වන නිසාම ඒ ප්‍රදේශ සාරවත් වෙනව. ඒ නිසා ඒ ප්‍රදේශවලින්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මිනිසුන් ඉවත් කළත් වෙනත් උදවිය ඇවිත් බලහත්කාරයෙන් හෝ ඒ වාගේ පදිංචි වෙනවා.

තෙල්දෙණියේ ගරු මන්ත්‍රීතුමා ගංවතුර සම්බන්ධයෙන් වැදගත් කරුණු රාශියක් ඉදිරිපත් කළා. අප විදේශීන් යටතේ සිටි කාලයෙත් ගංවතුර සම්බන්ධයෙන් යම් යම් දේවල් කර තිබෙනවා. අපිත් ගංවතුරට යට වන ප්‍රදේශ සම්බන්ධයෙන් යම් යම් වැඩ පිළිවෙළවල් සකස් කර තිබෙනවා. පූගොඩ හරියෙන් ඇළක් මුහුදට කැපීමට යෝජනාවක් තිබෙනවා. එය ක්‍රියාත්මක වුණොත් දැනට ජල ගැලීමෙන් යට වන ප්‍රදේශ බොහෝ දුරට එයින් වළක්වාලීමට පුළුවන් වෙනවා ඇති. ඊට විශාල මුදලක් යනවා. ඒක සමාජ සේවා දෙපාර්තමේන්තුවෙන් කරන්ට පුළුවන් දේකුත් නොවෙයි. ඒ පෙන්වා දුන්නාක් මෙන් මධ්‍යම ආණ්ඩුවෙන් මේ ගැන විශෙෂ උපදෙස් ඇති—[බාධා කිරීමක්] භාරදූර කටයුත්තක් බව මා දන්නවා.

කොළොන්නාවෙ ගරු මන්ත්‍රීතුමා (ඉලංගරත්න මයා.) කිව්වා, ගාල්ලට යම් කිසි මුදලක් දුන්න වගෙ ඒ නගර සභාවටත් ලැබෙන්ට සලස්වනවා නම් හොඳය කියා. [බාධා කිරීමක්] Poor Laws කියා නීතියක් තිබෙනවා. ඒ අනුව මධ්‍යම ආණ්ඩුවෙන් ඒවාට ආධාර දෙන්ට පුළුවන්කමක් නැහැ. ගාලු නගර සභාවෙ ඇති දිළිඳු කම ගැන බලා මහජනතාවට උපකාරයක් වශයෙනුයි, ඒ සම්පූර්ණ වියදම් භාර ගත්තෙ. අනික් නගර සභාවලට, පළාත් පාලන ආයතනවලට, එවැනි වගකීමක් නැහැ. එවැනි ආපදා වූ විට සමාජ සේවා අමාත්‍යාංශය මගින් ඒ පිළිබඳ සම්පූර්ණ මුදලම වැය කරන බව දන්වන්ට කැමතියි. එම නිසා එවැන්නක් කොළොන්නාවට අවශ්‍ය වන්නෙ නැතෙයි කියා සිතනවා. ඕනෑම අවස්ථාවක සියළුම වියදම් මධ්‍යම ආණ්ඩුවෙන් දරන්ට බලා පොරොත්තු වෙනවා.

පිං පඩි දීම පිළිබඳව යමක් කියන්ට කැමතියි. තමුන්නාන්සෙලගෙ පළාත්වල පමණක් නොවෙයි, මගෙ ආසනයෙත් ඔය ලෙඩේ තියෙනවා. එදා කොහොමද පිං පඩි දුන්නෙ? කිසිම පිළිවෙළක් නැති යල් පැනපු ඒ පරණ ක්‍රමයමයි, පිං පඩි දීමෙදි තවමත් අනුගමනය කරන්නෙ. ඒ ක්‍රම සම්පූර්ණයෙන් ම නැති කර දමා සුදුස්සන්ට සුදුසු අකාරයට පිං පඩි ලැබෙන පරිදි යුක්ති සහගතව සහනයක් සලසන්ට අපි උත්සාහ දරනවා. ඒ වගෙම ගංවතුර ආධාර එහෙම දෙන අවස්ථාවලදි දේශපාලන බලපෑම් උඩ වේවා වෙන වෙනත් කරුණු උඩ වේවා යම් යම් අක්‍රමිකතා සිදු වන බව අපි දන්නවා. අල්ලස් ගැනීමාදියට පවා පෙළඹෙනවා. බොහෝ දෙනාට නියම රපෝර්තු පවා නුදුන් බව මා දන්නවා. එසේ දැන ගෙන ගරු මන්ත්‍රීතුමන්ලා විසින් මට යම් යම් කරුණු දැනුම් දුන් අවස්ථාවලදි කීප වාරයක් ම මා සුදුසු පරිදි ක්‍රියා කර තිබෙනවා. ඒ ඒ කොට්ඨාශවල මන්ත්‍රීවරුන් සමග මහ කන්තෝරුවෙ නිලධාරීන් ගෙයක් ගෙයක් පාසා යවා විභාග කෙරෙව්වා. ඇමති වරයකුට සෑම ගෙයක් පාසාම ගොස් මේ තත්ත්වයන් තක්සේරු කරන්ට බලයක් නැහැ. මා සිතනවා, එසේ කරන්ට පුළුවන් කමකුත් නැතෙයි කියා. එවැනි අයුතු ක්‍රියා සිදු වී තිබෙනවා නම් මට දන්වන ලෙස මා ඉල්ලා සිටිනවා. එසේ කළ විට ඒ පිළිබඳව සම්පූර්ණයෙන් පරීක්ෂා කර බලා කටයුතු කරන්ට මා කැමතියි. තමුන්නාන්සේලා මේ කාරණයෙහිදී මට සහයෝගය දීම ගැන මම තමුන්නාන්සේලාට ස්තුතිවන්ත වෙනවා. තමුන්නාන්සේලා ඉදිරිපත් කළ කරුණු වලට සුළු වශයෙන් නමුත් පිළිතුරු දෙන්ට පුළුවන් වුණාය කියන එකයි, මගේ හැඟීම. තමුන්නාන්සේලාට මගේ කෘතඥතාවය පළ කරමින් මෙම කතාව අවසාන කරනවා.

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

விடை விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

***Question put, and agreed to.***

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## පරිපූරක මුදල: සවස්ථාව හා ඝර්ම කලාපීය රෝග පිළිබඳ කාර්යාංශයට හා ලෝක සෞඛ්‍ය සංවිධාන ආදියට ගෙවිය යුතු දායක මුදල් ආදිය

குறைநிரப்புத் தொகை: உடல் நல, அயன மண்டல நோய்கள் அலுவலகம், உலக சுகாதார தாபனம் ஆகியவற்றுக்கு உதவு தொகைகள் முதலியன

SUPPLEMENTARY SUPPLY: CONTRIBUTIONS TO BUREAU OF HYGIENE AND TROPICAL DISEASES, AND W.H.O., ETC.

**ගරු වන්නිනායක**
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)

On behalf of the Hon. Minister of Health, I move,

"That a supplementary sum not exceeding Rupees Six million four hundred and eighty-three thousand nine hundred and sixty-five (Rs. 6,483,965) be payable out of the Consolidated Fund of Ceylon, or any other fund or moneys of, or at the disposal of, the Government of Ceylon or from the proceeds of any loans obtained by the Government of Ceylon, for the service of the financial year beginning on October 1, 1966, and ending on September 30, 1967, and that the said sum may be expended as specified in the Schedule hereto:

*Schedule*

| | Rs. |
|---|---|
| Head 80—Minister of Health. | |
| Vote No. 2—Administration Charges—Recurrent Expenditure .. .. | 95,233 |
| Head 81—Department of Health. | |
| Vote No. 4—Services provided by the Department—Recurrent Expenditure .. | 6,388,732 |
| | 6,483,965" |

The hon. Parliamentary Secretary will make the explanation.

**විමලා කන්නන්ගර මිය. (සෞඛ්‍ය ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**
(திருமதி விமலா கன்னங்கர—சுகாதார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)
(Mrs. Wimala Kannangara—Parliamentary Secretary to the Minister of Health)

A sum of Rs. 7,112 is required to pay the contributions to the Bureau of Hygiene and Tropical Diseases. London. Annual contributions to this Bureau have not been paid for 1962-63 and 1963-64. If these contributions are stopped it will have a serious effect in the intake of post—graduate students to London schools.

A sum of Rs. 75,000 is required to settle contribution to the W. H. O. in respect of the year 1967. A sum of Rs. 1,750 is required to be paid to the "WHO Voluntary Funds for Health Promotion". A sum of Rs. 4,780 is required to be paid to the W. H. O. for continuing the national Anti-Malaria Campaign work started in 1960. The W.. H. O. continues to reimburse the government of Ceylon for payment of salaries to the national staff of Anti-Malaria Campaign a sum of 25,000 dollars per annum in addition to which the W. H. O. grants fellowship for personnel engaged in anti-malaria work. Therefore, I think this contribution of Rs. 4,780 is a small sum.

A sum of Rs. 7,043 is required under sub-head 16 to be written off from the Health Department on Imprest Account due to the Treasury. This is a sum which has not been settled since 1957 and the request has been made to write off this old account.

Under sub-head 7, a sum of Rs. 1,500,000 is required for additional staff for filling up of the following posts: 172 medical officers, 20 dental surgeons, 5 matrons (higher grade), 10 assistant matrons (higher grade), 246 nurses, 80 pharmacists and 56 clerical staff.

Under sub-head 23, Milk and Sugar, a sum of Rs. 1,100,000 is required for milk supply to milk feeding centres. This is due to the increase of ten cents per pint by the Government on purchases of milk from the Milk Board.

Under sub-head 12, a sum of Rs. 1,225,000 is required for additional purchases of drugs made during the year 1964-65.

ප්‍රශ්නය සභාගිමුඛ කරන ලදි.
வினா எடுத்தியம்பப்பெற்றது.
*Question proposed.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 3.43

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
**(Mr. Ilangaratne)**

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සම්බන්ධව වචන සවලක්ෂයක් කථා කළ යුතුව තිබෙනව. මේ පරිපූරක මුදලින් කොටසක් ඉල්ලා තිබෙන්නේ ලන්ඩන්හි සවසථතාව හා ඝර්ම කලාපීය රෝග පිළිබඳ කාර්යාංශයට අවුරුදු 4 කට ගෙවන්ට තිබෙන මුදල ගෙවීමටයි. පාර්ලිමේන්තු ලේකම්තුමී මතක් කළා, 1962-63 වර්ෂයටත්, 1963-64 වර්ෂයටත්, 1964-65 වර්ෂයටත් 1965-66 වර්ෂයටත් කළ යුතු ගෙවීම් හරියාකාර කර නැති නිසා ඒවාත් දැන් ගෙවිය යුතුව තිබෙනවය කියා. ඒ විස්තර වල තියෙනව, එසේ නොගෙවීවෙ ඒ මුදල් ගෙවිය යුතුද, ඒ කාර්යාංශයෙන් අපට සේවයක් සිදු වෙනවාද කියා සොයා බැලීමට ප්‍රමාද වූ නිසාය කියා. ඒ සමගම 1965-66 වර්ෂයේදී ඒ මුදල් ගෙවන්නට තීරණය කළාය කියා දැන ගන්නට ලැබුනා. ඒ නිසා මේ මුදල නොගෙවන්නට පසුගිය රජය තීරණය කළේ මන්ද, මේ රජය මේ මුදල ගෙවන්නට තීරණය කළේ මොන කාරණයක් නිසාද, ඒ සඳහා කාලවා හෝ වාර්තාවක් සපයා ගත්තාද, ඒ වාර්තාව කුමක්ද යනාදී කරුණු මා දැන ගන්නට කැමතියි.

මේ විස්තරයේ සඳහන් කර තිබෙනව, කොළඹ නියෝජ්‍ය ආහාර පාලක නමින් 1957 වර්ෂයේදී රුපියල් 7,000 ක චෙක් පතක් යවා ඇතත් එම මුදල ඔහුගේ පොත්පත්හි ඇතුලත් වී නැති බව දන්වා තිබෙනවය කියා. මේ සම්බන්ධව විභාගයක් කළාද, චෙක් පත නැති වුනේ ඇයි, ඊට වග කිව යුත්තේ කවිද, විභාගයක් කළා නම් ප්‍රතිඵලය කුමක්ද යනාදි විස්තර දැන ගැනීමට කැමතියි.

පුත්තලමේ වෛද්‍ය නිලධාරි තැනට දුන් මුදලින් රුපියල් 43 ක් අඩු වී තිබෙන බව ඊළඟට සඳහන් කර තිබෙනව. එසේ අඩු වුනා නම් ඒ සම්බන්ධව විභාගයක් කළා ද, එසේ අඩු වීමට හේතුව කුමක්ද කියාත් ගරු පාර්ලිමේන්තු ලේකම්තුමී ගෙන් දැන ගන්නට කැමතියි.

ඊළඟට රුපියල් 11,000 ක් ඉල්ලනව, කිරිවලට සහ සීනිවලට වැඩි මුදලක් වියදම් කරන්න සිදු වී තිබෙනවය කියා. ආණ්ඩුව සීනිවලින් විශාල ලාභයක් ලබන බව අපි කවුරුත් දන්නව. ආණ්ඩුව සීනි රාත්තල ශත 17 ගණනේ අරගෙන ශත 68 ගණනේ විකුණා රාත්තලයකින් ශත 51 ක ලාභයක් ලබනව. ඒ ලාභය සාමාන්‍ය පාරිභෝගිකයට දෙන්න බැරි නම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවලටවත් සීනි ආදිය දෙන විට ඒ විධියට ලාභ ගන්නෙ නැතිව ගත්ත මුදලට දෙන්න බැරිද? ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවලට දෙන විටවත් ආහාර ඇමති අංශයෙන් එසේ සහනයක් ඇතිව දෙනව නම් සෞඛ්‍ය ඇමති අංශයේ තිබෙන වැය අඩු වෙනවාට කිසිම අනුමානයක් නැහැ.

ආහාර මිල වැඩි වී තිබෙනවය කියා රුපියල් 3,37,000 ක් මේ වැය ශීර්ෂයෙන් ඉල්ලා තිබෙනව. ආහාරවල මිල නිසා සෞඛ්‍ය අමාත්‍යාංශයට වැඩි බරක් උසුලන්නට සිදු වී තිබෙන බව ප්‍රකාශ කිරීම ගැන මම සතුටු වෙනව. ජීවන වියදම් බර සෞඛ්‍ය අමාත්‍යාංශයට පමණක් නොව සාමාන්‍ය ජනතාවටත් තිබෙනව. සමහර ආරෝග්‍යශාලාවල බත් වෙනුවට දෙන්නෙ පාන්. පාන් දෙන්නය කියා දොස්තර මහත්වරු නියම කරනව නම් පාන් දුන්නට වරදක් නැහැ. බත් තියෙනව නම් කෑවට කමක් නැත, බත් නැත්නම් පාන් කන්නටය කියා සමහර ලෙඩුන්ට කියනව. යම් ලෙඩකුට පාන් වලට වඩා බත් හොඳය කියා වෛද්‍යවරුන්ගේ නියම කරනවා නම් ඒ අයට කෙළින්ම බත් සපයන්නට ඕනෑ, නැත්නම් ඒ බව ඒ ලෙඩුන්ගේ නෑදෑයන්ට දන්වන්නට ඕනෑ. සමහරවිට ඒ නෑදෑයන්ට කිව්වම ඒ අය ඒ ලෙඩුන්ට බත් සපයනවා ඇති. සමහර ලෙඩ්ඩු බත් නැතිව පාන් කනව. මොකද බත් නැත්තෙ කියා ඇහුවම බත් නැති නිසා පාන් දෙන වය කියනව. ඒ බව සමහර ලෙඩුන්ගේ නෑදෑයන්ට දැන ගන්නට ලැබෙන්නෙ නැහැ. ඒ බව දැන ගන්නට ලැබුනොත් සමහරවිට ඒ අයට පුළුවන් බත් සපයන්න. ඒ කරුණු ගැනත් කල්පනා කරන ලෙස මම ඉල්ලනව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

හෙදියන් පත් කිරීම ගැන විශාල නරක රාවයක් රටේ තිබෙන බව ඊළඟට සඳහන් කරන්න කැමතියි. හේවාහැට ආසනයේ එක් කෙනෙක් මට පැමිණිල්ලක් කළා. හෙදියන් පත් කිරීමේදී සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් ඒ හෙදියන්ගෙන් ලිය මනක් ඉල්ලනව. මොකක්ද ඒ ලියමන? අපේක්ෂිකාව ඒ කොට්ඨාශයේ පදිංචි කාරියක් බවට ඩී. ආර්. ඕ. මහත්මයා සහතික කළ යුතුයි. සමහරවිට ඩී. ආර්. ඕ. මහත්මයා හමු වන්න ගියාම මේ ලියමන දෙන්නෙ නැහැ. අලවත්තේගම නමැති ඩී. ආර්. ඕ. කෙනෙක් හිටියා. දැන් ඉන්නෙ වෙන කෙනෙක්. ඒ කලින් සිටි ඩී. ආර්. ඕ. මහත්මයා ළඟට ගියාම කියනව, හොඳයි මම නැපැල් කරල අරින්නම් කියා. ඒ සහතිකය සමහර අයට දෙනව, සමහර අයට දෙන්නෙ නැහැ. සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටියත් සුදුසුකම් ඇති සමහර අපේක්ෂිකාවන්ට තැනක් ලැබෙන්නෙ නැහැ, ඩී. ආර්. ඕ. ගෙ ලියමන නැති නිසා. විශෙෂයෙන් මේ සිද්ධිය ගැන කල්පනා කර බලා, සුදුසුකම් ඇති හැමෝටම තැනක් ලැබෙන හැටියට කටයුතු කරන ලෙස මා ඉල්ලා සිටිනව. පළාතෙ මන්ත්‍රීවරයාට තමන්ගෙ පක්ෂපාතිත්වය පෙන්නීමේ අවස්ථාවක් හැටියට මේ සහතිකය දීම යොදා ගන්නට ප්‍රාදේශීය ආදායම් නිලධාරීන්ට ඉඩ තබන්නට එපා. දෙපාර්තමේන්තුවෙන් ඉල්ලන්නෙ අසුවලා ප්‍රදේශයේ පදිංචිකාරයෙක්ද නැද්ද යන්න සහතික කරන හැටියටයි. ඒ සහතිකය නැපැල් කරන්නට වුවමනා කරන්නෙ නැහැ. එයා පදිංචිකාරයෙක්ද නැද්ද කියා සහතිකය අතටම දෙන්නට පුළුවන්. මෙසේ අයථා ක්‍රියාවන් සිද්ධ වෙනව. ඒවා ගැන සොයා බලන හැටියට මා ඉල්ලා සිටිනව.

ඒ සමඟම තවත් කරුණක් සඳහන් කරන්නට කැමතියි. ගලහ ආරෝග්‍යශාලාව ඉදි කරන්නට පටන් අරන් දැන් අවුරුදු ගණනාවක් වෙනව. දැන් එය බාගෙට ගොඩ නඟා, එහි වැඩ අඩපණ වී තිබෙනව. විශේෂයෙන් ආණ්ඩු පක්ෂයෙ මන්ත්‍රීවරයෙක් නියෝජනය කරන ආසනයක පිහිටි ගලහ ආරෝග්‍ය ශාලාව ගැන ටිකක් උනන්දුවෙන් වැඩ කරන ලෙස මා ඉල්ලා සිටිනව.

අ. භා. 3.50

**විජයසුන්දර මයා.**
*(திரு. விஜேசுந்தர)*
(Mr. Wijesundara)

නියෝජ්‍ය කථානායකතුමනි, ඉදිරිපත් කර තිබෙන මේ පරිපූරක ඇස්තමේන්තුව ගැන මා වචන ස්වල්පයක් කථා කිරීමට බලාපොරොත්තු වෙනව. මේ පරිපූරක ඇස්තමේන්තුව සම්මත කර ගැනීමෙන් ප්‍රධාන වශයෙන් බලාපොරොත්තු වන්නෙ, වෛද්‍ය නිලධාරීන් 72 දෙනකු බදවා ගැනීමයි. සෞඛ්‍ය දෙපාර්තමේන්තුව තුළ වෛද්‍ය නිලධාරීන්ගෙ හිඟයක් නිබීම ඊට හේතුව වශයෙන් අපි කල්පනා කරනව. නමුත් දැනටමත් ඉන්න වෛද්‍ය නිලධාරීන්ගෙන් හරියාකාර සේවයක් ලබා ගැනීමේ අවස්ථාවකට අප පැමිණ සිටිනව. සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් පුවත් පත් මඟිනුත් වෙනත් නොයෙක් අංශවලිනුත් විශාල වශයෙන් විවේචන කෙරෙන බව අපට පෙනෙනව. ඒ නිසා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙ විශාල පරිවර්තනයක් කිරීමේ අවස්ථාවක් දැන් එළඹ තිබෙනව. ඊට මුල පිරීමක් වශයෙන් වෛද්‍ය නිලධාරීන්ගෙ ශිෂ්‍යත්ව සම්බන්ධයෙන් සෞඛ්‍ය ඇමතිතුමා යම්කිසි විධානයක් කර තිබීම ගැන අප සතුටු වෙනව. බොහෝ දුරට ශිෂ්‍යත්ව සීමා කර, දැනට ඉන්න වෛද්‍ය නිලධාරීන්ගෙන් හරියාකාර සේවයක් ලබා ගැනීම සඳහා කටයුතු කරන්නට බලාපොරොත්තු වෙනව.

ඒ සමඟම, ග්‍රාමීය ආරෝග්‍ය ශාලා ක්‍රමානුකූලව ගොඩනඟාගෙන යන බවත් අපට පෙනී ගොස් තිබෙනව. නමුත් ග්‍රාමීය ආරෝග්‍ය ශාලාවල ප්‍රතිපත්ති සකස් කර ගන යන විට, රජයට ලොකු භාරදූර කාර්යයකට මුහුණ පාන්නට සිදු වී තිබෙනව. ඒ මන්ද, මීට පෙර සිටි එක්තරා සෞඛ්‍ය ඇමතිවරයකුගෙ කාලෙදි ගමක් ගමක් පාසාම පාහේ ග්‍රාමීය ආරෝග්‍ය ශාලා ඇති කළා. නමුත් ඒ ග්‍රාමීය ආරෝග්‍ය ශාලාවලට අවශ්‍ය වෛද්‍ය නිලධාරීනුත්, ඇඳන් ආදි උපකරණත් ලැබුණෙ නැහැ. නමට පමණක් තිබුණු ඒ ග්‍රාමීය ආරෝග්‍ය ශාලාවලින් සේවයක් සැලසුණෙ නැහැ. ඒ නිසා එම ග්‍රාමීය ආරෝග්‍ය ශාලාවලටත්, ලංකාවෙ තිබෙන ප්‍රධාන පන්තියෙ සහ දෙවන පන්තියෙ ආරෝග්‍ය ශාලාවලටත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වෛද්‍ය නිලධාරීන් සැපයීම අත්‍යාවශ්‍ය බව මතක් කරන්නට කැමතියි. ප්‍රධාන පංතියෙ සහ දෙවන පංතියෙ ආරෝග්‍ය ශාලාවල අ.ති වෛද්‍ය නිලධාරි හිඟය මඟහැරීම සඳහා ඒ ඇබෑර්තු වහාම පිරවීම අත්‍යවශ්‍ය කටයුත්තක්.

ඒ සමඟම, දැනට ඉන්න වෛද්‍ය නිලධාරීන්ගෙනුත් මීට වඩා සේවයක් ලබා ගන්නට සිදු වී තිබෙනවා. මම සඳහන් කරන්නෙ, සියලුම වෛද්‍ය නිලධාරීන් ගැන පොදුවෙ නොවෙයි. සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙ ඉන්න වෛද්‍ය නිලධාරීන්ගෙන් අඩක් පමණම තමන්ගෙ රාජකාරියට අමතරව වෙනත් කටයුතුවල යෙදෙන බව අපට පෙනෙනවා. අමතර ආදායම් මාර්ගයක් වශයෙන් මැණික් ගැරීම කරන වෛද්‍ය නිලධාරීන් ඉන්න බව මම දන්නවා. ඒ වගේම, තමන්ගෙ වතු-පිටි ඉඩකඩම් වෙනුවෙන් රාජකාරි කාලය මිඩංගු කරන වෛද්‍ය නිලධාරීනුත් ඉන්නවා. ඒ වගේම, සමුපකාර කඩවල පාලනය භාරව ඉන්න, තමන්ගෙම "බිස්නස්" කරන, අයත් ඉන්නවා. වෙන එකක් නබා අධිකරණ අමාත්‍යාංශය යටතේ තිබෙන සාමදාන මණ්ඩලවල සේවය සඳහා සම්පූර්ණ කාලය මිඩංගු කරන වෛද්‍ය නිලධාරීනුත් ඉන්නවා. එවැනි අනවශ්‍ය වැඩ බදාගන ඉන්න අය විශ්‍රාම ගැන්වීමටත් නියම විධියට—දවසෙ පැය 24 ම තමන්ගෙ වෘත්තිය සඳහා යොදවා ඇප කැප වී—සේවය කරන්නට සූදානම් උදවියගෙන්, සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙ දැනට තිබෙන ඇබෑර්තු පුරවා ගත්තොත් මීට වඩා විශාල සේවයක් මහජනතාවට ලබා ගන්නට පුළුවන්.

මැලේරියාව ගැනත් සඳහන් වුණා. 1935 වගෙ නැවතත් මේ රටේ මැලේරියා වසංගතයක් ඇති වීමේ ලකුණු පහළ වී ගන එනවා. ඒ නිසා විශේෂයෙන් මැලේරියාවෙන් ප්‍රවේශම් වී වැඩ කරන්නට වුවමනා අවස්ථාවක් මේ රටේ එළඹ තිබෙනවා. ඒ කාලෙ—1935—තිබුණ. "මැලේරියාවට තප්පු ගහනවා" කියල එකක්. මැලේරියා මර්ධන ව්‍යාපාරයට මිනිසුන් උනන්දු කරවන්න, මැලේරියාවෙන් ප්‍රවේශම් කරවන්න නොයෙක් විධියෙ සංදර්ශන, නැටුම්, තප්පු ගැහීම් හා නොයෙකුත් විකාර උත්සව පැවැත්වුණ. "මැලේරියාවට තප්පු ගහනවා" කියන්නෙ, ඒ වාටයි. නමුත් ඒ වායින් ඒ තරම් ප්‍රයෝජනයක් නැහැ. මැලේරියාවට පිළියම් වශයෙන් තිබෙන නවීන වෛද්‍ය ප්‍රතිකාර ලබා දී මැලේරියාව මේ රටින් තුරන් කිරීමට උත්සාහ කරන්නට ඕනෑ. ඒ සම්බන්ධයෙන් සංදර්ශන පැවැත්වීමෙන් එතරම් වැඩක් නැහැ.

ඩබ්ලිව්. එච්. ඕ. ක්‍රමය යටතෙ උත්පත්ති පාලනය සම්බන්ධයෙන් වැඩ පිළිවෙළක් ඇති කර තිබෙනවා. මේ ප්‍රශ්නය පිළිබඳව නොයෙක් විධියේ ප්‍රභේද අදහස් රටේ තිබෙනවා. සමහරු පක්ෂයි; සමහරු විරුද්ධයි. කෙසේ වෙතත් මේ සඳහා යොදවා සිටින වෛද්‍ය නිලධාරීන්ගෙන් බොහෝ දෙනෙක් මේ කටයුතු පිළිබඳව හරියාකාර දැනුමක් ඇති උදවිය නොවන බව පෙනී යනවා. මහජනයාට මේ කාරණා හරියාකාරව තේරුම් කර දෙන්ට, විශේෂයෙන් මව් පක්ෂයට මේ කාරණා තේරුම් කර දෙන්ට පුළුවන් අය බොහෝ ස්ථානවල යොදල නැහැ. ඒ නිසා ඒ කාරණය ගැනත් පාර්ලිමේන්තු ලේකම්තුමියගේ අවධානය යොමු කරවනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පුළුවන් තරම් දුරට ග්‍රාමීය ආරෝග්‍යශාලා පිහිටුවනවත් සමඟම ලංකාවේ ඉතා සාර්ථක වී තිබෙන පයිරින්ත වෛද්‍ය ආයතන පිහිටුවීමත් දිගටම කරගෙන යා යුතුව තිබෙනවා. "Peripheral Medical Units" හෙවත් පයිරින්ත වෛද්‍ය ආයතන පිහිටුවීම සම්බන්ධයෙනුත් තව දුරටත් කල්පනා කර බලන ලෙස මා ඉල්ලා සිටින්න කැමතියි. දැන් දිනපතා ප්‍රවෘත්ති පත්‍ර මගින් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ කටයුතු තද බල ලෙස විවේචනය වේගෙන යනවා. හඩිසන් සිල්වා දොස්තර මහත්මයාගේ වැඩ නැවැත්වීමෙන් පසුව පත්‍ර මාර්ගයෙන් විශාල ආන්දෝලනයක් මේ රටේ ඇති කර තිබෙනවා. මේ යොමුවෙලා තිබෙන විවේචන පුළුවන් තරම් දුරට සන්සුන් කරල සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් අංග සම්පූර්ණ සේවයක් මහජනයාට ලබාදීමට උත්සාහ කරන ලෙස ඉල්ලමින්, ඒ බව පාර්ලිමේන්තු ලේකම්තුමියට මතක් කරමින් මෙම වැය ශීර්ෂය යටතේ මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 3.55

**පර්සි වික්‍රමසිංහ මයා.**

*(திரு. பேர்சி விக்ரமசிங்ஹ)*

(Mr. Percy Wickremasinghe)

මේ වැය ශීර්ෂය යටතේ වැඩිපුර වෛද්‍ය නිලධාරීන් පත් කර ගැනීමට මුදල් ඉල්ලා තිබෙනවා. මේ අවස්ථාවේදී වැඩිපුර වෛද්‍ය නිලධාරීන් පත් කර ගැනීමට පමණක් නොව ඉදිරියට වෛද්‍ය විද්‍යාලයෙන් පිට වන සෑම වෛද්‍යවරයකුගේම සේවය ඔවුන් කැමති නම් රජයට ලබා ගැනීමේත් වැඩ පිළිවෙළක් යොදන්න ඕනෑ. පසුගිය සතියේ ප්‍රසිද්ධ පත්‍රවල පළවී තිබුණා, ලබන වර්ෂයේ සිට වෛද්‍ය විද්‍යාලයෙන් පිටවන වෛද්‍යවරුන් රජයේ සේවයට බඳවා ගන්නෙ අවුරුදු 2 ක කාලයකට පමණක් බව. මේක ඇත්තක්ද, නැද්ද? මේ විධියේ ප්‍රතිපත්තියක් අනුගමනය කරන්ට රජය යම්කිසි වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවාද කියා අපි දැන ගන්ට කැමතියි.

